කාර්යසාධන වාර්තාව 2022

செயலாற்றுகை அறிக்கை 2022

PERFORMANCE REPORT 2022

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

පටුන

පිටු අංකය

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1
1.1 මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය 1
1.2 මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර 1
1.2.1 අරමුණු හා පරමාර්ථ 1
1.3 කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය 2
1.4 සංවිධාන සටහන හා කාර්යාල පිරිසැකැස්ම 2

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 3
2.1 මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් 3
2.2 ඡන්දහිමියන් ලියාපදිංචිය 3
2.2.1 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය 2021 4
2.2.1.1 2021 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන් 4
2.2.2 2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත.... 5
2.2.3 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2022 6
2.2.3.1 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම 6
2.2.3.2 පදිංචිය වෙනස් වීම හේතුකොටගෙන නව ලියාපදිංචිය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය 7
2.2.3.3 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් 2022 වර්ෂයේ දී ලියාපදිංචි විය යුතු ආකාරය 7
2.2.3.4 2022.02.01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම 7
2.2.3.5 ඡන්දහිමි නාමලේඛනයෙන් ඉවත්වන නම් (“අ”) හා ඇතුළත් වන නම් (“ආ”) ලැයිස්තු ප්‍රදර්ශනය: හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම 8
2.2.3.6 2021 වර්ෂයේ නාමලේඛනය (හෝ කොටසක්) සහ “අ” ලැයිස්තු හා “ආ” ලැයිස්තු ප්‍රදර්ශනය කරන ලද ස්ථාන 9
2.2.3.7 හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම පිළිබඳව ක්‍රියා කිරීම 10
2.2.3.8 2022 ඡන්දහිමි නාමලේඛනයට අදාළ සංඛ්‍යා සටහන්..... 11
2.2.3.9 තුලනාත්මක සංඛ්‍යා සටහන් 11
2.2.4 2022 වර්ෂයේ අතිරේක පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම 12
2.2.5 2022 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම..... 14
2.2.6 2022 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම..... 15
2.2.7 2022 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම..... 16
2.2.8 2023 (1), 2023(2) සහ 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම 17
2.2.9 ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම. 17
2.2.10 ඡන්දහිමි නාමලේඛනයට දුරකථන සහායක සේවාව ක්‍රියාත්මක කිරීම..... 18
2.2.11 ප්‍රතිශෝධනය පිළිබඳව කෙටි පණිවිඩ (SMS) මඟින් ජනතාව දැනුම්වත් කිරීම. 18
2.2.12 පුවත්පත් දැන්වීම් පළ කිරීම..... 20
2.2.13 ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම..... 24
2.3 පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම 25
2.4 පළාත් සභා ඡන්ද විමසීම 25
2.5 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 25
2.5.1 2018 වර්ෂයේ පැවැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 25
2.5.2 පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු පිරවීම 26

2.5.3 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා සූදානම් වීම 26
2.5.4 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද ගැසට් නිවේදන 27
2.5.5 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ 27
2.5.6 මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලය වෙත ලබාදී ඇති ලිපි ලේඛණ, ආකෘති පත්‍ර, ලිපි කවර, කාර්ය පටිපාටි සඳහා උපදෙස් පොත් සහ අනෙකුත් ලේඛන.... 27
2.5.7 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කර ඇති මාධ්‍ය නිවේදන, උපදෙස්, ලිපි සහ පවත්වා ඇති සාකච්ඡා..... 27
2.6 විශේෂ ව්‍යාපෘති 28
2.6.1 ඡන්ද හිමියන්ගේ දින සැමරුම 28
2.6.2 අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දින සැමරුම 28
2.6.3 ආබාධ සහිත පුරවැසියන් 29
2.6.3.1 අන්තර්කරණ මැතිවරණ ක්‍රියාවලිය වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මයිරයිට් නියෝජිතයින් දැනුම්වත් කිරීම..... 29
2.6.3.2 ඡන්ද හිමියන්ගේ ලියාපදිංචිය පිළිබඳ දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් දැනුම්වත් කිරීම..... 29
2.6.3.3 මැතිවරණ රාජකාරී නියුතු නිලධාරීන් සඳහා සංඥා භාෂාව පිළිබඳ මූලික පුහුණුව ලබාදීම..... 29
2.6.3.4 ඡන්ද හිමියන්ගේ දිනය සැමරීමේ ජාතික උත්සවය සඳහා සහභාගී වීම 29
2.6.3.5 ආබාධ සහිත ඡන්ද දායකයින් ඡන්දය සළකුණු කිරීමේ දී මුහුණපාන ගැටලු සඳහා කෙටි කාලීන විසඳුම් යෝජනාවලිය සකස් කිරීම..... 29
2.6.3.6 ආබාධ සහිත තැනැත්තන් මුහුණපාන ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් පිළිබඳ සාකච්ඡා කිරීම..... 30
2.6.3.7 ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු හඳුනාගැනීම..... 30
2.6.3.8 දිස්ත්‍රික් මැතිවරණ සහකාර කොමසාරිස්වරුන් සහ නව කාර්යය මණ්ඩලය ආබාධ සහිත තැනැත්තන් පිලිබඳ සංවේදී කිරීම..... 30
2.6.3.9 ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියට දායක කරගැනීමේ දී මුහුණපාන ගැටලු විසදාගැනීම සඳහා දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ දායකත්වය ලබා ගැනීම..... 30
2.6.3.10 ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ නියෝජිතයින්ගේ යෝජනා සාකච්ඡා කිරීම..... 30
2.6.3.11 ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගල ප්‍රජාව මැතිවරණ ක්‍රියාවලියේ සක්‍රීය පාර්ශවකරුවන් කර ගැනීම උදෙසා අපයුක්ත අනන්‍යතාව තහවුරු කිරීම හා සබැඳි අභියෝග පිළිබඳ ව විමසීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම. 31
2.6.3.12 ඡන්ද පත්‍රිකාව මහපෙන්වන ස්ටෙන්සිල් රාමුව වැඩිදියුණු කිරීම සඳහා දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීම සහ ප්‍රජාතන්ත්‍රවාදය හා සර්වජන ඡන්ද බලය පිළිබඳ දැනුම්වත් කිරීම.. 31
2.6.3.13 මැතිවරණ ක්‍රියාවලිය තුළ ආබාධ සහිත තැනැත්තන්ට හිතකර මාධ්‍ය භාවිතාවක් සඳහා ජනමාධ්‍යවේදීන් සංවේදී කිරීම..... 31
2.6.3.14 බුද්ධි වර්ධන ඌනතා සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම..... 31
2.6.3.15 2022 - 2025 උපායමාර්ග සැලැස්ම ක්‍රියාත්මක කර ගැනීම පිළිබඳව පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීම..... 32
2.6.3.16 ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය අන්තර්කරණය පිළිබඳ සංවාදය, මැතිවරණ අන්තර්කරණය සබැඳි කෘතිය ජනගත කිරීම සහ වාර්තා විඩියෝපටය එළිදැක්වීම..... 32
2.6.4 වැඩසටහන් සම්බන්ධීකරණය 32
2.6.5 වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 32

2.6.6 ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවට ඇති වගකීම 32
2.6.7 ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය වෙනුවෙන් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් 32
2.6.8 වසංගත තත්ත්වය නිසා මුහුණු පෑ අභියෝග 33
2.6.9 කාන්තා, තරුණ, සමාජ මාධ්‍ය හා අන්තර්ජාතික දින සැමරුම් වැඩසටහන් 33

2.7 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 34

2.8 උපායමාර්ගික සැලැස්ම 34

2.9 මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු 34

2.10 ලේඛනාගාරය 35

2.11 දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුගාරය 35

2.12 2022 වසර තුළ එළි දක්වන ලද ප්‍රකාශන 36

2.13 නීති කටයුතු 38
2.13.1 ශ්‍රේෂ්ඨාධිකරණය 38
2.13.2 අභියාචනාධිකරණය 38
2.13.3 මහාධිකරණය 38
2.13.4 දිසා අධිකරණය 39
2.13.5 නීතිපති උපදෙස් විමසීම් 39
2.13.6 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන සහ බී.සී පත්‍රිකා අපහරණය 39
2.14 මැතිවරණ නීති සංශෝධන 40
2.14.1 මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ යෝජනා 40
2.15 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු 40
2.16 දේශපාලන පක්ෂ 40
2.16.1 දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම හා ඉල්ලුම්පත් කැඳවීම 40
2.16.2 දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ පවත්වන ලද සාකච්ඡා 41

2.17 මැතිවරණ ආරවුල් නිරාකරණය 42
2.18 වාහන පාලනය 42
2.18.1 මැතිවරණ කොමිෂන් සභාවේ වාහන පිළිබඳ තොරතුරු 42
2.19 ඉදිකිරීම් හා වත්කම් 43
2.19.1 ඉදිකිරීම් හා අළුත්වැඩියා 43

2.20 ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම /අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම 44
2.20.1 ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම 44
2.20.2 ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය 44
2.20.3 යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම 44
2.20.4 කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම 45
2.20.5 පොදු 45

2.21 තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය 46
2.21.1 මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම 46
2.21.2 මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශවකරුවන්හට ඊ සේවා සැපයීම 47
2.21.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු 48
2.22 මූල්‍ය හා විගණන තොරතුරු 48

2.23 අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු 49

2.24 ඉදිරි ඉලක්ක 50

03. **පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය** 51

3.1 මූල්‍ය කාර්යසාධනය 51

3.2 මූල්‍ය ප්‍රකාශ සටහන් 54
3.2.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 55
3.2.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 55
3.2.3 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 55
3.2.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 55
3.2.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව 56

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 66

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 67
5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න 68

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 69

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 69

6.2 මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු 69
6.2.1 නව පත් කිරීම් 70
6.2.2 නිදහස් කිරීම් 71
6.2.3 අභ්‍යන්තර ස්ථාන මාරුවීම් 71
6.2.4 වැඩ බැලීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම් 71

6.3 පාලන අංශයේ කටයුතු 72
6.3.1 කාර්ය මණ්ඩල කටයුතු 73
6.3.1.1 කළමනාකරණ සේවා නිලධාරි සේවය 73
6.3.1.2 සංවර්ධන නිලධාරි සේවය 73
6.3.1.3 රියදුරු සේවය 73
6.3.1.4 කාර්යාල සේවක සේවය 73
6.3.1.5 කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීම 73
6.3.1.6 රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීම 74
6.3.1.7 වැඩ තහනම් කිරීම 74
6.3.1.8 කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම 74
6.3.1.9 පුරප්පාඩු තනතුරුවල රාජකාරි කටයුතු ආවරණය කිරීම 74
6.3.1.10 විශ්‍රාම ගැන්වීම් 74

6.4 පවිත්‍රතා කටයුතු 74

6.5 ආරක්ෂක කටයුතු 75

6.6 විදේශ පුහුණු සහ ශිෂ්‍යත්ව 75

6.7 දේශීය පුහුණු 75

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 77

08 පරිච්ඡේදය - සමාප්තිය 83

සටහන්

පිටු අංකය

සටහන 01 - සංවිධාන සටහන 87

සටහන් 02 - 2021 ඡන්දහිමි නාමලේඛනයේ එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 88

සටහන් 03 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම (2021)..... 89

සටහන 04 - ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ ඉඩදුන් හිමිකම් හා විරෝධතා සංඛ්‍යාව (2021)..... 90

සටහන 05 - එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචිය අනාවරණය වීම මත එක් ලිපිනයකින් ඉවත් කරන ලද නම් සංඛ්‍යාව (2021) 91

සටහන 06 - ජාතික හැඳුනුම්පත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පුද්ගලයන් සංඛ්‍යාව (2021) 92

සටහන 07 - 2020 - 2021 වර්ෂවල ඡන්දහිමියන් ලියාපදිංචිය සැසඳීම 93

සටහන 08 - එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර (2021) 94

සටහන 09 - එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ප්‍රවර්තන නාමලේඛනයෙහි (2021) ඉවත් කිරීමට නියමිත (“අ” ලැයිස්තුගත නම්) සහ 2022 ඇතුළත් කිරීමට නියමිත (“ආ” ලැයිස්තුගත නම්) සංඛ්‍යාව..... 95

සටහන 10 - 2022 ඡන්දහිමි නාමලේඛනයේ එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 96

සටහන 11 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම (2022)..... 97

සටහන 12 - ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ ඉඩදුන් හිමිකම් හා විරෝධතා (2022)..... 98

සටහන 13 - එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචිය අනාවරණය වීම මත එක් ලිපිනයකින් ඉවත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාව (2022)..... 99

සටහන 14 - ජාතික හැඳුනුම්පත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පුද්ගලයන් සංඛ්‍යාව (2022)..... 100

සටහන 15 - 2021 - 2022 ඡන්දහිමියන් ලියාපදිංචිය සැසඳීම 101

සටහන 16 - එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර (2022) 102

සටහන 17 - ඡන්ද ප්‍රදේශ අනුව ලියපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳව තුලනාත්මක සටහන (2013 – 2022)..... 103

සටහන 18 - ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කල පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳ සංසන්දනය (2013-2022).... 110

සටහන 19 - එක් එක් වර්ෂයේ ලියාපදිංචි ඡන්දභිමියන් සහ පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම හා වැඩිවීමේ ප්‍රතිශතය සංසන්දනය (2010 – 2022)..... 111

සටහන 20 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරාපත් කරගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන (2013- 2022)..... 112

සටහන 21 - 2022.08.31 දින අතිරේක පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු මැතිවරණ කොට්ඨාස/ දිස්ත්‍රික් අනුව එම නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව..... 113

සටහන 22 - 2022.08.31 දින අතිරේක පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු වලංගු ඡන්ද සංඛ්‍යාව සහ තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව 114

සටහන 23 - 2022.11.08 දින අතිරේක පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව පරිපූරක ලැයිස්තු ගත සංඛ්‍යාව, ලැබුණු හා ඉඩදුන් හිමිකම් සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 115

සටහන 24 - 2022.11.08 දින අතිරේක පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු වලංගු ඡන්ද සංඛ්‍යාව සහ තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව ගණනය කිරීම..... 116

සටහන 25 - 2022.11.15 දින පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව පරිපූරක ලැයිස්තු ගත සංඛ්‍යාව, ලැබුණු හා ඉඩදුන් හිමිකම් සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 117

සටහන 26 - 2022.11.15 දින පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු වලංගු ඡන්ද සංඛ්‍යාව සහ තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව ගණනය කිරීම... 118

සටහන් 27 - පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීම පිළිබඳ තොරතුරු 119

සටහන 28 - 2023 පළාත් පාලන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ පිළිබඳ තොරතුරු 152

සටහන 29 - මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලය වෙත ලබාදී ඇති ලිපි ලේඛණ, ආකෘති පත්‍ර, ලිපි කවර, ජර්නල්, උපදෙස් පොත් සහ අනෙකුත් ලේඛන 154

සටහන 30 - මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ යෝජනා 156

සටහන 31 - මැතිවරණ ආරවුල් නිරාකරණය පිළිබඳ පවත්වන ලද වැඩමුළු පිළිබඳ තොරතුරු 159

සටහන 32 - විශ්‍රාම ගත් නිලධාරීන් හා සේවක මහතුන් පිළිබඳ විස්තරාත්මක වාර්තාව. 160

සටහන 33 - දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය 162

ඇමුණුම්

ඇමුණුම 01 - 2021 වර්ෂයේ ලියාපදිංචි ඡන්දභිමියන් සංඛ්‍යාව පදනම් කර ගෙන එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරාපත් කරගනු ලැබිය යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව පිළිබඳ ගැසට් නිවේදනය 167

ඇමුණුම 02 - 2022 වර්ෂය සඳහා පිළිගත් සියලුම දේශපාලන පක්ෂ ලැයිස්තුව පිළිබඳ ගැසට් නිවේදනය..... 169

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය

විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (1) ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ යටතේ ශ්‍රී ලංකාවේ දෙවන මැතිවරණ කොමිෂන් සභාව සඳහා 2020.12.03 දිනැති ලිපිය මගින් පහත නම් සඳහන් සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් පත් කරන ලදී.මේ අනුව කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව පහකි. රැස්වීම්වල ගණ පූර්ණය සාමාජිකයින් තිදෙනෙකි. කොමිෂන් සභා සාමාජිකයන් 2020.12.10 වන දින රාජකාරී භාර ගැනීමෙන් දෙවන මැතිවරණ කොමිෂන් සභාවේ නිල කාලය ආරම්භ කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ, 2022.12.31 දිනට සංයුතිය පහත පරිදි වේ.

- නිමල් ජී.පුංචිහේවා මහතා (සභාපති)
- එස්.බී.දිවාරත්න මහතා (සාමාජික)
- එම්.එම්.මොහමඩ් මහතා (සාමාජික)
- කේ.පී.පී.පතිරණ මහතා (සාමාජික)
- පී.එස්.එම්.චාල්ස් මහත්මිය (සාමාජික) (2021.10.28 දින සිට)

(2020.12.10 දින සිට 2021.10.10 දින දක්වා මැතිවරණ කොමිෂන් සභා සාමාජික වශයෙන් කටයුතු කරන ලද ජීවන් ත්‍යාගරාජා මහතා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා වශයෙන් 2021.10.11 වන දින දිවුරුම්දීම් වස් 2021.10.10 දින සිට කොමිෂන් සභා සාමාජික ධුරයෙන් ඉල්ලා අස්විය. මේ අනුව ඇති වූ සාමාජික පුරප්පාඩුව සඳහා 2021.10.28 දිනැති ලිපිය මගින් අතිගරු ජනාධිපතිවරයා විසින් පී.එස්.එම්.චාල්ස් මහත්මිය මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික වශයෙන් පත් කරන ලදී.)

1.2. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර

"සර්වජන ඡන්ද බලය සුරකින ප්‍රජාතාන්ත්‍රික දේශයක්" යන්න මැතිවරණ කොමිෂන් සභාවේ දැක්මයි.

එකී දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා "ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියලු පාර්ශව දැනුම්වත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව හා සඵලදායිත්වයෙන් යුතුව මෙහෙය වීම." මැතිවරණ කොමිෂන් සභාවේ මෙහෙවර වේ.

1.2.1. අරමුණු හා පරමාර්ථ

- සුදුසුකම් ඇති සියලුම පුරවැසියන්ට නිදහස් හා සාධාරණ ලෙස පවත්වනු ලබන්නා වූ ඡන්ද විමසීම්වලදී නොබියව, නිදහසේ, විශ්වාසයක් ඇතිව සිය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සැලසීම.
- ඡන්දය පාවිච්චි කිරීම තමන් වෙත ඇති අන්සතු කළ නොහැකි අයිතියක් බවත් තමන් මැතිවරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගී වන බවත් අවබෝධ කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී සියලු ඡන්ද අපේක්ෂකයන්ට සම හා සාධාරණ අවස්ථාවන් ලැබෙන පරිදි ක්‍රියා කිරීමට පියවර ගැනීම.
- සියලුම ඡන්ද විමසීම්වලට පූර්වයෙහි සුදුසුකම් ලත් සියලු පුරවැසියන් ඇතුළත් වූ යථාවත් කරන ලද ඡන්දහිමි නාම ලේඛනයක් සකස් කිරීම.
- සාමාජික වශයෙන් ආන්තික ලෙස ජීවත්වන සියලු පුරවැසියන් විශ්වාසවන්ත ලෙස හා ප්‍රමාණවත් ලෙස ඡන්ද විමසීම් ක්‍රියාවලියට සහභාගී කරවීමට අවශ්‍ය පියවර ගැනීම.

- මැතිවරණ ක්‍රියාවලිය දක්ෂ ලෙස හා පාරදෘශ්‍ය ලෙස පරිපාලනය කිරීම.
- ඡන්ද විමසීම් ක්‍රියාවලියට හා මැතිවරණ කොමිෂන් සභාවට අදාළ දත්ත හා තොරතුරු පාර්ශ්වකරුවන්ට ලබා ගැනීමේ පහසුකම කාලානුරූපව හා ප්‍රමාණවත් ලෙස සලසනු ලැබීම.

1.3. කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103(2) ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු බව දක්වා ඇත. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් තෝරා පත්කර ගැනීම, පළාත් සභා මන්ත්‍රීවරයෙක් තෝරා පත් කර ගැනීම පළාත් පාලන ආයතනවල සභිකයන් තෝරා පත් කර ගැනීම සහ ජනමත විචාරණ පැවැත්වීම සම්බන්ධයෙන් තක්කාලයේ බලපවත්වන නීතියක් මගින්,

(අ) කොමිෂන් සභාව හෝ

(ආ) ‘‘මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ සියලු බලතල, කාර්යය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේද ඉටු කරනු ලැබිය යුත්තේද, වන්නේය." යනුවෙන් කොමිෂන් සභාවට අවශ්‍ය බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පවරා දී ඇත.

එමෙන්ම, ඉහත දක්වන ලද ඡන්ද විමසීම හා ජනමත විචාරණ සඳහා ඡන්ද හිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධනය කිරීම ද, එම ඡන්ද විමසීම් පැවැත්වීම ද එකී බලතලවලට, එකී කාර්ය වලට ඇතුළත් වන නමුත් ඒවාටම පමණක් සීමා නොවන්නේය. යනුවෙන් මැතිවරණ ක්‍රියාවලිය හා බැඳුනු කොමිෂන් සභාව සතු බලතල වල අසීමිත බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇත. එසේම,104 ආ 1 සිට 104 (ආ(5) දක්වා ව්‍යවස්ථා මගින් කොමිෂන් සභාව ක්‍රියා කළ යුතු ආකාරය ද 104(ඇ) සහ104 (ඈ) මගින් බලතල ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය ආරක්ෂාව ආදී පහසුකම් යොදා ගැනීමට අවශ්‍ය සියලු දේ සලසා ඇත.

1.4. සංවිධාන සටහන හා කාර්යාල පිරිසැකැස්ම

මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා, මැතිවරණ මහලේකම් කාර්යාලයේ එක් එක් අංශ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ඇතුළත් සංවිධාන සටහන 01 ලෙස ඇතුළත් කර ඇත.

ඉහත සංවිධාන සටහන අනුව මැතිවරණ කොමිෂන් සභාවට අයත් මැතිවරණ මහලේකම් කාර්යාලයේ, ජාතික මැතිවරණ, පළාත් පාලන ඡන්ද විමසීම්, ගිණුම්, පාලන, නීති විමර්ශන සහ ක්‍රමසම්පාදන, අභ්‍යන්තර විගණන වශයෙන් අංශ සහ ආයතන, ප්‍රවාහන, ප්‍රසම්පාදන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලෙස ශාඛා ස්ථාපිත අතර සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ද එකිනෙක සම්බන්ධවන ආකාරය දක්වා, ඒ ඒ ඒකකය ඇතුළත්වන ආකාරයට කාර්යාල පිරිසැකැස්ම සකස්කර ඇත.

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්

සාමාන්‍යයෙන්, මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් සේවා අවශ්‍යතාව ද සැළකිල්ලට ගෙන සතියකට වරක් බැගින් පැවැත්වේ. මේ අනුව 2022 වර්ෂය තුළ කොමිෂන් සභා රැස්වීම් 30 ක් පමණ පවත්වන ලද අතර, කෝවිඩ් 19 වසංගත තත්ත්වය මුළුමනින්ම අවසන් නොවීම තුළ යම් බාධාකාරී තත්ත්වයක් පැවතියද ඉටු කළ යුතු ව්‍යවස්ථාපිත මෙන්ම සාමාන්‍ය රාජකාරී කටයුතු අතපසු කිරීමකින් තොරව පවත්වා ගැනීමට හැකිවීම සතුටට කරුණකි. කොමිෂන් සභාවේ පාලන අංශය, ජාතික මැතිවරණ අංශය, පළාත් පාලන ඡන්ද විමසීම් අංශය, නීති විමර්ශන හා සැලසුම් අංශය, ගිණුම් අංශය හා එම අංශ යටතේ ඇති විවිධ අනු අංශ මගින් ඉදිරිපත් කරනු ලබන කොමිෂන් පත්‍රිකා ආශ්‍රිතව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, ව්‍යවස්ථාපිත හා සාමාන්‍ය පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම පිණිස අවශ්‍ය මහ පෙන්වීම් උපදෙස් හා නියමයන් නිකුත් කිරීම මෙම රැස්වීම්වලදී සිදු කරනු ලැබේ.

2.2. ඡන්දහිමියන් ලියාපදිංචිය

සුදුසුකම් සැපිරූ සියලු පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, වර්ගය, කුලය, අධ්‍යාපනය, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආදී කිසිදු විශේෂත්වයකින් තොරව රටෙහි පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මඟිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්දබලය සහතික කර ඇත. ‘‘පරමාධිපත්‍ය ජනතාව සතු බවත් එය අන්සතු කළ නොහැකි බවත්, පැවරිය නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත්’ එහි සඳහන් වේ.

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකිය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්යය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ හා 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ දැක්වෙන විධිවිධාන අනුව වේ.

ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම් පහත පරිදි වේ.

- ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන පෙබරවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. (ඒ අනුව 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව ඇත්තේ 2004.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ටය.)
- ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සාමාන්‍ය පදිංචිය තිබීම.

ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම් පහත පරිදි වේ.

- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය මඟින් තීරණය වී තිබීම.
- අවුරුදු 02 ක සිරගත වීමට නියම වන වරදකට අධිකරණය මඟින් වරදකරුවකු වී මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් සිරගත වී සිටීම හෝ සිරගත වීම සහ ඉන්පසු අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- අල්ලස් චෝදනාවකට වරදකරු වී අවුරුදු 07 ක කාලයක් ගත වී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවකු කර තිබීම.
- මහජන ආයතන දූෂණ වැලැක්වීමේ ආඥා පනත යටතේ වරදකරුවකු වී තිබීම.
- ඉහත සඳහන් නුසුදුසුකම් ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව යටතේ සඳහන් ඡන්ද බලය අහිමිවීමේ නුසුදුසුකම් වලට යටත් නොවූ තැනැත්තෙක් විය යුතු ය.

2.2.1. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2021

2021 ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් අවසන් කර 2022.01.07 දින දිවයිනේ සියළු මැතිවරණ කොට්ඨාසවල, ලියාපදිංචි කිරීමේ/ සහකාර ලියාපදිංචි කිරීමේ නිළධාරින් විසින් සහතික කරන ලදී. ඒ පිළිබඳව 2022.01.07 දිනැති අංක 2261/71 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කිරීමටත් කටයුතු කළ අතර මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියළුම ග්‍රාම නිලධාරි කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදී.

2021 වර්ෂයේ මුළු ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව 16,575,646 කි.

වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය සකස් කර සහතික කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වන ව්‍යවස්ථාවේ (8) වන ව්‍යවස්ථාව යටතේ වූ නියමය පරිදි ක්‍රියා කිරීම සඳහා 2021 ඡන්දහිමි නාමලේඛනයේ ඒ ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව පදනම් කර ගෙන එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරාපත් කරගනු ලැබිය යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව 2022.02.10 දිනැති අංක 2266/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම තොරතුරු ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

2.2.1.1 2021 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන්

- එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 02)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව ගණනය කිරීම - 2021 (සටහන 03)
- ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ ඉඩදුන් හිමිකම් හා විරෝධතා (සටහන 04)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචිය අනාවරණය වීම මත එක් ලිපිනයකින් ඉවත් කළ නම් සංඛ්‍යාව (සටහන 05)
- ජාතික හැඳුනුම්පත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පුද්ගලයන් සංඛ්‍යාව (සටහන 06)
- 2020 - 2021 ඡන්දහිමියන් ලියාපදිංචිය සැසඳීම (සටහන 07)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර (සටහන 08)

2.2.2. 2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත.

මෙම සංශෝධන පනතේ ප්‍රධාන අරමුණ වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්දහිමි නාමලේඛන මඟින් ඡන්ද බලය ලබාදීම සහ ඡන්දහිමියන් ගණුන් ගන්නා සුදුසුකම් ලැබීමේ දිනය පෙබරවාරි මස පළමුවන දින ලෙස සංශෝධනය කිරීම විය.

- **1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට (ප්‍රධාන ප්‍රඥප්තිය) සිදු කළ මූලික සංශෝධන සහ ඊට අදාල සුවිශේෂී කරුණු.**

  - මෙම සංශෝධන පනත 2021 ඔක්තොම්බර් මස 13 දින සහතික කරන ලදී.
  - 2021 ඔක්තෝම්බර් 15 වන දින රජයේ ගැසට් පත්‍රයේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.
  - මෙම සංශෝධිත පනත 2022 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව.
  - ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා සුදුසුවීම පිණිස යම් තැනැත්තෙකුගේ අටළොස්විය සම්පූර්ණ කර තිබිය යුතු දිනය ජුනි මස පළමු වන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
  - යම්කිසි මැතිවරණ කොට්ඨාසයක නාමලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සඳහාත්, සාමාන්‍යයෙන් පදිංචිව සිටිය යුතු සුදුසුකම් ලැබීමේ ලිපිනය සඳහාත්, ඒ ආශ්‍රිත වෙනත් තීරණ සඳහාත් පැවති ජුනි මස පළමුවන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
  - එක් එක් වර්ෂයේ ජුනි මස පළමුවන දිනයෙහි හෝ එදිනට පෙර ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කිරීම වෙනුවට පෙබරවාරි මාසයේ පළමු වන දිනයෙහි එදිනට පෙර යන්න සංශෝධනය විය.
  - ‘අ’ සහ ‘ආ’ ලැයිස්තු සම්පූර්ණ කිරීම ඊළඟට එළඹෙන වර්ෂයේ ජනවාරි තිස්එක් වන දින හෝ එදිනට පෙර සම්පූර්ණ කරනු ලැබිය යුතු යන කරුණු වෙනුවට සැප්තැම්බර් මස තිස්වන දිනය ලෙස සංශෝධනය විය.

- **පරිපූරක ඡන්දහිමි නාමලේඛන සම්බන්ධයෙන්**

  - යම් වර්ෂයක පෙබරවාරි මස පළමු වන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේම මැයි මස තිස්එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත.
  - යම් වර්ෂයක ජුනි මස පළමු වන දිනයෙන් ආරම්භ වී එම වර්ෂයේම සැප්තැම්බර් මස තිස්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත.
  - යම් වර්ෂයක ඔක්තොම්බර් මස පළමු වන දිනෙන් ආරම්භ වී පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත.
  - අටළොස්විය සම්පූර්ණ කරන තැනැත්තෙකුට ඡන්දහිමියෙකු ලෙස නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීම සුදුසුකම් ලබන බවත් ඒ සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ලියාපදිංචි කිරීමේ නිලධාරින් වෙත ඉල්ලීම් කළ හැකි බවත් සංශෝධිත පනතට ඇතුළත් කරන ලදී.

- එමෙන්ම ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් පරිපූරක ලැයිස්තු සකස් කළ යුතු බවත් , එම පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළ කළ යුතු බවත් , එම දැන්වීම් පළ කළ දින සිට දින 10ක් ඇතුළත් හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉල්ලීම් සිදු කළ හැකි බවත්, සංශෝධිත පනතට ඇතුළත් කරන ලදී. එමෙන්ම හිමිකම් හා විරෝධතා පරීක්ෂණ පැවැත්වීමට අදාළ විධිවිධාන හා එම පරික්ෂණ අවසානයේ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කරන දිනය දක්වා කාර්යයන්ට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.

- පරිපූරක නාමලේඛන බලාත්මක වීම සහ නිෂ්ප්‍රභා වීම පිළිබඳව සංශෝධිත පනතේ සඳහන් කර ඇත.

❖ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මතුවන දුෂ්කරතා, කලින් අපේක්ෂා නොකළ කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ වෙනස් කිරීමට අවශ්‍ය විධිවිධාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල පවරා ඇත.

❖ ‘‘ඡන්දහිමි නාමලේඛනය’’ යන යෙදුමේ අර්ථ නිරූපනය පහත අයුරින් සංශෝධනය කරන ලදී.

‘‘20 අ වන වගන්තිය යටතේ සකස් කරන ලද සහතික කරන ලද පරිපූරක නාමලේඛන ඇතුළුව යම් මැතිවරණ කොට්ඨාශයක් සඳහා වූ ඡන්දහිමි නාමලේඛනය අදහස් වේ.’’

❖ හිමිකම් හා විරෝධතා ඉල්ලුම් පත්‍රයන්හි දින සංශෝධනය සිදු කරන ලදි.

❖ 2021.06.01 සිට 2022.01.31 කාලසීමාව තුළ යම් දිනක අවුරුදු 18 සම්පූර්ණ කරන පුරවැසියන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.

2.2.3 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2022

2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මඟින් සිදු කළ සංශෝධන අනුව 2022 පෙබරවාරි 01 දින හෝ ඊට පෙර 2022 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ දැන්වීම අංක 2265/27 හා 2022.02.01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළකරන ලදී.

2.2.3.1 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම

මෙම කාර්යය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරීගේ මෙහෙයවීම මත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදුකරනු ලබන අතර ක්ෂේත්‍රය තුළ ඡන්ද හිමියන් ගණන් ගැනීම. ගණන් ගන්නා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරීවරුන් කටයුතු කරනු ලැබේ.

සාමාන්‍යයෙන් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී සෑම ගෘහයකටම ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතියක් (BC ආකෘතිය) බෙදා දී සංගණනයක් සිදුකරනු ලැබුවත්, කෝවිඩ් 19 වසංගත තත්ත්වය 2022 වර්ෂය ආරම්භයේ ද පැවතීම හේතුවෙන් පුරවැසියන්ගේ හා නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිණිස 2022 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී, එසේ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා සෑම ගෘහයකටම ආකෘති බෙදාදීමක් සිදු නොකිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි. ඒ අනුව 2021 වර්ෂයේ දී සිදුකළ අයුරින් 2021 ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් වන හා අලුතින් ඇතුළත් වන නම් ඇසුරින් පමණක් ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා 2022/ER නැමැති විශේෂ ආකෘතිය හඳුන්වා දීම සිදු කරන ලදී.

2.2.3.2 පදිංචිය වෙනස් වීම හේතුකොටගෙන නව ලියාපදිංචිය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය.

සාමාන්‍ය පදිංචිය 2022 පෙබරවාරි මස 01 දිනට සිදු වී තිබේ නම් 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ නව ලිපිනය යටතේ ලියාපදිංචි වීමට අවකාශය සලසා දී තිබෙන අතර ඒ සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් දැනට පදිංචි ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා හමුවී 2022/ER ආකෘති පත්‍රයක් ලබා ගෙන එය සම්පූර්ණ කර භාරදීම කළ යුතු විය. මෙම ආකෘතිය www.elections.gov.lk වෙබ් අඩවියෙන් ද බාගත කර ගැනීමට අවස්ථාව තිබූ අතර මෙම ආකෘතියේ පුර්ව ලියාපදිංචි විස්තර සඳහන් කිරීමට ඇති තීරුවෙහි එම විස්තර අනිවාර්යයෙන් සටහන් කිරීම කළ යුතු වූ අතර එසේ වුවත් පූර්ව පදිංචි ස්ථානයෙන් පදිංචිය හැරයාමට අදාළව ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරන ලද ලිපිය ඉදිරිපත් කිරීම අනිවාර්යය අවශ්‍යතාවයක් නොවීය.

2.2.3.3 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් 2022 වර්ෂයේ දී ලියාපදිංචි විය යුතු ආකාරය.

2021 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් 2022 වර්ෂයේ දී ලියාපදිංචිවීම සඳහා වර්තමානයේ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා හමු වී 2022/ER ආකෘතියක් ලබාගැනීම හෝ මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.gov.lk වෙබ් අඩවියෙන් භාගත කොට එම ආකෘතිය නියමිත පරිදි සම්පූර්ණ කොට ග්‍රාම නිලධාරී වෙත භාරදීම කළ යුතු විය.

2.2.3.4 2022.02.01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම.

2004.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන් 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලැබූ අතර ඒ අනුව 2022 වර්ෂයේ දී වයස 18 සම්පූර්ණ වන තැනැත්තන් 2022/ER ආකෘතියක් සම්පූර්ණ කොට උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ග්‍රාම නිලධාරිවරයා වෙත භාර දිය යුතු විය.

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා උපදෙස් චක්‍රලේඛය සියළුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වන දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වන දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ප්‍රතිශෝධන කාර්යයන් ආරම්භ කිරීමට පෙර නිකුත් කරන ලදී. ඡන්දහිමියන් ගණන් ගැනීමේ නෛතික හා ප්‍රායෝගික කරුණු පිළිබඳව උපදෙස් ලබා දීම සිදු කළ අතර ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම දක්වා ඉදිරි ක්‍රියාකාරකම් සිදු කළ යුතු දින වකවානු පිළිබඳ සැලැස්ම ද ලබා දෙන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම මත ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාල සීමාව තුළ ග්‍රාම නිලධාරී ස්ථානමාරු වීම් අත්හිටුවීම සහ එම කාලය තුළ ග්‍රාම නිලධාරීන්ගේ කාර්යාල දින සීමා කිරීමට අදාළ උපදෙස් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා සියළුම ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන හදිසි හා අත්‍යවශ්‍ය රාජකාරි ඉටු කිරීමට යටත්ව 2022.02.01 සිට 2022.06.01 දින දක්වා ග්‍රාම නිලධාරීන් සතියේ අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා පෙරවරුව කාර්යාලයේ රැඳී සිටිය යුතු වූ අතර ඉතිරි දින ක්ෂේත්‍රයේ ගණන් ගැනීම සඳහා නිදහස් කිරීමට උපදෙස් දෙන ලදී. එසේම එලෙස ප්‍රකාශිත කාලපරිච්ඡේද තුළ ග්‍රාම නිලධාරී ස්ථාන මාරු සිදු නොකිරීමට ද උපදෙස් ලබා දෙන ලදී.

2022 පෙබරවාරි මස ප්‍රතිශෝධන කටයුතු ආරම්භ වීමත් සමඟ තරමක් ඉහළ මට්ටමින් තිබූ කෝවිඩ් තත්ත්වය හේතුවෙන්, ප්‍රතිශෝධන දැන්වීම් ගෙයින්ගෙට බෙදා හැරීම හා ග්‍රාම නිලධාරී දීමනා ගැටළු මුල් කර ගනිමින් ග්‍රාම නිලධාරීන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් 2022 ප්‍රතිශෝධනය

ආරම්භයේ දී ම දැඩි බාධාවක් ඇති විය. මේ සම්බන්ධයෙන් 2022.02.15 දින ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාව සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් සමඟ අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) සහභාගි වූ අතර ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති නියෝජිතයන් ද පැමිණ සහභාගීවිය. ග්‍රාම නිලධාරී දීමනා සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති එකඟතාව පළ කරන ලදී. ඒ අනුව 2022 ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් ගෙයින්ගෙට දැන්වීම් බෙදීම හා තහවුරු කිරීම සිදු නොකිරීම සහ දීමනා සම්බන්ධයෙන් මූලික එකඟතාවන්ට යටත්ව වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අත්හිටුවීමට වෘත්තීය සමිති නියෝජිතයින් එකඟතාව පළ කරන ලදී. ඡන්දභිමියන් ගණන් ගැනීම ආරම්භයේ දී ම ග්‍රාම නිලධාරීන් එලෙස වෘත්තීය ක්‍රියා මාර්ග ගැනීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ඡන්දභිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා බාධාවක් විය.

සෑම ගෘහයකටම බෙදා දීම සඳහා ප්‍රතිශෝධන උපදෙස් දැන්වීම් 6,500,000 ක් මුද්‍රණය කර තිබූ අතර ග්‍රාම නිලධාරී වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් එම දැන්වීම් ඔවුන් මඟින් බෙදා හැරීම ඉටු කර ගත නොහැකි විය. මේ සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු විය. පාසල් සිසුන් මඟින් ඔවුන්ගේ දෙමව්පියන් දැනුම්වත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ඉල්ලා සිටින ලදී. ඒ සඳහා වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාව අංක ED/09/02/04/08/09 හා 2022.03.21 දිනැති චක්‍රලේඛය මඟින් සියළුම විදුහල්පතිවරුන් ඇතුළු පළාත්, කලාප, කොට්ඨාස අධ්‍යාපන ප්‍රධානීන් වෙත දන්වා ඇත. ඊට අමතරව වෙනත් විකල්ප ක්‍රමවේද මඟින් ද ප්‍රතිශෝධන දැන්වීම ගෘහ වෙත ලබා දීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුම්වත් කරන ලදී.

දිනපතා සිදු වන විදුලි සැපයුමෙහි අඛණ්ඩ බිඳ වැටීම හේතුවෙන් 2022.04.04 දින සිට 2022.04.18 දින දක්වා මැතිවරණ මහලේකම් කාර්යාලයේ පරිගණක දත්ත මධ්‍යස්ථානය තාවකාලිකව ක්‍රියා විරහිත කරන ලදී. රට තුළ පැවති ව්‍යාකූල තත්ත්වය, ඇදිරි නීතිය පැනවීම, ප්‍රධාන කාර්යාලයේ විදුලි ජනක යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධන සපයා ගැනීමට තිබූ අපහසුතා, යනා දී හේතු මත 2022.05.09 දින සිට 2022.05.23 දින දක්වා නැවත වරක් මධ්‍යම සර්වරය අක්‍රිය කිරීමට සිදු විය. මෙම නිසා දිස්ත්‍රික් මැතිවරණ කාර්ය මණ්ඩල වෙත දත්ත පරිගණක ගත කිරීමට දැඩි බාධා ඇතිවිය. ඉහත සඳහන් බාධා හේතුවෙන් සැලසුම් කළ පරිදි ප්‍රතිශෝධනයට අදාළ සමහර කාර්යයන් අත්හිටු වීමටත් , ප්‍රතිශෝධන කාලසටහන සංශෝධනය කිරීමටත් සිදු විය.

ග්‍රාම නිලධාරීන්ගෙන් ගණන් ගැනීමේ ආකෘති භාර ගැනීම 2022.03.11 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද එය 2022 ජූනි මස දක්වා දීර්ඝ කිරීමට සිදු විය. එමෙන්ම ඡන්දභිමි නාමලේඛනයෙන් ඉවත්වන නම් (“අ”) හා ඇතුළත් වන නම් (“ආ˜) ලැයිස්තු කෙටුම්පත් ග්‍රාම නිලධාරී කාර්යාලවලට යවා එලෙස ඇතුළත් නොවූ තැනැත්තන් තව දුරටත් ඇතුළත් කර ගැනීම සඳහා සැලසුම් කළ කාර්යයන් අත්හැර දැමීමට සිදු විය.

එමෙන්ම “අ˜ “ආ˜ ලැයිස්තු ප්‍රදර්ශනය ආරම්භ කිරීම 2022.05.17 දින සිට සිදු කිරීමට ආරම්භයේ දී ම සැලසුම් කර තිබුණ ද එය 2022.06.15 දින දක්වා කල් තැබීමට සිදු විය.

2.2.3.5 ඡන්දභිමි නාමලේඛනයෙන් ඉවත්වන නම් (“අ”) හා ඇතුළත් වන නම් (“ආ”) ලැයිස්තු ප්‍රදර්ශනය: හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම

2021 ඡන්දභිමි නාමලේඛනයේ නම් අඩංගුව ඇති අයගෙන් මියගොස් ඇති හෝ පදිංචිය හැරගොස් ඇති හෝ වෙනත් හේතුවක් මත හෝ හිමිකම් නොලබන තැනැත්තන්ගේ එනම් 2022 වර්ෂයේ ඉවත් කිරීමට නිර්දේශ කරන තැනැත්තන්ගේ නම් සඳහන් වන “අ˜ ලැයිස්තුව හා 2021 වර්ෂයේ ඡන්දභිමි

නාමලේඛනයේ නම් ඇතුළත් නොවන නමුත් වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හෝ පදිංචියට පැමිණීම හෝ වෙනත් හේතුවක් මත හෝ 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා හිමිකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය 2022.06.15 දින සිට සිදු කරන ලදී. මේ පිළිබඳව අංක 2284/19 හා 2022.06.15 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කරන ලදි.

2.2.3.6 2021 වර්ෂයේ නාමලේඛනය (හෝ කොටසක්) සහ "අ" ලැයිස්තු හා "ආ" ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන කරන ලද ස්ථාන පහත පරිදි වේ.

ප්‍රදර්ශනය පිණිස තබනු ලබන ස්ථානය	ප්‍රදර්ශනය පිණිස තබා ඇති ඡන්දහිමි නාමලේඛනය සහ ලැයිස්තු හෝ ඒවායේ කොටස්
එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය	අදාළ මැතිවරණ කොට්ඨාසයෙහි (දිස්ත්‍රික්කයේ) 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත සහ ඊට අදාළ 2022 වර්ෂයේ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්
එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියළුම ඡන්ද කොට්ඨාස දැක්වෙන 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ 2022 වර්ෂයේ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්
එක් එක් පළාත් පාලන ආයතනය	අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියළුම ඡන්ද කොට්ඨාස දැක්වෙන 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන කොටසේ පිටපතක් සහ ඊට අදාළ 2022 වර්ෂයේ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්
එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය	අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති සියළුම ඡන්ද කොට්ඨාස දැක්වෙන 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන කොටසේ පිටපතක් සහ ඊට අදාළ 2022 වර්ෂයේ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්

එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ එකී ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයෙන් හා "ආ" ලැයිස්තුවෙන් ඉවත් කොට හෝ "අ" ලැයිස්තුවේ ඇතුළත් කර හෝ ඇති යම්කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උප ලේඛනයේ නියම කර ඇති "අ" සහ "ආ" ආකෘතියට සාරානුකූලව දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2022 ජූනි 15 දින පළ කරන ලද අතර එදින සිට සති 4 ක් ඇතුළත එනම් 2022.07.12 දිනට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ ඡන්දහිමි නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තා වූ යම් කෙනෙකුට, තමාගේ නම හෝ එකී නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ එකී නාමලේඛනයේ නම ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාව යථෝක්ත පනතේ උප ලේඛනයේ

නියම කර ඇති පරිදි “ඇ˜ ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම අදාළ දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එනම් 2022 ජූනි මස 15 දින සිට සති 4 ක් ඇතුළත එනම් 2022.07.12 දිනට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු බව ප්‍රසිද්ධ කිරීමට ක්‍රියාකරන ලදී.

හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත යථෝක්ත පනතේ උප ලේඛනයේ නියම කර ඇති පරිදි “ඇ˜ ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2022 ජූලි මස 01 වන දින සහ 2022 ජූලි මස 19 වන දින ප්‍රසිද්ධ කරන ලදි.

හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන “අ” “ආ˜ ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන “ඇ˜ “ඈ˜ ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පළාත් පාලන ආයතන කාර්යාලවලින් හා ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගැනීම සඳහා පහසුකම් ලබා දෙන ලදී.

2.2.3.7 හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම පිළිබඳව ක්‍රියා කිරීම.

“අ” “ආ” ලැයිස්තුගත සංඛ්‍යාව හා හිමිකම් භාර ගැනීමේ කාලපරිච්ඡේදය අවසානයේ ලැබී ඇති හිමිකම් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගෙන්ගෙට ගොස් සිදු නොකිරීම නිසා සිදු විය හැකි දෝෂ නිවැරදි කිරීම සඳහා යම් අයුරකින් මඟ හැරී ඇති සුදුසුකම් ලැබූ ඡන්දහිමියන් ප්‍රමාද ඉල්ලීම් ලෙස සලකා නාමලේඛන ගත කිරීමට අදාළ උපදෙස් දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත නිකුත් කරන ලදී.

ඉන්ධන හිඟය, ගමනාගමන දුෂ්කරතා, විදුලිය විසන්ධිය, තැපැල් කාර්යාල වැඩ කරන දින සීමා කිරීම හා තැපැල් බෙදා හැරීමේ ප්‍රමාද, කාර්යාල දින සීමා කිරීම, භාණ්ඩාගාරයෙන් නිසි ලෙස අක්මුදල් නොලැබීම යනාදි හේතු මත නිසියාකාරව හිමිකම් හා විරෝධතා පරීක්ෂණ පැවැත්වීමට බාධා ඇතිවීම, ප්‍රතිශෝධන කටයුතු කරගෙන යාමට බරපතල ලෙස බලපෑ කරුණක් විය.

කෙසේ වෙතත් හිමිකම් හා විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ මෙහෙය වීම හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල නිලධාරීන්ගේ කැප වීම මත 2022.09.30 වන විට බොහෝ කාර්යයන් අවසන් අදියරට ගෙන ඒමට හැකි විය.

අංක 2284/20 හා 2022.06.15 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් ප්‍රසිද්ධ කළ අතර හිමිකම් හා විරෝධතා පරීක්ෂණවලදී දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරයාට මෙම නිලධාරීන්ගේ ලද සහාය අගය කරමු.

2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමෙන් අවසන් කර 2022 ඔක්තෝබර් මස 31 වන දින දිවයිනේ සියලු මැතිවරණ කොට්ඨාසවල සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් සහතික කරන ලදි.

ඒ පිළිබඳව 2022.10.31 දිනැතිව අංක 2304/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමත්, භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමටත් කටයුතු කළ අතර මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ්

අඩවියේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම, ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදී.

2.2.3.8 2022 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන්

- එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ප්‍රවර්තන නාමලේඛනයෙහි (2021) ඉවත් කිරීමට නියමිත (“අ” ලැයිස්තුගත නම්) සහ 2022 ඇතුළත් කිරීමට නියමිත (“ආ” ලැයිස්තුගත නම්) සංඛ්‍යාව (සටහන 09)
- එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 10)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම - 2022 (සටහන 11)
- ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ ඉඩදුන් හිමිකම් හා විරෝධතා (සටහන 12)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචිය අනාවරණය වීම මත එක් ලිපිනයකින් ඉවත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාව (සටහන 13)
- ජාතික හැඳුනුම්පත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පුද්ගලයන් සංඛ්‍යාව (සටහන 14)
- 2021 - 2022 ඡන්දහිමියන් ලියාපදිංචිය සැසඳීම (සටහන 15)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර(සටහන 16)

❖ 2022 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනයෙහි ලියාපදිංචි මුළු ඡන්දහිමියන් සංඛ්‍යාව 16,692,397කි.

2.2.3.9 තුලනාත්මක සංඛ්‍යා සටහන්

පසුගිය වර්ෂ කිහිපයක ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පහත කරුණු පිළිබඳ තුලනාත්මක සංඛ්‍යා සටහන් පහත පරිදි වේ.

- ඡන්ද ප්‍රදේශ අනුව ලියපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳව තුලනාත්මක සටහන 2013 - 2022(සටහන 17)
- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳව තුලනාත්මක සටහන 2013 - 2022 (සටහන 18)
- එක් එක් වර්ෂයේ ලියාපදිංචි ඡන්දහිමියන් සහ පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම හා වැඩිවීමේ ප්‍රතිශතය සංසන්දනය 2010 - 2022(සටහන 19)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරාපත් කරගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන 2013- 2022(සටහන 20)

2.2.4. 2022 වර්ෂයේ අතිරේක පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම.

2021 අංක 22 ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 10 වන වගන්තිය අනුව 2021 ජූනි මස 01 දින සිට 2022 ජනවාරි 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ යම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කළ යුතු ය. 2022 පෙබරවාරි 01 දින සිට සංශෝධිත පනත ක්‍රියාත්මක විය යුතු වුව ද ප්‍රධාන ප්‍රඥප්තියේ ප්‍රතිපාදන අනුව 2021 දෙසැම්බර් මස මෙම නාමලේඛනයට ඇතුළත් විය යුතු පුරවැසියන්ගේ තොරතුරු එකතු කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී.

ඒ අනුව මෙම වයස් කාණ්ඩයට අයත් තැනැත්තන්ගේ තොරතුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත යොමු කරන ලදී. එම තොරතුරු ග්‍රාම නිලධාරි කොට්ඨාස අනුව වෙන් කර ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා හඳුන්වා දුන් ආකෘති පත්‍ර සමඟ ග්‍රාම නිලධාරීන්ට යවන ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට උපදෙස් දෙන ලදී.

පරිපූරක නාමලේඛන සකස් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව මූලික හැඳින්වීමක් සියළුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත ද ලිඛිතව දන්වන ලදී. එමෙන්ම මේ සම්බන්ධයෙන් පක්ෂ ක්‍රියාකාරීන් සහ නියෝජිතයන් දැනුම්වත් කරන ලෙස ද ඉල්ලා සිටින ලදී. එමෙන් පක්ෂ ලේකම්වරුන් සමග මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ පැවති රැස්වීම්වල දී ද පැහැදිලි කරදෙන ලදි.

පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය 2022.02.01 දින සිට සිදු කිරීමට කොමිෂන් සභාව සැලසුම් කර තිබුණ ද, එය පහත කරුණු මත 2022.04.20 දක්වා කල් දැමීමට 2022 ජනවාරි මාසයේ දී කොමිෂන් සභාව තීරණය කරන ලදී.

මෙම අතිරේක පරිපූරකයට ඇතුළත් වීමට සුදුසුකම් ලබන අය 2022 ප්‍රධාන නාමලේඛනයට ඇතුළත්වීමට සුදුසුකම් ලබන බැවින් ගණන් ගන්නා නිලධාරීන් විසින් 2022 වර්ෂයේ ප්‍රතිශෝධනයට අදාළව ගණන් ගැනීමේ දී වැඩි පිරිසක් ඇතුළත් කරගත හැකි බව සැලකිල්ලට යොමු කිරීම.

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ අංක 2262/8 හා 2022.01.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළාත් පාලන ආයතනවල ධුර කාලය 2023.03.19 දක්වා දීර්ඝ කිරීම.

පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම සඳහා පැහැදිලි නීතියක් නොමැති වීම.
ප්‍රධාන නාමලේඛනය සකස් කිරීමේ දී ඉහතින් විස්තර කර ඇති සියළු බාධාවන් 2022 අතිරේක පරිපූරක නාමලේඛනය සැකසීම සඳහා ද ඒ අයුරින්ම බලපාන ලදී. එම සියළු බාධාවන්ට මුහුණ දෙමින් 2022.06.15 දින සිට පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය සිදු කළ යුතු බව මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී.

එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් පරිපූරක ලැයිස්තු පිළියෙල කර අවසන් බව අංක 2284/19 හා 2022.06.15 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ හා පුවත්පත් දැන්වීම් මඟින් 2022 ජූනි 15 දින නිවේදනය කළ අතර එම ලැයිස්තු දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන හා ග්‍රාම නිලධාරි කාර්යාලවල, එක් කාර්යාල බල ප්‍රදේශයට අදාළ පරිපූරක ලැයිස්තු 2022.06.15 දින සිට ප්‍රදර්ශනය කරනු ලබන බව ප්‍රසිද්ධ කරන ලදී.

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් පරිපූරක ලැයිස්තුවට ඇතුළත් කර නොමැති යම් කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම

පිණිස අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උප ලේඛනයේ නියම කර ඇති "අ" සහ "ආ" ආකෘතියට සාරානුකූලව හෝ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා හඳුන්වා දී ඇති YC ආකෘතියක් මගින් හෝ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමග 2022 ජූනි 15 දින සිට දින 10 ක් ඇතුළත මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු බව නිවේදනය කරන ලදී.

මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන විරුද්ධතාව දක්වා සිටීමට අවස්ථාව ලබාදෙන ලදී. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. පරිපූරක නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම 2022 ජූනි මස 15 දින සිට දින දහයක් ඇතුළත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු විය.

හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 7 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඈ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු විය. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2022 ජූලි මස 01 වන දින ප්‍රසිද්ධ කරන ලදී.

හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන "අ" "ආ" ශක ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන "ඇ" "ඈ" ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ පළාත් පාලන ආයතන කාර්යාල හෝ ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගැනීම් සඳහා පහසුකම් සලසන ලදී.

ඉන් අනතුරුව ලැබී තිබූ හිමිකම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී. එමෙන්ම 2022 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගෙයින් ගෙට ගොස් සිදු නොකිරීම නිසා සිදු විය හැකි දෝෂ නිවැරදි කිරීම නාමලේඛන සහතික කිරීම දක්වා ලැබෙන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කර සුදුසුකම් ලැබූ තැනැත්තන් පරිපූරක නාමලේඛනයට ඇතුළත් කරන ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු වෙත දැනුම් දෙන ලදී.

හිමිකම් පරීක්ෂණ අවසන් කළ පසු 2021.06.01 සිට 2022.01.31 කාල පරිච්ඡේදයට අදාළ අතිරේක පරිපූරක නාමලේඛනය 2022 අගෝස්තු මස 31 වන දින සහතික කරන ලදී. මේ සම්බන්ධයෙන් අංක 2295/11 හා 2022.08.31 දිනැති ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම මඟින් නිවේදනය කරන ලදී. මෙම පරිපූරක නාමලේඛනයේ ලියාපදිංචි මුළු ඡන්දහිමියන් සංඛ්‍යාව 142,537 ක් වන අතර එක් එක් මැතිවරණ කොට්ඨාස/ දිස්ත්‍රික් අනුව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව සටහන 21 ලෙස ඇතුළත් කර ඇත.

සෑම ඡන්දහිමි නාමලේඛනයක් සහතික කළ පසු තත් කාලයේ බලපවත්නා වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කළ යුතු වේ. ඒ අනුව පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු වලංගු ඡන්ද සංඛ්‍යාව සහ තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව සටහන 22 ලෙස ඇතුළත් කර ඇත.

මෙම පරිපූරක නාමලේඛනය සහතික කිරීමෙන් අනතුරුව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා කලින් නිශ්චය කළ මන්ත්‍රීධුර සංඛ්‍යාවෙහි වෙනසක් සිදු නොවීය.

2.2.5 2022 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම.

ඡන්දහිමියන් ගණන් ගැනීමේ සංශෝධිත පනත අනුව 2022 පෙබරවාරි මස 01 දින සිට 2022 මැයි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කළ යුතු වේ.

මෙම පරිපූරක නාමලේඛනයට අදාළ ගණන් ගැනීමේ කටයුතු 2022.02.01 දින ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලද අතර ඉහතින් සඳහන් කර ඇති පරිදි ගණන් ගැනීමේ දී සිදුවූ දුෂ්කරතා හා ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා පටිපාටිය මෙම නාමලේඛනය සකස් කිරීම සඳහා ද අනුගමනය කරන ලදී. පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අංක 2287/11 හා 2022.07.05 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

ඉහත සිදුවීම්වලට යටත්ව මෙම පරිපූරක නාමලේඛනය සකස් කිරීම සැලසුම් කළ ආකාරය හා 2022.09.30 දින වන විට ක්‍රියාත්මක කර තිබූ ආකාරය පහත දැක්වේ.

ක්‍රියාකාරකම	සැලසුම් කළ ආකාරය	ක්‍රියාත්මක කළ ආකාරය
පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම	2022.05.02- 2022.05.11	2022.07.05 - 2022.07.14
හිමිකම් හා විරෝධතා භාර ගැනීම	2022.05.02 - 2022.05.11	2022.07.05 - 2022.07.14
ලැබී ඇති හිමිකම් හා විරෝධතා ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු දිනය	2022.05.17	2022.07.19
හිමිකම් සඳහා විරෝධතා ඉදිරිපත් කළ හැකි අවසන් දිනය	2022.05.23	2022.07.25

ඉන් අනතුරුව ලැබී තිබූ හිමිකම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී. එමෙන්ම 2022 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගෙයින් ගෙට ගොස් සිදු නොකිරීම නිසා සිදු විය හැකි දෝෂ නිවැරදි කිරීම නාමලේඛන සහතික කිරීම දක්වා ලැබෙන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කර සුදුසුකම් ලැබූ තැනැත්තන් පරිපූරක නාමලේඛනයට ඇතුළත් කරන ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට දැනුම් දෙන ලදී.

අවස්ථා කිහිපයක දී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු මගින් ග්‍රාම නිලධාරීනට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන්ගේ පෞද්ගලික නිවාස වෙත ලියාපදිංචි වීමට කටයුතු කරන ලෙස ලිපි මගින් දැනුම් දෙන ලදි.

මෙම පරිපූරක නාමලේඛනය 2022.06.15 දින සහතික කිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණ ද, ඉහත විස්තර කරඇති ගැටළු හේතුවෙන් හා උපරිම ඡන්දහිමියන් සංඛ්‍යාවක් පරිපූරක නාමලේඛනයට

ඇතුළත් කර ගැනීමේ අරමුණෙන් 2022.11.08 දින මෙම පරිපූරක නාමලේඛනය සහතික කරන ලදී. මේ සම්බන්ධයෙන් අංක: 2305/10 හා 2022.11.08 දිනැති ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම මඟින් නිවේදනය කරන ලදී. මෙම පරිපූරක නාමලේඛනයේ ලියාපදිංචි මුළු ඡන්දදායකයන් සංඛ්‍යාව 62,732ක් වන අතර එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව පරිපූරක ලැයිස්තු ගත සංඛ්‍යාව, ලැබුණු හා ඉඩදුන් හිමිකම් සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව සටහන 23 හි දැක්වේ.

සෑම ඡන්දදායක නාමලේඛනයක් සහතික කළ පසු තත් කාලයේ බලපවත්නා වලංගු ඡන්දදායක නාමලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කළ යුතු වේ. ඒ අනුව පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව ගණනය කිරීම සටහන 24 හි සඳහන් වේ.

2.2.6 2022 (2) පරිපූරක ඡන්දදායක නාමලේඛනය සකස් කිරීම.

ඡන්දදායකයන් ගණන් ගැනීමේ සංශෝධිත පනත අනුව 2022 ජුනි මස 01 දින සිට 2022 සැප්තැම්බර් මස 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දදායක නාමලේඛනයක් සකස් කළ යුතු වේ.

මෙම පරිපූරක නාමලේඛනයට අදාළ ගණන් ගැනීමේ කටයුතු 2022.02.01 දින ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලද අතර ඉහතින් සඳහන් කර ඇති පරිදි ගණන් ගැනීමේ දී සිදු වූ දුෂ්කරතා හා ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා පටිපාටිය මෙම නාමලේඛනය සකස් කිරීම සඳහා ද අනුගමනය කරන ලදී. පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අංක 2295/12 හා 2022.08.31 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

ඉහත සිදුවීම්වලට යටත්ව මෙම පරිපූරක නාමලේඛනය සකස් කිරීම සැලසුම් කළ ආකාරය හා 2022.09.30 දින වන විට ක්‍රියාත්මක කර තිබූ ආකාරය පහත දැක්වේ.

ක්‍රියාකාරකම	සැලසුම් කළ ආකාරය	ක්‍රියාත්මක කළ ආකාරය
පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම	2022.07.05 - 2022.07.14	2022.08.31 - 2022.09.09
හිමිකම් හා විරෝධතා භාර ගැනීම	2022.07.05 - 2022.07.14	2022.08.31 - 2022.09.09
ලැබී ඇති හිමිකම් හා විරෝධතා ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු දිනය	2022.07.19	2022.09.16
හිමිකම් සඳහා විරෝධතා ඉදිරිපත් කළ හැකි අවසන් දිනය	2022.07.25	2022.09.22

ඉන් අනතුරුව ලැබී තිබූ හිමිකම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී. එමෙන්ම 2022 වර්ෂයේ ඡන්දදායකයන් ගණන් ගැනීම සඳහා ගෙයින් ගෙට ගොස් සිදු නොකිරීම නිසා සිදු විය හැකි දෝෂ නිවැරදි කිරීම නාමලේඛන සහතික කිරීම දක්වා ලැබෙන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කර සුදුසුකම් ලැබූ තැනැත්තන් පරිපූරක නාමලේඛනයට ඇතුළත් කරන ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට දැනුම් දෙන ලදී.

අවස්ථා කිහිපයක දී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම තොරතුරු අනුව තව දුරටත්

නාමලේඛන ගත කළ යුතු තැනැත්තන් ඇති බව නිරීක්ෂණය කළ මැතිවරණ කොමිෂන් සභාව එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරු මගින් ග්‍රාම නිලධාරීන්ට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන්ගේ පෞද්ගලික නිවාස වෙත ලියාපදිංචි වීමට කටයුතු කරන ලෙස ලිපි මගින් දැනුම් දෙන ලදි.

මෙම පරිපූරක නාමලේඛනය 2022.10.01 දින සහතික කිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණ ද, ඉහත විස්තර කරඇති ගැටළු හේතුවෙන් හා උපරිම ඡන්දභිමියන් සංඛ්‍යාවක් පරිපූරක නාමලේඛනයට ඇතුළත් කර ගැනීමේ අරමුණෙන් 2022.11.15 දින මෙම පරිපූරක නාමලේඛනය සහතික කරන ලදී. මේ සම්බන්ධයෙන් අංක: 2306/21 හා 2022.11.15 දිනැති ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම මඟින් නිවේදනය කරන ලදී. මෙම පරිපූරක නාමලේඛනයේ ලියාපදිංචි මුළු ඡන්දභිමියන් සංඛ්‍යාව 56,212ක් වන අතර එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව පරිපූරක ලැයිස්තු ගත සංඛ්‍යාව, ලැබුණු හා ඉඩදුන් හිමිකම් සංඛ්‍යාව, ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව සටහන 25 හි දැක්වේ.

සෑම ඡන්දභිමි නාමලේඛනයක් සහතික කළ පසු තත් කාලයේ බලපවත්නා වලංගු ඡන්දභිමි නාමලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කළ යුතු වේ. ඒ අනුව පරිපූරක නාමලේඛන සහතික කිරීමෙන් පසු තෝරා පත්කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව ගණනය කිරීම සටහන 26 හි සඳහන් වේ.

2.2.7 2022 (3) පරිපූරක ඡන්දභිමි නාමලේඛනය සකස් කිරීම.

ඡන්දභිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2022 ඔක්තෝම්බර් මස 01 දින සිට 2023 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දභිමි නාමලේඛනයක් සකස් කළ යුතුවේ.

මෙම පරිපූරක නාමලේඛනයට අදාල ගණන් ගැනීමේ කටයුතු 2022.02.01 දින ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදි.

ඡන්දභිමියන් ගණන් ගැනීමේදී සිදු වූ දුෂ්කරතා ඒ අයුරින්ම මෙම පරිපූරක නාමලේඛනය සකස් කිරීම සඳහා ද බලපාන ලදි.

අතිරේක පරිපූරකය සකස් කිරීම සඳහා සිදුකළ ක්‍රියාකාරකම් මෙම පරිපූරක නාමලේඛනය සකස් කිරීම සඳහා ද අනුගමනය කරන ලදි.

පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා සම්බන්ධයෙන් අංක: 2308/18 හා 2022.11.30 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම් පළ කරන ලදී.

පරිපූරක නාමලේඛනය සකස් කිරීම සැලසුම් කළ ආකාරය හා ක්‍රියාත්මක කළ ආකාරය පහත දැක්වේ.

ක්‍රියාකාරකම	සැලසුම් කළ ආකාරය	ක්‍රියාත්මක කළ ආකාරය
පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම	2022.11.01 - 2022.11.10	2022.11.30 - 2022.12.09
හිමිකම් හා විරෝධතා භාර ගැනීම	2022.11.01 - 2022.11.10	2022.11.30 - 2022.12.09
ලැබී ඇති හිමිකම් හා විරෝධතා ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු දිනය	2022.11.15	2022.12.14
හිමිකම් සඳහා විරෝධතා ඉදිරිපත් කළ හැකි අවසන් දිනය	2022.11.21	2022.12.20

ඉන් අනතුරුව ලැබී තිබූ හිමිකම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී. එමෙන්ම 2022 වර්ෂයේ ඡන්දහිමියන් ගණුන් ගැනීම සඳහා ගෙයින් ගෙට ගොස් සිදු නොකිරීම නිසා සිදු විය හැකි දෝෂ නිවැරදි කිරීම නාමලේඛන සහතික කිරීම දක්වා ලැබෙන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කර සුදුසුකම් ලැබූ තැනැත්තන් පරිපූරක නාමලේඛනයට ඇතුළත් කරන ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට දැනුම් දෙන ලදී.

අවස්ථා කිහිපයකදී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් මගින් ග්‍රාම නිලධාරීනට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන් වෙත ලියාපදිංචි වීමට කටයුතු කරන ලෙස ලිපි මගින් දැනුම් දෙන ලදී.

2022.12.31 දින වනවිට හිමිකම් පරීක්ෂණ ආරම්භ කර තිබුණි. මෙම පරිපූරක නාමලේඛනය ආරම්භයේදී සැලසුම් කළ ආකාරයට 2023.02.01 දින සහතික කිරීම සඳහා කටයුතු සංවිධානය කර ගන්නා ලෙස සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර කොමසාරිස්වරුන්ට දැනුම් දී ඇත.

2.2.8 2023 (1), 2023 (2) සහ 2023 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.

2023.02.01 සිට 2023.05.31 දක්වා සකස් කළ යුතු 2023 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය, 2023.06.01 සිට 2023.09.30 දක්වා සකස් කළ යුතු 2023 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහ 2023.10.01 සිට 2024.01.31 දක්වා සකස් කළ යුතු 2023 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ විස්තර 2022 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට සමගාමීව එකතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි.

2022 වර්ෂය අවසාන වනවිට 2023(1), 2023(2) හා 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනවල ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කර තිබූ සංඛ්‍යාව පහත දැක්වේ.

පරිපූරක නාමලේඛනය	ඉල්ලුම් කර තිබූ යොවුන් පුරවැසියන් සංඛ්‍යාව
(1)2023	23106
(2)2023	23299
(3)2023	21982

2.2.9 ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම.

2021 ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනයට සමගාමීව ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා මාර්ගගත (Online) පහසුකම හඳුන්වා දුන් අතර, එය 2022 වර්ෂයේදී ද එලෙසම ක්‍රියාත්මක විය.

එසේම 2021 වර්ෂයේ දී හඳුන්වා දුන් සියලු පුරවැසියන් හට ඡන්දහිමි නාමලේඛන තොරතුරු ඇතුළත් ප්‍රකාශයක් තම ජංගම දුරකථනයක්/ පරිගණකය ලබාගැනීමේ පහසුකම ද මෙම වසරේ ද එලෙසින්ම ක්‍රියාත්මක විය.

පළමු වසර සඳහා පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා කලාප/ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලට නොමිලයේ හා පාසල්වලට සහන ගාස්තු අයකර ඊ-සේවාවක් මඟින් පදිංචි විස්තර ලබාදීමේ සේවයක් ක්‍රියාත්මක විය.

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කාර්යභාරය මෙම වාර්තාවේ සඳහන් කර ඇත.

2.2.10 ඡන්දහිමි නාමලේඛනයට දුරකථන සහායක සේවාව ක්‍රියාත්මක කිරීම.

ඡන්දහිමි නාමලේඛනයේ නම ලියාපදිංචිය පරීක්ෂා කිරීම/ ඡන්දහිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම. හා වෙනත් ප්‍රතිශෝධන කටයුතු සඳහා තොරතුරු ලබා ගැනීම එසේම දුරකථන සහායක සේවාවන් දින 2022.06.20 සිට 2022.07.30 දක්වා ක්‍රියාත්මක විය.

2.2.11 ප්‍රතිශෝධනය පිළිබඳව කෙටි පණිවිඩ (SMS) මඟින් ජනතාව දැනුම්වත් කිරීම.

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ කිරීමත් සමඟම ඩයලොග්, මොබිටෙල්, එයාර්ටෙල් සහ හවිෂන් යන ජංගම සහ CDMA දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2022.02.01 දින යැවීමට කටයුතු කරන ලදී.

<u>පෙබරවාරි 01 කෙටි පණිවිඩය</u>

සිංහල

2021 ඡන්ද ලේඛනයේ නම නොමැතිනම් හෝ ලිපිනය වෙනස් කිරීමට අවශ්‍යනම් පමණක් 2022 ඡන්ද ලේඛනයට නම ඇතුළත් කිරීමට ග්‍රාම නිලධාරී විමසන්න.

සිංහලිෂ්

2021 Chanda Lekanaye nama nomathinam ho lipinaya wenas kireemata awashyanam pamanak 2022 Chanda Lekanayata nama athulath kireemata Grama Niladari wimasanna.

දෙමළ

2021 தேருநர் இடாப்பில் பெயர் இல்லையெனின் அல்லது முகவரியை மாற்றுவதற்கு தேவையாயின் மாத்திரம் 2022 தேருநர் இடாப்பில் பெயரை உட்சேர்த்துக்கொள்வதற்காக கிராம அலுவலரை விசாரிக்கவும்.

ටැංග්ලිෂ්

2021 terunar idapil peyar illeyenin alladu mugawariei matruwadaku teveiyain mattiram 2022 terunar idapil peyarai utsertukolwadakagal grama aluwalari visarikaum.

ඉංග්‍රීසි

Contact Grama Niladhari to include the name in the 2022 Electoral Register, only if your name isn’t in the 2021 Register or if you want to change the address.

‘අ’ ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය හා හිමිකම් සහ විරෝධතා භාර ගැනීමේ කාල පරිච්ඡේදයට අදාළව ඩයලොග්, මොබිටෙල්, එයාර්ටෙල් සහ හච්ෂන් යන ජංගම සහ CDMA දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2022.06.20 දින යැවීමට කටයුතු කරන ලදී.

<u>ජුනි 20 කෙටි පණිවිඩය</u>

සිංහල

2022 ඡන්ද ලේඛනයේ ඔබේ නම තිබේදැයි, ග්‍රාම නිලධාරිගෙන් හෝ www.elections.gov.lk බලන්න. නම නැත්නම් ජූලි 12ට පෙර 0112860031 අමතන්න.

සිංග්ලිෂ්

2022 Chanda Lekanaye obe nama thibedeyi Grama Niladarigen ho www.elections.gov.lk web adaviyen balanna. Nama nethnam July 12ta pera 0112860031 amathanna.

දෙමළ

2022 ஆண்டின் தேருநர் இடாப்பில் உங்களது பெயர் உள்ளதாவென்று, கிராம அலுவலரிடம் அல்லது றறற.நடநஉவழைளெ.பழஎ.டம பார்க்கவும். பெயர் இல்லையாயின் யூலை 12 இற்கு முன்னர் 0112860032 அழைக்கவும்.

ටැංග්ලිෂ්

2022 aandin terunar idapil ungal peyar ulladawena, Grama aluwalaridam alladu www.elections.gov.lk parkavum. Peyar illayain July 12ku munnar 0112860032 alaikaum.

ඉංග්‍රීසි

Contact Grama Niladari or browse www.elections.gov.lk to ensure that your name is on the electoral register 2022. If isn’t, inform 0112860034 before 12th July.

රට තුළ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් 2022 වර්ෂයට අදාළ ඡන්දහිමියන් ගණන් ගැනීමේදී, පෙර වර්ෂවල ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයන්ට සාපේක්ෂව නාගරික, අර්ධ නාගරික, වතු ආශ්‍රිත මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ඡන්දහිමියන් ගණන් ගැනීමේ අඩුවීමක් නිරීක්ෂණය විය. එමෙන්ම 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස ඡන්ද බලය ලබාදීමට නෛතික ප්‍රතිපාදන ලබා දී ඇති අතර, එම පරිපූරක නාමලේඛන සඳහා ඇතුළත් විය යුතු පුරවැසියන්ගේ අඩුවක් ද දක්නට ලැබුණි. එම නිසා, ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය පිළිබඳව පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා, 2022.10.13 දින පහත පරිදි SMS පණිවුඩයක් Elections යන ශීර්ෂ පාඨය යටතේ මොබිටෙල්, ඩයලොග්, එයාර්ටෙල් සහ හච්ෂන් දුරකථන ග්‍රාහකයන් වෙත යැවීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලද අතර, ඒ සඳහා එම ආයතනවලින් අවස්ථාව ලබාදෙන ලදි.

ඔක්තෝබර් 13 කෙටි පණිවිඩය

සිංහල
2005.02.01 ට පෙර උපන් අය ඡන්ද ලේඛනයේ නම ඇත්දැයි ග්‍රාම නිලධාරිගෙන් / www.elections.gov.lk බලන්න. නම නැත්නම් ඔක්.19ට පෙර ග්‍රාම නිලධාරි හමුවන්න.

සිංග්ලිෂ්
2005.02.01 ta pera upan aya Chanda Lekanaye nama athdeyi Grama Niladarigen/ www.elections.gov.lk balanna. Nama nethnam Oct.19ta pera GN hamuwanna.

දෙමළ
2005.02.01 க்கு முன் பிறந்தோர், வாக்காளர் இடாப்பில் உங்கள் பெயர் உள்ளதாவென கிராம அலுவலரிடம் / www.elections.gov.lk இல் பிரவேசித்து அறிந்து கொள்ளவும். பெயர் இல்லையாயின் ஒக்தோபர் 19 இற்கு முன் கிராம அலுவலரை சந்திக்கவும்.

ටැංග්ලිෂ්
2005.02.01 ku mun pirandor, vakkalar idapil ungal peyar ulladavena GN/www.elections.gov.lk il arindu kollaum. Peyar illaiyain October 19 ku mun GN ai sandikaum.

ඉංග්‍රීසි
Contact GN/browse www.elections.gov.lk those who were born before 2005.02.01 to ensure your name is in the electoral register. If not, meet GN before 19th Oct.

මෙම කෙටි පණිවිඩ මඟින් ජනතාව විශාල ලෙස දැනුම්වත් වීමක් සිදු විය. මේ සම්බන්ධයෙන් ඩයලොග් මාධ්‍ය ජලය, මොබිටෙල් පුද්ගලික සමාගම, භාරතී එයාර් ටෙල් ලංකා සමාගම සහ හච්ෂන් ටෙල් කොමියුනිකේෂන් ශ්‍රී ලංකා සමාගමට අතිශය කෘතඥතාවය පළ කරමු. එමෙන්ම සම්බන්ධීකරණ කාරයය භාරය ඉටු කළ ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ද කෘතඥතාවය පළ කරමු.

2.2.12 පුවත්පත් දැන්වීම් පළ කිරීම.

ප්‍රධාන නාමලේඛනය සහ පරිපූරක නාමලේඛනවල ලියාපදිංචි කිරීම හා මහජනයා දැනුම්වත් කිරීම සඳහා පහත සඳහන් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රයෙන් 2022/03/30 සිට 2022/04/10 දින දක්වා කාලයතුළ පළ කරන ලදී.

2022 ඡන්දනාමලේඛන සංශෝධන කටයුතු ආරම්භ කිරීම

2022 වර්ෂය සඳහා ඡන්දනාමලේඛන සංශෝධන කටයුතු 2022.02.01 දින ආරම්භ කර ඇත. සෑම ගෘහයකටම ගණන් ගැනීමේ ආකෘතිපත්‍ර බෙදාදීම සිදු නොකෙරේ.

2021 වර්ෂයේ ලියාපදිංචි වී නොමැති නම් හෝ 2021 වර්ෂයේ ලියාපදිංචි ලිපිනය සංශෝධනය කළ යුතු නම්; 2004.01.31 හෝ ඊට පෙර උපන් තැනැත්තන් ලියාපදිංචි වීම සඳහා;

සහ

18 සම්පූර්ණ කළ විගස මාස 4කට වරක් පරිපූරක නාමලේඛන මගින් ඡන්ද බලය

ලබාගැනීම සඳහා අවුරුදු 16 - 18 (2006.01.31ට පෙර උපන්) පුරවැසියන් ලියාපදිංචි වීම සඳහා ග්‍රාම නිලධාරී හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විමසන්න.

මැතිවරණ කොමිෂන් සභාව
011-2868441 / www.elections.gov.lk

2022 தேருநர் (வாக்காளர்) இடாப்பு கணக்கெடுப்பு ஆரம்பிக்கப்பட்டுள்ளது.

2022 ஆம் ஆண்டிற்கான வாக்காளர்கள் கணக்கெடுப்பு 2022.02.01 ஆம் திகதி ஆரம்பிக்கப்பட்டுள்ளது. அனைத்து வீடுகளுக்கும் கணக்கெடுப்புப் படிவங்கள் விநியோகிக்கப்பட மாட்டாது.

2021 ஆம் ஆண்டில் பதிவு செய்யப்படாதிருப்பின் அல்லது 2021 ஆம் ஆண்டில் பதிவு தொடர்பான முகவரியில் திருத்தங்களை மேற்கொள்ள வேண்டுமாயின் ; 2004.01.31 அல்லது அதற்கு முன்னர் பிறந்த நபர்களை பதிவு செய்துகொள்வதற்காக

மற்றும்

18 வயது பூர்த்தியடைந்தவுடனேயே 04 மாதங்களுக்கொரு முறை குறைநிரப்பு இடாப்பு ஊடாக வாக்குரிமையை

பெற்றுக்கொள்வதற்காக 16 - 18 வயதுகளுக்கிடைப்பட்ட (2006.01.31 இற்கு முன்னர் பிறந்த) பிரஜைகளைப் பதிவு செய்து கொள்வதற்காக கிராம அலுவலரை அல்லது மாவட்டத் தேர்தல்கள் அலுவலகத்தை தொடர்பு கொள்ளவும்.

தேர்தல் ஆணைக்குழு
011-2868441 / www.elections.gov.lk

Enumeration of Electors 2022 begins

The enumeration of electors for the year 2022 has commenced on 01.02.2022. Enumeration forms are not distributed to every household.

Contact the Grama Niladhari or District Elections Office

if not registered in the year 2021 or if the address of the registration in the year 2021 need to be amended; for registration of persons born on or before 31.01.2004;

and

to register the citizens aged 16 - 18 years (born before 31.01.2006)

for obtaining voting right as soon as attaining the age of 18 by supplementary registers prepared every 4 months

Election Commission
011-2868441 / www.elections.gov.lk

ඉහත සඳහන් දැන්වීම් පළ කළ පුවත්පත්, මාධ්‍ය හා පළ කළ දින පිළිබඳ විස්තර පහත දැක්වේ.

පුවත්පත	මාධ්‍ය	පළ වූ දින
දිනමිණ	සිංහල	මාර්තු / 30අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
තිනකරන්	දෙමළ	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඩේලි නිවුස්	ඉංග්‍රීසි	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
සිළුමිණ	සිංහල	අප්‍රේල් / 03අප්‍රේල් 10
තිනකරන් වරමන්ජරි	දෙමළ	අප්‍රේල් / 03අප්‍රේල් 10
සන්ඩේ ඔබ්සවර්	ඉංග්‍රීසි	අප්‍රේල් / 03අප්‍රේල් 10
දිවයින	සිංහල	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
අයිලන්ඩ්	ඉංග්‍රීසි	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා දිවයින	සිංහල	අප්‍රේල් / 03අප්‍රේල් 10
ඉරිදා අයිලන්ඩ්	ඉංග්‍රීසි	අප්‍රේල් / 03අප්‍රේල් 10
නවලිය	සිංහල	අප්‍රේල් 04
විදුසර	සිංහල	අප්‍රේල් 06
ලංකාදීප	සිංහල	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
අද	සිංහල	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා ලංකාදීප	සිංහල	අප්‍රේල් / 03අප්‍රේල් 10
මව්බිම	සිංහල	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
සිලෝන් ටුඩේ	ඉංග්‍රීසි	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා මව්බිම	සිංහල	අප්‍රේල් / 03අප්‍රේල් 10
ඉරිදා සිලෝන් ටුඩේ	ඉංග්‍රීසි	අප්‍රේල් / 03අප්‍රේල් 10
දිනපතා අරුණ	සිංහල	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
දිනපතා තමිලන්	දෙමළ	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
දිනපතා The Morning	ඉංග්‍රීසි	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
සතිඅග අරුණ	සිංහල	අප්‍රේල් / 03අප්‍රේල් 10
සතිඅග තමිලන්	දෙමළ	අප්‍රේල් / 03අප්‍රේල් 10
සතිඅග The Sunday Morning	ඉංග්‍රීසි	අප්‍රේල් / 03අප්‍රේල් 10
ධරණි කාන්තා පුවත්පත	සිංහල	අප්‍රේල් 06
තිනකුරල්	දෙමළ	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා තිනකුරල්	දෙමළ	අප්‍රේල් 03 / අප්‍රේල් 10
වීරකේසරී	දෙමළ	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා වීරකේසරී	දෙමළ	අප්‍රේල් 03 / අප්‍රේල් 10
යාල් තිනකුරල්	දෙමළ	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා යාල් තිනකුරල්	දෙමළ	අප්‍රේල් 03 / අප්‍රේල් 10
උදයන්	දෙමළ	මාර්තු 30 / අප්‍රේල් 01 / අප්‍රේල් 04 / අප්‍රේල් 06 / අප්‍රේල් 08
ඉරිදා උදයන්	දෙමළ	අප්‍රේල් 03

කිසිදු ඡන්දහිමියෙකු අත්නොහැරෙන ලෙස ඡන්දහිමි නාමලේඛනයක් සකස් කිරීමේ අරමුණෙන් මෙහි පහත සඳහන් දැන්වීම් 2022.10.20, 21, 23 සහ 25 දිනවල පළ කරන ලදි.

2022.10.20, 21 සහ 23 පුවත්පත්වල පළ කළ දැන්වීම.







2022.10.25 දින පුවත්පත්වල පළ කළ දැන්වීම.







ඉහත සඳහන් දැන්වීම පළ කළ පුවත්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

පුවත්පත	මාධ්‍ය	පළ වූ දින
දිනමිණ	සිංහල	2022.10.20 / 2022.10.21 / 2022.10.25
තිනකරන්	දෙමළ	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඩේලි නිවුස්	ඉංග්‍රීසි	2022.10.20 / 2022.10.21 / 2022.10.25
සිළුමිණ	සිංහල	2022.10.23
සන්ඩේ ඔබ්සවර්	ඉංග්‍රීසි	2022.10.23
දිවයින	සිංහල	2022.10.20 / 2022.10.21 / 2022.10.25
අයිලන්ඩ්	ඉංග්‍රීසි	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඉරිදා දිවයින	සිංහල	2022.10.23
ඉරිදා අයිලන්ඩ්	ඉංග්‍රීසි	2022.10.23
ලංකාදීප	සිංහල	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඩේලි මිරර්	ඉංග්‍රීසි	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඉරිදා ලංකාදීප	සිංහල	2022.10.23
සන්ඩේ ටයිම්ස්	ඉංග්‍රීසි	2022.10.23
මව්බිම	සිංහල	2022.10.20 / 2022.10.21 / 2022.10.25
සිලෝන් ටුඩේ	ඉංග්‍රීසි	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඉරිදා මව්බිම	සිංහල	2022.10.23
ඉරිදා සිලෝන් ටුඩේ	ඉංග්‍රීසි	2022.10.23
දිනපතා අරුණ	සිංහල	2022.10.20 / 2022.10.21 / 2022.10.25
දිනපතා The Morning	ඉංග්‍රීසි	2022.10.20 / 2022.10.21 / 2022.10.25
සතිඅග අරුණ	සිංහල	2022.10.23
The Sunday Morning	ඉංග්‍රීසි	2022.10.23
තිනකුරල්	දෙමළ	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඉරිදා තිනකුරල්	දෙමළ	2022.10.23
වීරකේසරී	දෙමළ	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඉරිදා වීරකේසරී	දෙමළ	2022.10.23
යාල් තිනකුරල්	දෙමළ	2022.10.20 / 2022.10.21 / 2022.10.25
ඉරිදා යාල් තිනකුරල්	දෙමළ	2022.10.23

2.2.13 ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම.

ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී සිටින යම් තැනැත්තෙකුට පෙර වර්ෂයක ඡන්දහිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ලබා ගැනීම සඳහා තමා ලියාපදිංචි ලිපිනය අයත් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ගොස් අයදුම්පතක් ඉදිරිපත් කිරීම කළ යුතු විය. මෙම ක්‍රමය මහජන හිතකාමී නොවන බවට වටහා ගත් මැතිවරණ කොමිෂන් සභාව ඕනෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයක්

වෙත අයදුම්පතක් ඉදිරිපත් කරන කුමන හෝ දිස්ත්‍රික්කයක ලියාපදිංචි තැනැත්තෙකුට ඡන්දහිමි නාමලේඛනයේ සහතික කළ උපුටනයක් ලබා දීම සඳහා ක්‍රමවේදයක් මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කරන ලදී.

ඒ අනුව තොරතුරු තාක්ෂණ අංශය විසින් හඳුන්වා දෙන ලද පරිගණක මෘදුකාංගයක් ඔස්සේ අදාළ පහසුකම මහජනතාව වෙත ලබා දී ඇති අතර මේ වන විට මෙම කාර්යය සෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකම ක්‍රියාත්මක වේ.

සහතික කරන ලද ඡන්දහිමි නාමලේඛන තොරතුරු මහජනයා වෙත ලබා දීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් හඳුන්වා දී ඇති වැඩසටහන් හා වැඩිදියුණු කිරීම පිළිබඳව මෙම වාර්තාවෙහි ඉදිරියේ දී වැඩිදුරටත් සඳහන් කර ඇත.

2.3. පාර්ලිමේන්තු මන්ත්‍රිධුර පුරප්පාඩු පිරවීම.

අංක 18 පොළොන්නරුව මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද අමරකීර්ති අතුකෝරල මහතා මිය යෑම හේතුකොටගෙන ඇති වූ පුරප්පාඩු සඳහා ඇස්. ජගත් සමරවික්‍රම මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක 2280/22 හා 2022.05.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 උ ව්‍යවස්ථාව (ජාතික ලැයිස්තුව) යටතේ තෝරා පත්කර ගන්නා ලද බැසිල් රෝහණ රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීම හේතු කොටගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා කුලප්පු ආරච්චිගේ දොන් ධම්මික පෙරේරා මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක 2283/39 හා 2022.06.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

එක්සත් ජාතික පක්ෂය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව (ජාතික ලැයිස්තුව) යටතේ තෝරා පත්කර ගන්නා ලද රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස පත්වීම හේතුවෙන් ඔහු විසින් ස්වකීය මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම හේතු කොටගෙන ඇති වූ පුරප්පාඩු සඳහා වජිර අබේවර්ධන මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක 2289/42 හා 2022.07.22 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

2.4 පළාත් සභා ඡන්ද විමසීම

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සහ 2017 අංක 17 දරන සංශෝධන පනත සම්මත වුවද පළාත් සභා කොට්ඨාස ක්‍රමය යටතේ පැවැත්වීම සඳහා පළාත් සභා සීමා නීර්ණය කර සකස් කරන ලද සීමා නිර්ණය පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සම්මත නොවීම යන කරුණු හේතුවෙන් 2022 වසරේ ද පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමේ හැකියාව ලැබී නොමැත.

නිළ කාලය අවසන්ව ඇති සියලුම පළාත් සභා ඒ ඒ ආණ්ඩුකාරවරුන්ගේ පාලනය යටතේ පවතී.

2.5 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම.

2.5.1 2018 වර්ෂයේ පැවැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම

2018 වර්ෂයේ පෙබරවාරි මස 02 දින පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාලව මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබන වාර්තාව 2022 වර්ෂයේ අවසන් භාගය වන විට සකස් කර අවසන් කරන ලදී. ඒ අනුව, එම වාර්තාවේ වෙළුම 1 හි සිංහල පිටපත මුද්‍රණ කටයුතු අවසන්

කර පොත් වශයෙන් සකස් කර අවසන් කරන ලදී. එම වාර්තාවේ වෙළුම II කොටස වන ප්‍රතිඵල ඇතුළත් වාර්තාව සකස් කර මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලය වෙත ලබා දීමට කටයුතු කර ඇත.

2018 වර්ෂයේ පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී තේරී පත් වූ සභිකයන්ගේ ධුර කාලය 2022.03.20 දිනයෙන් අවසන් වූ අතර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අංක 2262/08 හා 2022.01.10 දිනැති ගැසට් නිවේදනයෙන් (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 10(2)(ආ) වගන්තිය යටතේ ද, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 10(2)(ආ) වගන්තිය යටතේ ද, 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 5(2)(ආ) වගන්තිය යටතේ එක් එක් මහා නගර සභාවේ, එක් එක් නගර සභාවේ සහ එක් එක් ප්‍රාදේශිය සභාවේ සභිකයන්ගේ ධුරකාලය අවසන් දිනය 2023 මාර්තු මස 19 වැනි දින දක්වා වසරකින් දීර්ඝ කරන ලදී.

2.5.2 පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු පිරවීම

පළාත් පාලන ආයතනවල සභිකයන් මියයාම, ඉල්ලා අස්වීම, පක්ෂ සාමාජිකත්වය අහිමි වීම, අවසර නොලබා සභා රැස්වීම්වලට නියමිත කාලසීමාවක් අඛණ්ඩව සහභාගී නොවීම, සභාපතිවරයා ලෙස පත්වීම, අයවැය පරාජයට පත්වීම සහ ආණ්ඩුකාරවරයා විසින් ඉවත් කිරීම යන හේතූන් මත සභිකධුර පුරප්පාඩු සිදුවූ අතර එම සභිකධුර පුරප්පාඩු පිරවීමේ නෛතික ක්‍රියාවලිය පළාත් පාලන අංශය විසින් සිදුකරනු ලබයි.

ඒ අනුව, 2022 පළමු කාර්තුව ආරම්භයේ සිට 2022 සිව්වන කාර්තුවේ අවසානය දක්වා පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු 252 ක් වෙනුවෙන් සභිකයන් පත්කිරීම සඳහා ක්‍රියාකර ඇති අතර ඒ පිළිබඳ තොරතුරු සටහන 27 හි ඇතුළත් කර ඇත.

පළාත් පාලන සභිකධූරයන් හි පුරප්පාඩු ඇතිවීමට බලපෑ හේතු පහත පරිදි වේ.

අනු අංකය	පුරප්පාඩු වීමට බල පෑ හේතුව	පුරප්පාඩු ඇති වූ සංඛ්‍යාව
1	අවසර නොලබා සභා රැස්වීම්වලට සහභාගී නොවීම	24
2	ආණ්ඩුකාරවරයා විසින් ඉවත් කිරීම	2
3	ඉල්ලා අස්වීම	95
4	පක්ෂ සමාජිකත්වය අහිමිවීම	82
5	මියයාම	44
6	සභාපතිවරයා ලෙස පත්වීම	4
7	අයවැය පරාජය වීම	1

2.5.3 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා සූදානම් වීම

වසරකින් දීර්ඝ කරන ලද පළාත් පාලන ආයතනවල නිල කාලය 2023 මාර්තු මස 19 වැනි දිනයෙන් අවසන් වන බැවින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 25 වැනි වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 වර්ෂයේ පැවැත්වීමට අදාළව 2022.12.31 දින වන විට පළාත් පාලන ඡන්ද විමසීම් අංශය විසින් පහත සඳහන් කටයුතු සිදුකරන ලදී.

2.5.4 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද ගැසට් නිවේදන

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද ගැසට් නිවේදන පහත පරිදි වේ.

අනු අංකය	විස්තරය	ගැසට් පත්‍රයේ අංකය	නිකුත් කරන ලද දිනය
1	(1) 4 වගන්තිය යටතේ තේරීම්භාර නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම	26/2311	2022.12.21
2	(1) 4 වගන්තිය සමග කියවෙන (1) 27 වැනි වගන්තිය යටතේ එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරීන් පත්කිරීම	27/2311	2022.12.21
3	ඡන්ද හිමි නාමලේඛන ප්‍රදර්ශනය කිරීම	04/2312	2022.12.27
4	එක් එක් පළාත් පාලන ආයතනය වෙනුවෙන් ඉදිරිපත් කළයුතු අපේක්ෂක සංඛ්‍යාවන් පිළිබඳ විස්තරය දැක්වෙන ගැසට් නිවේදනය	44/2312	2022.12.29
5	පිළිගත් නව දේශපාලන පක්ෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කිරීම	32/2311	2022.12.27
6	පක්ෂ සළකුණු ඇතුලත් ගැසට් නිවේදනය	34/2312	2022.12.28
7	පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව -ගැසට් නිවේදනය	31/2312	2022.12.28
8	පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව 27අ වගන්තිය යටතේ ගැසට් නිවේදනය	33/2312	2022.12.28

2.5.5 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ

2023 පළාත් පාලන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ පිළිබඳ තොරතුරු සටහන 28 හි ඇතුළත් කර ඇත.

2.5.6 මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලය වෙත ලබාදී ඇති ලිපි ලේඛණ, ආකෘති පත්‍ර, ලිපි කවර, ජර්නල්, උපදෙස් පොත් සහ අනෙකුත් ලේඛන

ඉහත කරුණට අදාළ ලේඛණ පිළියෙල කිරීම් පිළිබඳ තොරතුරු සටහන 29 ලෙස සඳහන් කර ඇත.

2.5.7 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කර ඇති මාධ්‍ය නිවේදන, උපදෙස්, ලිපි සහ පවත්වා ඇති සාකච්ඡා

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව එක් එක් පළාත් පාලන ආයතන මට්ටමින් ඡන්ද විමසීමේ දැන්වීම ප්‍රසිද්ධ කරන ලෙස දැනුම් දීම.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව 2023.01.18 සිට 2023.01.21 මධ්‍යාහ්න 12.00 දක්වා නාමයෝජනා භාරගන්නා බවට දැන්වීම.

තැපෑලෙන් ඡන්දය විමසීම පිළිබඳ මාධ්‍ය නිවේදනය පළ කිරීම.

ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලය අවම කරගැනීමේ ඇති හැකියාව පිළිබඳව සලකා බැලීම සඳහා ආදර්ශ ඡන්ද විමසීමක් 2022.12.16 දින පැවැත්වීමට ක්‍රියාකරන ලදී.

2022.12. 17, 18, 19 සහ 20 යන දිනයන් හි දී ඡන්ද විමසීමට භාවිතා කරනු ලබන නිළ සලකුණුවල තත්ත්වය පරීක්ෂා කිරීමට හා අදාළ පරිදි අලුත්වැඩියා කිරීමට උපදෙස් ලබා දීමට ක්‍රියා කර ඇත.

ඡන්ද පෙට්ටිවල අලුත්වැඩියා කටයුතු කරන ලෙස දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට උපදෙස් ලබාදීමට ක්‍රියා කර ඇත.

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් සහ ආයතන හඳුනා ගැනීමට පහසුවනු පිණිස කේත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දී ඒ අනුව කටයුතු සිදුකර අදාළ තොරතුරු යාවත්කාලීන කිරීමට ක්‍රියාකර ඇත.

නාමයෝජනා වලට අදාළ තොරතුරු මෙන්ම, ගෘහ දැන්වීම, ඡන්ද විමසීම් දැන්වීම, ඡන්දපොළේ ප්‍රදර්ශනය කරන දැන්වීම සහ තේරී පත්වන සභිකයන්ගේ තොරතුරු ගැසට් කිරීම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඒ අනුව ක්‍රියා කිරීම.

2.6 විශේෂ ව්‍යාපෘති

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සර්වජන ඡන්ද බලය සුරැකීමේ ක්‍රියාවලියට සෘජුව මෙන්ම වක්‍රව සම්බන්ධිත සර්වජන ඡන්ද බලයේ පදනම වූ සියලුම දෙනාට සමානව සැලකීමේ අවශ්‍යතාව පිළිබඳව පුරවැසියන් දැනුම්වත් කිරීමේ ව්‍යාපෘතියට උපයෝගී කරගත හැකි අන්තර්ජාතිකව සමරනු ලබන විශේෂ නම් කළ දින සැමරීමේ වැඩසටහන් 26 ක් පසුගිය වර්ෂ වලදී සිදුකරන ලදී.

2022 වසරේදී මෙම වැඩසටහන් 26 අතුරින් සෘජුවම සර්වජන ඡන්ද බලය සුරැකීමේ ක්‍රියාවලියට සම්බන්ධිත තෝරාගත් වැඩසටහන් 6 ක් පමණක් සැමරීම සුදුසු බවට යෝජනා විය.

මෙම වර්ෂයේදී මෙම විෂයයන්ට අදාළ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු මගින් ඉහත දින සැමරුම් සඳහා සංවිධානය කරනු ලබන උත්සව හෝ දැනුම්වත් කිරීමේ වැඩ සටහන්වලට සහාය වීමෙන් සහ අවශ්‍ය අවස්ථාවන් හිදී සම්පත්දායකත්වය ලබාදෙමින් ඉහත අරමුණු ඉටුකර ගැනීමට යෝජනා විය.

2.6.1 ඡන්ද හිමියන්ගේ දින සැමරුම

වයස අවුරුදු 18 සම්පූර්ණ කරන ලද තරුණ ප්‍රජා වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විගසම සඳහා පරිපූරක නාමලේඛනයක් හරහා ඡන්ද අයිතිය ලබාදීම සහ ජුනි මස 01 දිනට යෙදී තිබූ ඡන්ද හිමියන්ගේ දිනය පෙබරවාරි මස 01 දිනට යෙදීම යන කරුණු හේතුවෙන් ‘‘ඔබේ ඡන්දය රටේ අනාගතයයි’’ යන තේමාව ඔස්සේ ඡන්ද හිමියන්ගේ දින සැමරුම් උත්සවයක් අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා, මෙන්ම සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන්, යොවුන් පාර්ලිමේන්තු නියෝජිතයන්, අබාධිත සංවිධාන, කාන්තා සංවිධාන, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වල නියෝජිතයන් මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය නියෝජිතයන් ඇතුලු ආරාධිතයන් 400 ආසන්න සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් වූ උත්සවයක් 2022 මාර්තු මස 11 දින කොළඹ ගලධාරී හෝටලයේදී පවත්වන ලදී. මෙම උත්සවයේදී මැතිවරණ ක්‍රියාවලියට අදාළව යෝජිත මැතිවරණ නීති සංශෝධන පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ මතය සමාජගත කිරීමද සිදුකරන ලදී. මහජනතාවගේ ඡන්ද අයිතියට සෘජුව බලපාන කරුණු, වෙනස්කම් සහ යෝජිත සංශෝධන පිළිබඳව පුළුල් මහජන අවධානයක් ලබාගැනීම මෙම උත්සවය පැවැත්වීමේ ප්‍රමුඛ පරමාර්ථය වූ අතර එය ඉතා ඵලදායී ලෙස පැවැත්වීමට හැකිවීම මැතිවරණ කොමිෂන් සභාවට ඉතා වැදගත් කරුණකි.

2.6.2 අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දින සැමරුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති ජනතා පරමාධිපත්‍යයේ කේන්ද්‍රීය කොටසක් වූ ඡන්ද බලය නිදහස්ව හා සාධාරණව ප්‍රකාශ කිරීමට කටයුතු සැලැස්වීම මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යභාරය වන බැවින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා 2022 වර්ෂයේ අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දින සැමරුම මැතිවරණ ක්‍රමවේද පිළිබඳ අන්තර්ජාතික ආයතනයේ ද තාක්ෂණික සහයෝගයෙන් 2022 සැප්තැම්බර් මස 15 දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පවත්වන ලදී.

2.6.3 ආබාධ සහිත පුරවැසියන්

2.6.3.1 අන්තර්කරණ මැතිවරණ ක්‍රියාවලිය වෙනුන් මැතිවරණ කොමිෂන් සභාව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මයිරයිට් නියෝජිතයින් දැනුම්වත් කිරීම.

ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ (DOJF) ඉල්ලීම පරිදි මයිරයිට් නියෝජිතයින් කණ්ඩායම සමඟ අන්තර්කරණ මැතිවරණ ක්‍රියාවලියක් සඳහා මැතිවරණ කොමිෂන් සභාව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩ සහනක් ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාර ශාලාවේ දී 2022.01.19 පැවත්වන ලදි. මේ අවස්ථාවට ස්විඩන් නියෝජිත වරයික් සහ මයිරයට් ආයතනය දේශීය සම්බන්ධිකාරක, ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ නියෝජිතයන් කණ්ඩායම සහ මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන) ඇතුළු නිලධාරීන් සහභාගී වන ලදී. මැතිවරණ කොමිෂන් සභාව විසින් ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියට දායක කරගැනීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ බාහිර පාර්ශවයන් දැනුම්වත් වී තිබීම මෙමගින් අපේෂා කිරීම විශේෂත්වයකි.

2.6.3.2 ඡන්ද හිමියන්ගේ ලියාපදිංචිය පිළිබඳ දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් දැනුම්වත් කිරීම

ඡන්ද හිමියන්ගේ දිනය පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා මුද්‍රණය කරන ලද අත්පත්‍රිකාව බ්‍රේල් මාධ්‍යයෙන් පිටපත් 1000ක් මුද්‍රණය කරන ලදි. ඉන් පිටපත් 200 ක් දෘශ්‍යාබාධ සහිත ළමුන් අධ්‍යාපනය හදාරණ පාසල් 12ක් වෙත 2022.02.11 දින බෙදා දෙන ලදි. ඡන්ද හිමියන් ලියාපදිංචියේ ඇති වැදගත්කම පිළිබඳ පාසල් ළමුන් දැනුම්වත් වී තිබීම මෙහි අපේක්ෂිත ප්‍රතිඵලය විය.

2.6.3.3 මැතිවරණ රාජකාරී නියුතු නිලධාරීන් සඳහා සංඥා භාෂාව පිළිබඳ මූලික පුහුණුව ලබාදීම

ශ්‍රවණාබාධ සහිත තැනැත්තන් ඡන්ද මධ්‍යස්ථානයේ දී මැතිවරණ රාජකාරියේ නියුතු නිලධාරීන් සමඟ සංනිවේදන කටයුතු සිදු කිරීමට නොහැකි වීම නිසා සිදුවන අපහසුතාවය අවම කරගැනීම සඳහා නිලධාරියා සංඥා භාෂාව පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම.

දිස්ත්‍රික්කයට නිලධාරීන් කිහිපදෙනකු පුහුණු කර ඔවුන් හරහා දිස්ත්‍රික්ක මට්ටමින් නිලධාරීන් සඳහා මූලික පුහුණුව ලබාදීමට සැළසුම් කරන ලදි. මේ පිළිබඳ මූලික සාකච්ඡාවක් ශ්‍රී ලංකා බිහිරි වුවන්ගේ මධ්‍යම සම්මේලන (SLCFD) නියෝජිතයින් සමඟ 2022.02.22 දින පවත්වන ලදි. මින් අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ දිස්ත්‍රික්ක 25 තුළ සංඥා භාෂාව පිළිබඳ මූලික දැනුමක් ඇති පුහුණු නිලධාරීන් අවම වශයෙන් 50 හෝ පුහුණු කිරීම.

2.6.3.4 ඡන්ද හිමියන්ගේ දිනය සැමරීමේ ජාතික උත්සවය සඳහා සහභාගී වීම

මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද ඡන්ද හිමියන්ගේ දින සැමරුම් ජාතික උත්සවය සඳහා විවිධ ආබාධිත වර්ග අනුව නියෝජිතයින් සහ DIESL- TWG සාමාජික සංවිධාන නියෝජිතයින් සහභාගී වන ලදි.

ඡන්ද හිමියන්ගේ දිනය පිළිබඳ දැනුම්වත් වී තිබීම සහ ජාතික මට්ටමේ වැඩසටහන් විධානය කිරීමේදී සියලු ම ප්‍රජාවන් ඇතුළත් කරගැනීම මෙහි ප්‍රධාන අරමුණ වූ අතර, මේ සම්බන්ධයෙන් 2022.03.11 දින ගලධාරී හෝටලයෙහි පැවති උත්සවය සඳහා ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජනය කරමින් 19 දෙනකු සහභාගී වන ලදී.

2.6.3.5 ආබාධ සහිත ඡන්ද දායකයින් ඡන්දය සළකුණු කිරීමේ දී මුහුණපාන ගැටලු සඳහා කෙටි කාලීන විසඳුම් යෝජනාවලිය සකස් කිරීම

පැෆරල් සංවිධානය විසින් සංවිධානය කළ මෙම වැඩසටහන 2022.03.31 දින බොරලැස්ගමුව හෙල්ප්එජ් ආයතනයේ දී පවත්වන ලදි. මෙම අවස්ථාවට ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජිතයින් සහභාගී වූ අතර ප්‍රායෝගිකව කඩිනමින් ක්‍රියාත්මක කළ හැකි යෝජනා සාකච්ඡා කරන ලදි. මෙම

යෝජනා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා පැෆරල් සංවිධානය විසින් සැලසුම් කර ඇත. මේ අවස්ථාවට මැතිවරණ කොමසාරිස් ජනරාල් වරයා සහභාගී වන ලදි.

2.6.3.6 ආබාධ සහිත තැනැත්තන් මුහුණපාන ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් පිළිබඳ සාකච්ඡා කිරීම.

පැෆරල් සංවිධානය විසින් සැලසුම් කරන ලද මෙම වැඩසටහන තුළ ඡන්දහිමියන් ලියාපදිංචිය කිරීම සහ භෞතික ප්‍රවේශ පහසුකම් පිළිබඳ 2022 ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ දී ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් කර ගැනීමට නිරීක්ෂණ සංවිධාන දැනුම්වත් කිරීම, ඡන්ද මධ්‍යස්ථානවල දී ආබාධ සහිත තැනැත්තන් හඳුනාගැනීමේ කාඩ්පතක් ලබාදීම 2022.04.06 පිළිබඳ සාකච්ඡාවක් සිවිල් සංවිධාන ක්‍රියාකාරිකයින් සහ මැතිවරණ කොමසාරිස් ජනරාල්, අතිරේක මැතිවරණ කොමසාරිස් (පලාත් පාලන) සහ ජාතික මැතිවරණ සමග සාකච්ඡාවක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.

2.6.3.7 ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු හඳුනාගැනීම.

පැෆරල් සංවිධානය විසින් සැලසුම් කරන ලද මහනුවර, මාතලේ, කැගල්ල, කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්කවල ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු සහ විකල්ප යෝජනා පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා මෙන්ම ආබාධ සහිත තැනැත්තන් මුහුණපාන ගැටලු හඳුනාගැනීම සහ විකල්ප විසඳුම් හඳුනාගැනීම සඳහා සාකච්ඡාවක් 2022.05.05 දින ආබාධ සහිත පුද්ගලයින් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මහනුවර සර්වෝදය ආයතනයේදී පවත්වන ලදී.

2.6.3.8 දිස්ත්‍රික් මැතිවරණ සහකාර කොමසාරිස්වරුන් සහ නව කාර්යය මණ්ඩලය ආබාධ සහිත තැනැත්තන් පිලිබඳ සංවේදී කිරීම.

IFES සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමිෂන් සභාවේ නව කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන තුළ ආබාධ සහිත තැනැත්තන් ඡන්ද මධ්‍යස්ථානයේ දී මුහුණපාන ගැටලු පිලිබඳ සංවේදී කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානයක ආකෘතිය සකස් කර එහි අත්දැකීම් ලබා දීම මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය ආබාධ සහිත තැනැත්තන්ගේ පොදු ගැටලු පිළිබඳ සංවේදීවීම සහ එකී ගැටලු විසඳාලීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක 2022.05.26 දින දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් සහ අනෙකුත් විෂයභාර කාර්යය මණ්ඩල නිලධාරීන් සමග සාකච්ඡාවක් කොළඹදී පවත්වන ලදී.

2.6.3.9 ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියට දායක කරගැනීමේ දී මුහුණපාන ගැටලු විසඳාගැනීම සඳහා දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ දායකත්වය ලබා ගැනීම.

පැෆරල් සංවිධානය විසින් සැලසුම් කරන ලද දේශපාලන පක්ෂ නියෝජිතයින් සහ සිවිල් සංවිධාන ක්‍රියාකාරිකයින් ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියට සෘජුවම දායක කරගැනීම පිලිබඳව සහ සංවේදී කිරීම, ඔවුන්ගේ ගැටලු සඳහා දේශපාලන පක්ෂ තුළින් අවස්ථාවන් ලබාදීම පිළිබඳව දැනුම්වත් කිරීම් සිදුකරන ලදී. දැනට ලියාපදිංචි දේශපාලන පක්ෂ තුළින් ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු විසඳාලීම සඳහා අවශ්‍ය සංවේදීකරණය සිදු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් 2022.06.17 දින මැතිවරණ කොමිෂන් සභාවේදී මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා, කොමසාරිස් ජනරාල්වරයා දේශපාලන පක්ෂ නියෝජිතයින්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සහ ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජිතයින් සමග පවත්වන ලදී.

2.6.3.10 ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ නියෝජිතයින්ගේ යෝජනා සාකච්ඡා කිරීම

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු සාමාජිකයින් සියලු දෙනා සමග ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ හි නියෝජිතයින්ගේ හමුවක් මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්විය. ඒ සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ඇතුළු අදාළ විෂය භාර නිලධාරීන් ද සහභාගී වන ලදී. එහිදී ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජිතයින්ගේ යෝජනා හා අදහස් කෙරෙහි අවධානය යොමු

කරමින් ඉදිරි වැඩකටයුතු පිළිබඳව 2022.08.08 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී සාකච්ඡා කරන ලදි. ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජිතයින්ගේ යෝජනා හා අදහස් කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීම මෙහි අරමුණ වූ අතර ඒ සඳහා ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ නියෝජනය කරමින් 07 දෙනකු සහභාගී විය.

2.6.3.11 ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගල ප්‍රජාව මැතිවරණ ක්‍රියාවලියේ සක්‍රීය පාර්ශවකරුවන් කර ගැනීම උදෙසා අපයුක්ත අනන්‍යතාව තහවුරු කිරීම හා සබැඳි අභියෝග පිළිබඳ ව විමසීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම

මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා, ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ නියෝජිතයින්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මැතිවරණ 2022.08.18 දින කොල්ලුපිටිය, මැන්ඩරීනා හෝටලයේදී සාකච්ඡාවක් පැවති අතර එහිදී එම ක්‍රියාවලියට ඇතුළත් වීමට ඇති බාධාවන් පිළිබඳ මංජුල ගජනායක මහතා විසින් සිදුකරන ලද අධ්‍යනය වාර්තාව එළිදැක්වීම සිදු කරන ලදි. මේ සඳහා පැෆරල් සංවිධානය පූර්ණ අනුග්‍රහකත්වයෙන් සිදු කරන ලද අතර, ආබාධ සහිත තැනැත්තන් මුහුණපාන අභියෝග පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ අධානය යොමු කිරීම සහ ඒ සඳහා ඉදිරි වැඩසටහන් සකස් කිරීමට යෝජනා විය.

2.6.3.12 ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්ටෙන්සිල් රාමුව වැඩිදියුණු කිරීම සඳහා දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීම සහ ප්‍රජාතන්ත්‍රවාදය හා සර්වජන ඡන්ද බලය පිළිබඳ දැනුම්වත් කිරීම.

නැගෙනහිර පළාතේ මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල සහ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සහභාගී කර ගනිමින් ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා මඟපෙන්වන ස්ටෙන්සිල් රාමුව භාවිත කර ඡන්දය සළකුණු කිරීම සඳහා පෙරහුරු ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධ වැඩ සටහනක් 2022.08.30 දින පාසිකුඩා හි දී දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් 54 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ද, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා, සාමාජික මහත්ම මහත්මීන් සහ මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද, ශ්‍රී ලංකාවේ අන්තර්කරණ මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ තාක්ෂණික කමිටු කැඳවුම්කරු සහ මැතිවරණ පද්ධති සඳහා වූ ජාත්‍යන්තර පදනමේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මෙන්ම සම්පත්දායකත්වයෙන් මෙම වැඩසටහන පත්වන ලදි. ඡන්ද ප්‍රතිකාව සලකුණු කිරීම සඳහා මඟපෙන්වන ස්ටෙන්සිල් රාමුව වැඩිදියුණු කිරීම සඳහා යෝජනා හා අදහස් ලබාගැනීම සහ ප්‍රජාතන්තවාදය සහ සර්වජන ඡන්ද බලය පිළිබඳ දැනුම්වත් වී තිබීම මින් බලාපොරොත්තු විය.

2.6.3.13 මැතිවරණ ක්‍රියාවලිය තුළ ආබාධ සහිත තැනැත්තන්ට හිතකර මාධ්‍ය භාවිතාවක් සඳහා ජනමාධ්‍යවේදීන් සංවේදී කිරීම

මැතිවරණ සඳහා වූ ජාත්‍යන්තර පදනම, ශ්‍රී ලංකාවේ අන්තර්කරණ මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ ජාත්‍යන්තර පදනම හා මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනමාධ්‍ය වේදීන් සංවේදීකරණ වැඩසටහනක් 2022.09.16 දින කොල්ලුපිටියේදී ජනමාධ්‍ය වේදීන් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විය. මේ සඳහා ආදර්ශ ඡන්ද පොළක් ඇසුරින් ආබාධ සහිත තැනැත්තන් ඡන්ද පොළ තුළ දී මුහුණපාන ගැටලු පිළිබඳ අත්දැකීම් හුවමාර කර ගැනීමට අවස්ථාව උදාවිය.

2.6.3.14 බුද්ධි වර්ධන ඌනතා සහිත තැනැත්තන් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම.

කෑගල්ල දිස්ත්‍රික්කයේ, කොටගල බුද්ධි වර්ධන වූණතා සහිත තැනැත්තන් නේවාසිකව ස්ථානයේ රැදි සිටින තැනැත්තන් 60 දෙනකු සඳහා ඡන්ද මධ්‍යස්ථානයක ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම සහ ප්‍රායෝගික පුහුණුවක් 2022.10.13 පවත්වන ලදී.

මේ අවස්ථාවට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා, කොමසාරිස් ජනරාල්වරයා, කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයා ඇතුළු රාජ්‍ය නිලධරයන් මෙන්ම මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ ජාත්‍යන්තර ආයතනයේ නියෝජිතවරුන් මෙන්ම ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජිතයින් ද සහභාගී වන ලදි. ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය IFES ආයතනය විසින් දරන ලදි.

2.6.3.15 2022 - 2025 උපායමාර්ග සැලැස්ම ක්‍රියාත්මක කර ගැනීම පිළිබඳ ව පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීම.

2023 වර්ෂයේ ආබාධ සහිත ඡන්ද දායකයින් සම්බන්ධ සැලසුම් කර ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාවක් 2022.11.16 වන දින මැතිවරණ මහලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කර ගැනීම සඳහා සහයෝගීත්වය ඇති කර ගැනීම පිළිබඳ මෙහිදී සාකච්ඡා කළ අතර ආබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජනය කරමින් 10 දෙනකු පමණ සහභාගී විය.

2.6.3.16 ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය අන්තර්කරණය පිළිබඳ සංවාදය, මැතිවරණ අන්තර්කරණය සබැඳි කෘතිය ජනගත කිරීම සහ වාර්තා විඩියෝපටය එළිදැක්වීම.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල නියෝජනය කරමින් සහභාගී වන නියෝජ්‍ය/ සහකාර මැතිවරණ අන්තර්කරණ මැතිවරණ ක්‍රියාවලියක් පිළිබඳ සංවේදී කිරීම සහ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා ආබාධ සහිත පුද්ගල සංවිධාන ඒකාබද්ධ පෙරමුණ සමඟ සිදු කරන ලදි. ඒකාබද්ධ පෙරමුණ විසින් සකස් කරන ලද පර්යේෂණ ග්‍රන්ථය සහ විඩියෝපටය එළිදැක්වීම සිදු කරන ලදි. මෙය ශ්‍රී ජයවර්ධනපුර Monarch Imperial Hotel හි දී පැවැත් වූ අතර මේ සඳහා 50 කට ආසන්න පිරිසක් සහභාගී විය.

2.6.4. වැඩසටහන් සම්බන්ධීකරණය

විශේෂ ව්‍යාපෘති යටතේ ගැනෙන වැඩසටහන් පළාත් පාලන අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

2.6.5. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පළාත් පාලන ශාඛාවේ විශේෂ ව්‍යාපෘති යටතේ සියලු මැතිවරණ පාර්ශ්වකරුවන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

2.6.6. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවට ඇති වගකීම

මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම අනුව සර්ව ජන ඡන්ද බලය සුරකින දේශයක් උදෙසා ආන්තිකරණයට ලක් වූ ඇති ප්‍රජාව ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලියක් සහතික කිරීම සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය අනෙකුත් අය හා සමඟ සමාන හා සාධාරණ පදනමකින් භුක්තිවිඳීමට ඇති අයිතිය තහවුරු කිරීම සිදුකළ යුතු අතර, ඊට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් සිටියි.

2.6.7. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය වෙනුවෙන් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

මැතිවරණ කොමිෂන් සභාවේ සිවු අවුරුදු උපාය මාර්ගික සැලසුම අනුව පළාත් පාලන අංශයේ කටයුතු සහ අදාළ වාර්තා සකස් කිරීම.

ආබාධ සහිත පුද්ගලයින් ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලිය සඳහා ඇති නෛතික බාධක ඉවත් කිරීමට අදාළ නීති ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා ලබාදීම.

සියලුම මැතිවරණ සහ ඡන්ද විමසීම් වලදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්දපොළ වෙත යන ආබාධිත ඡන්දභිමියන් සම්බන්ධයෙන් විශේෂ පහසුකම් සැපයීමට අදාළ කටයුතු.

ඡන්දය දීමේ ක්‍රියා පටිපාටි, පහසුකම් හා උපකරණ තේරුම් ගැනීමට හා භාවිත කිරීමට සුදුසු, ලබාගත හැකි හා පහසු බව තහවුරු කිරීම.

ආබාධ සහිත පුද්ගලයන්ට ඡන්දය දීමට හා තේරී පත්වීමට ඇති අයිතිය, නිදහස් සහ රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි අන් අය හා සමාන පදනමකින් ඵලදායීව හා පූර්ණ වශයෙන් සහභාගීවීම තහවුරු කිරීම.

ඡන්ද දායකයන් ලෙස ආබාධ සහිත පුද්ගලයින්ගේ කැමැත්ත නිදහසේ ප්‍රකාශ කිරීම සහතික කිරීම හා අවශ්‍ය තැන්හි ඒ සඳහා ඔවුන්ගේ ඉල්ලීම අනුව ඔවුන් විසින්ම තෝරා ගන්නා පුද්ගලයෙකු මාර්ගයෙන් ඡන්දය දීමට ආධාර දීමට ඉඩදීම.

මැතිවරණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පළාත් පාලන අංශයේ රාජකාරී සහ අදාළ වාර්තා සකස් කිරීම.

ආබාධිත ඡන්ද හිමියන් සම්බන්ධීකරණය කිරීම හා ආබාධිත ඡන්ද හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

2.6.8. වසංගත තත්ත්වය නිසා මුහුණු පෑ අභියෝග

2022 වර්ෂයේදී ද, කෝවිඩ් වසංගත තත්ත්වය, රටේ ආර්ථික තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ගැටළු සහගත විය.

2.6.9. කාන්තා, තරුණ, සමාජ මාධ්‍ය හා අන්තර්ජාතික දින සැමරුම් වැඩසටහන්

2022 වර්ෂයේ මාර්තු මස 08 දිනට යෙදුනු ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංග පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් දේශපාලනයේ නිරත කාන්තාවන් / ප්‍රජාමූල සංවිධාන සාමාජිකාවන් / රජයේ නිලධරයන් පහත පරිදි දැනුම්වත් කර ඇත.

දිස්ත්‍රික්කය	සහභාගී වූ සංඛ්‍යාව
මාතලේ	50
වවුනියාව	30
මුලතිව්	25
අම්පාර	55
පුත්තලම	20
පොළොන්නරුව	136
කෑගල්ල	30

“වෙනසකට මහක්” තේමාව ඔස්සේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කාන්තා සිවිල් ක්‍රියාකාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් දෙකක් සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලදී. කාන්තා සිවිල් ක්‍රියාකාරීන් 66 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිංහල මාධ්‍යයෙන් 2022.07.22 දින ද, කාන්තා සිවිල් ක්‍රියාකාරීන් 44 දෙනෙකුගේ සහභාගීත්වයෙන් දෙමළ මාධ්‍යයෙන් 2022.07.29 දින ද වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් පැෆරල් සංවිධානය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලද අතර මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා ප්‍රමුඛත්වයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

2.7. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කොට ප්‍රගති වාර්තා සකස් කිරීම හා එම වාර්තා මුදල් අමාත්‍යාංශයට යොමු කිරීම.

2.8. උපායමාර්ගික සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාව සඳහා සිවු අවුරුදු (2022 – 2025) දක්වා වූ කාල සීමාව සඳහා වූ දෙවන උපායමාර්ගික සැලැස්ම සකස් කරන ලද අතර, එහි දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට ඇත.



2.9. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු

වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විගස යෞවන යෞවනියන්ට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීමට හැකිවන පරිදි සම්මත වූ නව නීති සංශෝධනය ප්‍රධාන කොට "ඔබේ ඡන්දය රටේ අනාගතයයි" යනුවෙන් 2022.02.01 වන දින කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සංවිධානය කරනු ලැබූ වාර්ෂික ඡන්දහිමි දින සැමරුමට පුළුල් ප්‍රචාරයක් ලබාදීම සඳහා සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන්/ ප්‍රධාන කර්තෘවරුන්/ ප්‍රවෘත්ති සංස්කාරකවරුන් ඇතුළු මාධ්‍යවේදීන් සහභාගි කරගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරනු ලැබූ 2022 වාර්ෂික ඡන්දහිමි දින සැමරුම් උත්සව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම් වස් කොමිෂන් සභාවේ සභාපති ඇතුළු නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, දෙරණ රූපවාහිනී ආයතනය, හිරු රූපවාහිනී ආයතනය, ස්වර්ණවාහිනී රූපවාහිනී ආයතනය, සිරස රූපවාහිනී ආයතනය යන ආයතනවල සහාය ලබාගන්නා ලදී.

රටේ පවත්නා වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව දරන අදහස් හා ඒ සම්බන්ධව කරනු ලබන යෝජනා හා ක්‍රියාමාර්ග පිළිබඳව සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් දැනුම්වත් කිරීමේ මාධ්‍ය සාකච්ඡාවක් 2022.06.09 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

2022.08.12 දිනට යෙදුණු ජාත්‍යන්තර තරුණ දිනය නිමිත්තෙන්, මැතිවරණ කොමිෂන් සභාව විසින් මෑතක දී සම්මත කරන ලද වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විගස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට අවස්ථාව සැලසීමේ පනත හා එහි වැදගත්කම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ පණිවුඩය පැය ½ක වත් වැඩසටහනක් සියළුම විද්‍යුත් නාලිකා මගින් 2022.08.12 දින ජනගත කිරීමට අවස්ථාව සැලසීම.

මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ කාලය තුළ මතු දැක්වෙන ප්‍රධාන කරුණු අරබයා මාධ්‍ය නිවේදන 20 ක් නිකුත් කර ඇත.

i. මැතිවරණ කොමිෂන් සභාවේ තීරණ දැනුම් දීම.
ii. 2021 වසරේ සහතික කරන ලද ඡන්දහිමි නාමලේඛනය අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත්කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වැනි ව්‍යවස්ථාවේ (8) වැනි අනු ව්‍යවස්ථාව අනුව ගැසට් මගින් නිවේදනය කිරීම.
iii. මැතිවරණ කොමිෂන් සභාව සහ පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සමඟ 2022 ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් වූ සාකච්ඡාවක් 2022.02.23 මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්වෙන බව හා ඉදිරියේ දී පැවැත්වෙන ඡන්ද විමසීම්වල දී මැතිවරණ නීතිය, පරිපාටික නීතිය, විධාන හා උපමාන භාවිතා කිරීමේ දී මෙතෙක් මතු වූ අවභිරතා මගහැර නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ නීතිය දායක කරගන්නා ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්. මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකවල නිලධාරීන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීමට තීරණය කර ඇති බව දැනුම් දීම.
iv. මැතිවරණ කොමිෂන් සභාව සහ පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සමඟ පැවති රැස්වීමේ දී සාකච්ඡා කළ කරුණු දැනුම් දීම.
v. මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරනු ලබන 2022 වර්ෂයේ ඡන්ද හිමියන්ගේ දින ජාතික උත්සවය 2022.03.11 දින පැවැත්වෙන බව දැනුම් දීම.
vi. රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව, එම තත්ත්වය සමනය සඳහා වූ මැතිවරණ කොමිෂන් සභාවේ ස්ථාවරය ප්‍රකාශ කිරීම.
vii. 2022 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම.
viii. 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම.

viii. මැතිවරණ නීති සංශෝධන පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව, දේශපාලන පක්ෂ පිළිගැනීම, ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ දැනුම් දීම.
ix. පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2022.08.08 දින පැවැති රැස්වීමේ දී සාකච්ඡා කළ කරුණු හා එළඹී තීරණ පිළිබඳව දැනුම් දීම.

2.10. ලේඛනාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ ලේඛනාගාරයේ කාර්යයන් නව පරිශ්‍රයක ස්ථාපිත කොට වඩාත් සංවිධිත අයුරින් පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇත. එහි ඇති ලිපි ලේඛන වඩාත් සුරක්ෂිත කර ගැනීම හා ඒවා අවශ්‍ය වන පරිදි ඕනෑම පාර්ශ්වයකට පහසු පරිශීලනය කිරීම සඳහා නිසි පරිදි ගබඩා කර තබා ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී.

මෙම කාර්යය සඳහා පූර්ණ කාලීනව නිලධාරියකු අනුයුක්ත කර ඇත. ලේඛනාගාර කටයුතු පිළිබඳ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් මෙම නිලධාරියාට විධිමත් පුහුණුවක් ලබා දී ඇති අතර එමගින් ලේඛනාගාරයේ සේවාවන් වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට ක්‍රියා කර ඇත.

2.11. දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුකාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් පිළිබඳව හා තොරතුරු ලබාගැනීම සඳහා විද්‍යාර්ථීන්, පර්යේෂකයින්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින් විසින් නිරන්තරයෙන් විමසීම් කරනු ලබන අතර, බොහෝ අවස්ථාවල දී කොමිෂන් සභාව වෙත පැමිණ තොරතුරු ලබාගැනීම සිදුකරනු ලබයි. එබැවින් මෙම කාර්යයන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත

කර ඇති අතර. තොරතුරු අවශ්‍ය තැනැත්තන්ට මෙම ඒකකයට පැමිණ ඔවුනට අදාළ තොරතුරු ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

2.12. 2022 වසර තුළ එළි දක්වන ලද ප්‍රකාශන

2022 – 2025 සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්ම



මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදී. එහි කතිරයේ බලය පුවත් සඟරාවේ පස්වන වෙළුමේ තුන්වන කලාපය (සැප්තැම්බර් - දෙසැම්බර් 2021) සහ හයවන වෙළුම පළමු කලාපය (ජනවාරි - අප්‍රේල් 2022), හයවන වෙළුමේ දෙවන කලාපය (මැයි - සැප්තැම්බර් 2022) මුද්‍රණය කර ඇත.



2022.03.11 දින පවත්වන ලද 2022 වර්ෂයේ ඡන්ද හිමියන්ගේ දින ජාතික සැමරුම් උත්සවයට සමගාමීව සර්වජන ඡන්ද බලය, ජනතා පරමාධිපත්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ජනතාව තුළ පුළුල් අවබෝධයක් ඇතිකරලීම සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ හා තත් විෂය පිළිබඳ වෘත්තියවේදීන්ගේ ශාස්ත්‍රීය ලිපිවලින් සමන්විත "2022 ඡන්ද හිමියන්ගේ දිනය ජාතික සැමරුම් උත්සවය" නමින් ලිපි සංග්‍රහයක් මුද්‍රණය කොට ප්‍රකාශයට පත්කරන ලදී.



2020.08.05 දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව ත්‍රෛභාෂිකව මුද්‍රණය කරන ලද අතර, එම වාර්තාව 2022.05.04 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.



2015 ජනාධිපතිවරණය හා 2015 පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ගැසට් පත්‍ර තනි පොත් දෙකක් ලෙසින් සකස් කර මුද්‍රණය කිරීම.



2023 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ 2022 ප්‍රගති වාර්තාව සකස් කිරීම.



2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා දෙවන වසරේ පියසටහන් වාර්තාව සකස් කිරීම සිදු කරන ලදී.



2.13. නීති කටයුතු

2022 වර්ෂය තුළ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජික මහතුන් සහ මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් අලුතින් ගොනු කරන ලද නඩු කටයුතු 48 ක් මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

2.13.1 ශ්‍රේෂ්ඨාධිකරණය

ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු 16 ක් වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු අතරින් පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය සම්බන්ධ නඩු කටයුතු 09 ක් ද (නඩු අංක SC/FR/203/2022, SC/FR/207/2022, SC/Writ/04/2022, SC/FR/210/2022, SC/FR/206/2022, SC/FR/216/2022, SC/FR/217/2022, SC/FR/211/2022, SC/FR/215/2022), පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළ නඩු කටයුතු 03 ක් ද (නඩු අංක SC/Exp/01/2022, SC/Exp/02/2022, SC/Exp/03/2022), පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව නඩු කටයුතු 02ක් ද (නඩු අංක SC/Writ/06/2022, SC/Writ/06/2022), පළාත් පාලන ආයතන සභාපති ධුරය සම්බන්ධ නඩු කටයුතු 01 ක් ද (නඩු අංක SC/Writ/02/2022), දේශපාලන පක්ෂ ලියාපදිංචියට අදාළ නඩු කටයුතු 01 ක් ද (නඩු අංක SC/FR/247/2021) ගොනු කොට ඇත.

2.13.2 අභියාචනාධිකරණය

අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු 06 ක් ලැබී ඇති අතර, එම නඩු අතරින් පළාත් පාලන ආයතනවල සභාපති ධුරය සම්බන්ධ නඩු කටයුතු 04 ක් ද (නඩු අංක CA/Writ/52/2022, CA/Writ/24/2022, CA/Writ/11/2022, CA/Writ/182/2022) ඡන්දනිමි නාමලේඛනයට නම ඇතුළත් නොවීම සම්බන්ධ නඩු කටයුතු 01 ක් ද (නඩු අංක CA/Writ/255/2022) පුරවැසිභාවය පිළිබඳව නඩු කටයුතු 01 ක් ද (නඩු අංක CA/Writ/434/2022)ගොනු කොට ඇත.

2.13.3 මහාධිකරණය

මහාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු 09 ක් ලැබී ඇති අතර, එම නඩු අතරින් 07 ක් (නඩු අංක WP/HCCA/COL/LA/04/2022, WP/HCCA/COL/LA/05/2022, HC/NE/Writ/02/2022, WP/HCCA/COL/LA/127/2022, WP/HCCA/COLOMBO/175/22/LA, HC/NE/Writ/13/2022,

WP/HCCA/Mt./54/2021/LA) පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළ නඩු කටයුතු වන අතර, 02 ක් (නඩු අංක HC/NE/Writ/04/2022, HCW/04/2022) පළාත් පාලන ආයතනවල සභාපති ධුරය සම්බන්ධ නඩු කටයුත්තක් වේ.

2.13.4 දිසා අධිකරණය

දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 17 ක් වන අතර, එම නඩුවලින් 16ක් පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළව ගොනු කර ඇති නඩු වන අතර, 01ක් ඡන්දහිමි නාමලේඛනයෙන් නම ඉවත් කිරීමට විරුද්ධව ගොනු කර ඇති නඩු වේ. ඒවා නම්(නඩු අංක DSP/10/2022-කොළඹ, DSP/11/2022-කොළඹ, DSP/25/2022– කොළඹ, SPL/31/2022- යාපනය, SPL/373/2022-මොරටුව, DSP/161/2022-කොළඹ, DSP/162/2022-කොළඹ, DSP/156/2022-කොළඹ, DSP/147/2022-කොළඹ, DSP/436/2021-කොළඹ, DSP/441/2021-කොළඹ, DSP/107/2021-කොළඹ, DSP/442/2021-කොළඹ, DSP/435/2021-කොළඹ, SPL/04/2022-මතුගම,DSP/458/2022-කොළඹ,1546/ 22/ විශේෂ-ගල්කිස්ස).

මීට පෙර වර්ෂවල දී ගොනු කරන ලද පෙත්සම්වලට අදාළව සංශෝධිත පෙත්සම් 01 ක් ද මෙම වර්ෂයේ දී ගොනු කරන ලද පෙත්සම්වලට අදාළව සංශෝධිත පෙත්සම් 06 ක් ද මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇත. ඉහත සියළු නඩු කටයුතු සහ සංශෝධිත පෙත්සම්වලට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජික මහතුන් ද, තේරීම්භාර නිලධාරීන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එමෙන්ම ඉහත නඩු කටයුතුවලට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ ද නඩු කටයුතු 32 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

මැතිවරණ නීති කඩකිරීම සම්බන්ධව මාතර පොලීසිය විසින් මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන ලද අංක 47057 දරන නඩුව සඳහා නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිටින බැවින් කොමිෂන් සභාව වෙනුවෙන් සාක්ෂි මෙහෙයවීම සඳහා මාතර පෞද්ගලික නීතිඥයෙකුගේ සහාය ලබාගන්නා ලදී.

2022 වර්ෂයේ ගොනු කරන ලද නඩු අතරින් නඩු කටයුතු 09 ක් (නඩු අංක SC/FR/203/2022, SC/FR/207/2022, SC/Writ/04/2022, SC/FR/210/2022, SC/FR/206/2022, WP/HCCA/COL/LA/04/2022, WP/HCCA/COL/LA/05/2022, HC/NE/Writ/04/2022, DSP/11/2022(Colombo) මේ වන විට අවසන්ව ඇති බව හා පෙර වර්ෂවලට අදාළ නඩු කටයුතු 17 ක් (නඩු අංක SC/Exp/03/2019, SC/FR/440/2019, SC/FR/200/2021, DSP/05/2021, MIS/168/2018, MIS/167/2018, CA/Exp/01/2019, CA/Exp/01/2020, DSP/13/2020, CA/Writ/242/2021, CA/Exp/01/2020, DSP/88/2021, SC/Writ/09/2022, SC/SPL/228/2021/LA, SC/FR/440/2019, SC/Writ/03/2021, DSP/07/2021) අවසන් වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

2.13.5 නීතිපති උපදෙස් විමසීම්

මීට අමතරව විවිධ නෛතික තත්ත්ව පිළිබඳ නීතිපති උපදෙස් විමසීම් 08 ක් යොමු කර ඇත. එමෙන්ම ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ජාතික මැතිවරණ අංශය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් ලැබෙන ලිපි සඳහා නීති උපදෙස් ලබා දීම ද සිදු කරන ලදී. එවැනි නීති උපදෙස් 40 ක් ලබා දී ඇත. මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලැබුණු පැමිණිලි 05 ක් සඳහා අදාළ පාර්ශ්ව වෙතින් තොරතුරු විමසීම් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට සිදු කර ඇත.

2.13.6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන සහ බී.සී පත්‍රිකා අපහරණය

එමෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන 04 ක් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම ද සිදු කර ඇත. පසුගිය ඡන්ද විමසීම්වලට අදාළව ලේඛන අපහරණය කිරීම සහ

බී.සී. පත්‍රිකා අපහරණය කිරීම සම්බන්ධව උපදෙස් විමසමින් ලැබෙන ලිපි සඳහා උපදෙස් ලබා දීම සිදු කරන ලදී. එවැනි උපදෙස් ලබා දීම් 18 ක් සිදු කර ඇත. එමෙන්ම දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණවල විභාග වන නඩු කටයුතු සඳහා සාක්ෂි ලබා දීම සම්බන්ධ සිතාසි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත යොමු කිරීම සහ ඊට අදාළ උපදෙස් ලබා දීම් 18 ක් සිදු කර ඇත.

2.14. මැතිවරණ නීති සංශෝධන

මැතිවරණ නීති සංශෝධන කටයුතුවලට අදාළව මැතිවරණ වියදම් පාලනය සඳහා වන පනත් කෙටුම්පත ගරු නීතිපතිතුමාගේ නිරීක්ෂණයෙන් පසුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර, එය කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට සහ පනත් කෙටුම්පතක් ලෙස භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මේ වන විට කැබිනට් පත්‍රිකාවක් මගින් ගරු ජනාධිපතිතුමා වෙත යොමු කර ඇත.

2.14.1. මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ යෝජනා

මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ යෝජනා කඩිනමින් නීතිගත කිරීම සඳහා අවශ්‍ය සමාජ පසුබිම සකස් කිරීම හා ඒ පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ හා මැතිවරණ අධ්‍යයන ආයතනය (IRES) සහ මැතිවරණ පද්ධති සඳහා වන ජාත්‍යන්තර පදනම (IFES) ආයතනවල අනුග්‍රාහකත්වය ඇතිව දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලද අතර ඒ පිළිබඳ තොරතුරු සටහන 30 ලෙස ඇතුළත් කර ඇත.

2.15 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

2022.01.01 දින සිට 2022.12.31දක්වා කාලය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළව විමසීම් කරන ලද තොරතුරු ඉල්ලීම් 74කින් 65ක් සඳහා තොරතුරු ලබා දී ඇති අතර, තොරතුරු ඉල්ලීම් 03ක් ප්‍රතික්ෂේප කර ඇත. තොරතුරු ඉල්ලීම් 06 ක් සඳහා තොරතුරු ලබා දී නොමැත.

2.16 දේශපාලන පක්ෂ

2.16.1. දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම හා ඉල්ලුම්පත් කැඳවීම

රටක පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගැනීමට මෙන්ම එකී නියෝජිතයන් දේශපාලන පරිසරයට අනුගත කිරීමට දේශපාලන පක්ෂ ක්‍රමය සිදුකරන්නේ විශාල කාර්ය භාරයකි. එම නිසා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ දේශපාලන පක්ෂවල භූමිකාව ඉතා වැදගත් වේ. දේශපාලන පක්ෂයක් යනු කිසියම් ප්‍රතිපත්තියක් මත රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා උත්සාහ කරන දේශපාලන සංවිධානයකි. මෙම දේශපාලන ක්‍රියාකාරී සංවිධාන මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමේ නෛතික විධිවිධාන 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ හත්වන වගන්තියේ දක්වා ඇත.

ඒ අනුව, යම් දේශපාලන ක්‍රියාකාරී සංවිධානයක් මැතිවරණ කොමිෂන් සභාවේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට දන්වමින් සෑම වර්ෂයකම ජනවාරි මාසයේ 31 දිනට ප්‍රථම ප්‍රසිද්ධ දැන්වීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පළ කරනු ලැබේ. අදාළ ක්‍රියාකාරී සංවිධානය එම දැන්වීමේ සඳහන් නියමිත කාලය තුළ දී තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු අතර, මෙම ක්‍රියාවලිය කුමන හෝ මැතිවරණයක් සඳහා දින ප්‍රකාශ කර ඇත්නම්, එම මැතිවරණ කාල සීමාව අවසන් වන තෙක් අත් හිටුවනු ලැබේ.

දේශපාලන ක්‍රියාකාරී සංවිධානය පිළිගත් දේශපාලන පක්ෂ ලෙස පිළිගැනීමට මැතිවරණ කොමිෂන් සභාව වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එම අයදුම්පත සමග, මැතිවරණ කොමිෂන් සභාව විසින්

අනුමත කරන ලද ඡන්ද සලකුණු අතරින් තමන් තෝරා ගන්නා සලකුණක්, පක්ෂ ව්‍යවස්ථාව, අනිවාර්යයෙන්ම එක් කාන්තා නියෝජිතයෙක් හෝ ප්‍රධාන තනතුරකට ඇතුළත් කරන ලද පක්ෂ නිලධාරී ලැයිස්තුව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ, පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය යන තොරතුරු සමග මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දිනයට අවම වශයෙන් අවුරුදු හතරක කාලයකට පෙරාතුව අනිවාර්යයෙන් දේශපාලන කටයුතුවල නියැලී සිටි බවට හෝ අපේක්ෂකයන් දෙදෙනෙකු අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකු එම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බව හෝ විවිධ පළාත් සභා පහකට නම් කරන ලද අවම වශයෙන් අපේක්ෂකයන් පස් දෙනෙකු අතරින් තිදෙනෙකු මෙම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පළාත් සභා මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බව යන තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු ය.

මේ පිළිබඳව සම්පූර්ණ තොරතුරු ඇතුළත් කොට 1987 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උප වගන්තිය යටතේ වූ නිවේදනයක් අංක 2263/23 හා 200.01.21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලදී. 1987 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ කාර්යයන් සඳහා දේශපාලන පක්ෂ සඳහා අනුමත ලකුණු අංක 2263/24 හා 2022.01.21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අතර එයට අංක 2267/2 හා 2022.02.14 දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනයක් සිදුකර ඇත.

2022 වර්ෂයට දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත් කැඳවීම 2022.01.24 දිනයෙන් ආරම්භ වී 2022.02.25 දිනෙන් අවසන් වූ අතර, 2022 වර්ෂය සඳහා ලියාපදිංචිය සඳහා දේශපාලන සංවිධාන 80ක් විසින් අයදුම්පත් භාරදෙන ලදී. ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු මතු දැක්වේ.

- ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව - 80
- ප්‍රමාද වී භාරදීම මත ප්‍රතික්ෂේප වූ සංඛ්‍යාව - 04
- මූලික කරුණු සම්පූර්ණ නොවීම මත ප්‍රතික්ෂේප වූ සංඛ්‍යාව - 34
- ඉල්ලා අස් කරගත් සංඛ්‍යාව - 03
- සම්මුඛ පරීක්ෂණ පළමු අදියර සඳහා තෝරාගත් සංඛ්‍යාව - 39
- සම්මුඛ පරීක්ෂණ පළමු අදියරෙන් පසු ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව - 26
- සම්මුඛ පරීක්ෂණ දෙවන අදියර සඳහා තෝරාගත් සංඛ්‍යාව - 13
- සම්මුඛ පරීක්ෂණ දෙවන අදියරෙන් පසු ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව - 06
- 2022 වර්ෂය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව - 07

2022 වර්ෂයේ දේශපාලන පක්ෂ පිළිගැනීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇති අතර, 2022 වර්ෂය සඳහා දේශපාලන පක්ෂ 07ක් පිළිගැනීමට කටයුතු කර ඇත. මෙම දේශපාලන පක්ෂ පිළිගැනීමට පෙර මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබූ දේශපාලන පක්ෂ සංඛ්‍යාව 79කි. ඒ පිළිබඳව තොරතුරු අංක 2263/22 හා 2022 ජනවාරි 21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතර මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ www.elections.gov.lkද පළ කොට ඇත.

එමෙන්ම, සියලු පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව අංක 2312/31 හා 2022.12.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම තොරතුරු ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

2.16.2. දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ පවත්වන ලද සාකච්ඡා

ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය, දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වය, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා දේශපාලන පක්ෂවල නිලධාරීන් හා ක්‍රියාකාරීන්ගේ සහාය ලබාගැනීම, මාධ්‍ය උපමාන හා ආචාරධර්ම පිළිබඳව, දේශපාලන පක්ෂ ලියාපදිංචිය හා වාර්ෂික වාර්තා ලබාදීම,

පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීම, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධව හා මැතිවරණ නීති සංශෝධනය කිරීම පිණිස පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳව පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්/ නිත්‍ය නියෝජිතවරුන්ගේ එකඟතා ලබාගැනීම සඳහා සමාලෝචිත කාල සීමාව තුළ එනම් 2022.02.23, 2022.06.06, 2022.08.08 හා 2022.08.23 දිනවල මැතිවරණ කොමිෂන් සභාවේ දී සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡා සඳහා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන්ට ද ආරාධනා කර තිබුණි.

2.17 මැතිවරණ ආරවුල් නිරාකරණය

මැතිවරණ ආරවුල් නිරාකරණය පිළිබඳ ක්‍රමවේද හා ඉදිරි ඡන්ද විමසීම්වල දී මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳව මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකවලට අනුයුක්ත කිරීමට අපේක්ෂිත සිවිල් නිලධාරීන්, රාජ්‍ය නිවේදිත පොලිස් නිලධාරීන්, පොලිස් ස්ථානාධිපතිවරු හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු 15 ක් පවත්වන ලද අතර ඒ පිළිබඳ තොරතුරු සටහන 31 හි ඇතුළත් කර ඇත.

මෙම වැඩමුළු සඳහා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV), මැතිවරණ ක්‍රමවේදය සඳහා වූ ජාත්‍යන්තර පදනම (IFES) හා නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFERAL) යන ආයතන අනුග්‍රහය දක්වන ලදී. එයට අමතරව මෙම වර්ෂය අවසාන වීමට පෙර කළුතර හා කොළඹ දිස්ත්‍රික් වැඩමුළු ද අනුග්‍රාහක ආයතනයක ප්‍රතිපාදන යටතේ පැවැත්වීමට අපේක්ෂා කරන ලද නමුත් පැවති අයහපත් ආර්ථික තත්ත්වය යටතේ ඒ සඳහා අනුග්‍රහ කිරීමට ආයතනයක් සම්බන්ධ කරගැනීමට නොහැකි වීම මත වැඩසටහන් පැවැත්වීම අඩාලව කල්තැබීමට සිදුවිය.

2.18 වාහන පාලනය

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් වාහන වලින් වසර 05 ක් සම්පූර්ණ වීම මත 2022 වර්ෂය තුළ මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරා ගන්නා ලද වාහන සංඛ්‍යාව 11 ක් වේ.

මන්නාරම කාර්යාලය වෙත අනුයුක්ත කර තිබූ 253-0452 දරණ ටොයෝටා කැබ් රථය අළුත්වැඩියා කටයුතු සඳහා රු.ලක්ෂ 32 ක ඇස්තමේන්තුවක් නියෝජිත ආයතන වන ටොයෝටා ලංකා වෙතින් ඉදිරිපත් කර තිබුණි. එම ඇස්තමේන්තුව යාන්ත්‍රික ඉංජිනේරු වෙත ඉදිරිපත් කරන ලදී. මෙම කැබ් රථය දැනට වසර 24 ක පමණ කාලයක් ධාවනයේ යොදවා ඇති හෙයින් එතරම් මුදලක් ගෙවා අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින්, අපහරණයට යෝජිත විය.

එසේ වුව ද රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව වෙත මෙම රථය පවරා දෙන ලෙස ඉල්ලීමක් ලද අතර, ඒ අනුව 2022.09.16 දින එකී දෙපාර්තමේන්තුව වෙත මෙම රථය පවරා දෙන ලදී.

රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ වැඩි වාරික මුදලක් ගෙවීමට සිදුවීම නිසා භාවිතය වාසිදායක නොවන බැවින්, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබූ PI-2359 හා PI-2360 යන කැබ් රථ දෙක ගිවිසුම් කාල සීමාව අවසන් වීමට ප්‍රථම 2022.07.31 දින අදාළ ආයතනය වෙත භාර දෙන ලදී. එසේම CAY-4839 දරණ Outlander කාර් රථය ද මේ අයුරින් 2022.06.20 දින ආපසු භාර දී ඇත.

අපහරණයට යෝජිතව තිබූ UI-9835 දරණ යතුරු පැදිය 2022.11.16 දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඇති අතර, එමඟින් රු.56,500.00 ක ආදායමක් රජයට ලැබී ඇත.

2.18.1 මැතිවරණ කොමිෂන් සභාවේ වාහන පිළිබඳ තොරතුරු

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් වාහන වලින් වසර 05 සම්පූර්ණ වීම මත 2022 වර්ෂය තුළ කොමිෂන් සභාව වෙත පවරන ලද වාහන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	ලියාපදිංචි අංකය	වාහනය නිෂ්පාදිත වර්ෂය	පවරාගත් දිනය	වටිනාකම රු.
1	CAR-5330	2014	2022.02.01	7,390,000.00
2	CAR-5342	2014	2022.02.01	7,390,000.00
3	CAR-5346	2014	2022.02.01	7,390,000.00
4	CAD-1251	2014	2022.02.01	7,400,000.00
5	PG-1775	2014	2022.02.01	6,390,000.00
6	PG-1781	2014	2022.02.01	6,390,000.00
7	PG-1782	2014	2022.02.01	6,390,000.00
8	PG-1783	2014	2022.02.01	6,390,000.00
9	PG-1784	2014	2022.02.01	6,390,000.00
10	PG-3994	2014	2022.02.01	6,390,000.00
11	PG-3995	2014	2022.02.01	6,390,000.00

2022.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාව සතුව පැවති වාහන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	වාහන වර්ගය	සංඛ්‍යාව	කාර්යාලය			
			ප්‍රධාන කාර්යාලය		දිස්ත්‍රික් කාර්යාල	
			සංචිත	වෙන්කල	සංචිත	වෙන්කල
1	කැබ්	34	7	-	27	-
2	කාර්	19	10	9	-	-
3	වෑන්	03	3	-	-	-
4	ජීප්	01	-	1	-	-
5	ලොරි	01	1	-	-	-
6	කෘ කැබ්	01	1	-	-	-
7	යතුරු පැදි	01	1	-	-	-
8	බස්	1	1	-	-	-
එකතුව		61	24	10	27	-

2.19 ඉදිකිරීම් හා වත්කම්

2.19.1. ඉදිකිරීම් හා අළුත්වැඩියා

වැය විෂය - 2001

මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ යකඩ රාක්ක 08 ක් සකසා සවිකිරීම, ප්‍රධාන ශ්‍රවණාගාරයේ නාමාක්ෂර අලුත්වැඩියා කිරීම, වතුර මෝටර තබා ඇති කාමර දෙකෙහි විදුලි සැපයුම් පද්ධතිය යථාවත් කිරීම, නව විදුලි ජනක යන්ත්‍රය තැබීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ දෙවන මහලෙහි ජලය කාන්දුවන ස්ථානය පිළිසකර කිරීම ඇතුළු මැතිවරණ කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රයේ හදිසි හා අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු කර ඇත.

මාතර සහ වවුනියාව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හදිසි හා අතවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට ක්‍රියාකර ඇත.

මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නිල නිවාසයේ සහ ත්‍රිකුණාමලය සංචාරක නිකේතනයේ හදිසි හා අතවශ්‍ය අලුත්වැඩියා කටයුතු ද සිදුකර ඇති අතර, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව ක්‍රියාකරමින්, අත්‍යවශ්‍ය හා හදිසි අලුත්වැඩියා පමණක් ඉටුකර ඇති බව විශේෂයෙන් අවධාරණයට ලක්විය යුතු කරුණකි.

එම සියලු කටයුතු සඳහා රුපියල් මිලියන 5.7 ක මුදලක් වැය වී ඇත.

වැය විෂය - 2104

යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා ඉදිවන නව සිව්මහල් ගොඩනැගිල්ලේ පළමු අදියරයේ කටයුතු අවසන් කිරීම සහ එහි දෙවනි අදියරය ඉදිකිරීම සඳහා වූ යෝජනා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කර ඇති අතර, එහි දැනට වැඩ අවසන්ව ඇති කොටස භාවිතයට ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකර ඇත.

2.20. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම /අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

2.20.1. ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම

වාර්ෂිකව පවත්වනු ලබන ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා බීසී ආකෘති පත්‍ර වෙනුවට “අ” හා “ආ” තොරතුරු පමණක් රැස්කිරීමට අදාළව ER ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. ER ආකෘති පත්‍ර ලක්ෂ 15 ක් රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කිරීමෙන් පසුව දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී. 2022 වර්ෂයේ සිට හඳුන්වාදුන් පරිපූරක නාම ලේඛනයක් සකස් කිරීමට අදාළව YC ආකෘති පත්‍ර හා පරිපූරක නාමලේඛන සකස්කිරීම පිළිබඳ උපදෙස් පත්‍රිකා ලක්ෂ 65ක් පමණ මුද්‍රණය කර දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී.

2.20.2.ඡන්දභිමි නාමලේඛන මුද්‍රණය

2022 ඡන්දභිමි නාමලේඛනය මෙවර ද රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇති අතර එම මුද්‍රණ කටයුතු අවසන් කිරීමෙන් පසුව අදාළ දිස්ත්‍රික් කාර්යාලවලට බෙදාහැරීමට කටයුතු කරන ලදී. ඒ සඳහා වූ වියදම වශයෙන් රජයේ මුද්‍රණාලයට රු. මිලියන 17.40ක් පමණ ගෙවීම් කළ යුතු අතර ලක්ෂ 33ක් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

2.20.3 යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

ප්‍රධාන කාර්යාල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අවශ්‍යතාවය සඳහා යන්ත්‍ර සූත්‍රවල අවශ්‍යතාවය පැනනැගී ඇතත් සීමිත ප්‍රතිපාදන හේතුවෙන් පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, සීසීපී යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර වැනි භාණ්ඩ මිලදීගැනීමට නොහැකි වී ඇත. නමුත් යූපීඑස් හා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමට සිදුවීම නිසා රු. මිලියන 2.58 ක් වියදම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ තොරතුරු හා තාක්ෂණ අංශයේ අවශ්‍යතාවය මත විදුලිජනක යන්ත්‍රයක් මිලදී ගෙන සවිකරන ලද අතර ඒ සඳහා රු. මිලයන 6.91 ක් වැයකිරීමට සිදුවිය.

ප්‍රධාන කාර්යාල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඇති වගකීම් කාලය සම්පූර්ණ වූ පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර ඇතුළු අනෙකුත් යන්ත්‍රෝපකරණ සඳහා අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. ඒ සඳහා රු. මිලියන 3.29 ක් පමණ මුදල වැයකිරීමට සිදුවිය.

කාර්යාලවල භාවිතා කරන පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් හා ඩ්‍රම් යූනිට් මිලදී ගැනීමට රු. මිලියන 18.34ක මුදලක් වැය කර ඇත.

ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් කාර්යාල අන්තර්ජාල පහසුකම් සමඟ ජාලගත කිරීමට අවශ්‍ය උපකරණ සහ මෘදුකාංග මිලදී ගෙන සැපයීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු. මිලියන 13.11ක මුදලක් වැය කර ඇති අතර මාසික දුරකථන සහ අන්තර්ජාල පහසුකම් සඳහා නොවැම්බර් මස දක්වා වූ කාලයට අදාළ බිල්පත සඳහා රු. මිලියන 21 ක මුදල ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම් කර ඇත.

ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් කාර්යාලවල ඇති පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම් ගතවීමට රු. මිලියන 4.79 ක් වැය කරන ලදී.

2.20.4 කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයේ කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය මේස, පුටු, අල්මාරි වැනි විවිධ කාර්යාල භාණ්ඩ මිලදී ගෙන ලබාදීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු. මිලයන 2.69 වියදම් කිරීමට සිදුවිය. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය කාර්යාල භාණ්ඩ කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුවට ඉදිරිපත් කර අනුමත වූ පරිදි ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය හා තීරණය මත මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇතත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් මිලදී ගැනීමට නොහැකි වී ඇත.

2.20.5 පොදු

ඡන්දභිමි නාමලේඛන මුද්‍රණය, ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සහ කාර්යාලයේ අනෙකුත් ලිපිද්‍රව්‍ය අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා මැතිවරණයෙන් ඉතිරිවූ ලිපිද්‍රව්‍යට අමතරව ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට ද සිදුවිය. ඒ සඳහා රු. මිලියන 10.3 ක පමණ වියදම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ පානීය ජල අවශ්‍යතාවය සඳහා පානීය ජල මිලදී ගැනීමට රු. 185,000කුත් ජල බිල්පත් සඳහා රු. 305,000කුත් වියදම් කරන ලදී.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වාහනවලට අවශ්‍ය ටයර් මිලදී ගැනීමේ කටයුතු ප්‍රාදේශිය මට්ටමින් සිදුකිරීමට අනුමැතිය ලබාදීමේ පදනම මත කටයුතු කරන ලද අතර දිස්ත්‍රික්කය තුළ දී මිලදී ගැනීමට නොහැකි වූ කාර්යාලවලට සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ වාහන සඳහා අවශ්‍යතාව මත ටයර් මිලදී ගෙන සැපයීමද සාර්ථකව ඉටු කරන ලදී. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් රු. මිලියන 2.5 ක් පමණ වියදම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලවල පාවිච්චි කළ ඡන්ද පත්‍රිකා හා භාවිතයෙන් ඉවත්කළ කඩදාසි රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව රජයේ කඩදාසි සංස්ථාවට භාරදීමට කටයුතු කරන ලදී. ඒ වෙනුවෙන් 2022 වර්ෂතුළ කඩදාසි සංස්ථාවෙන් රු. මිලියන 1.38 ක පමණ මුදලක් ලැබුණු අතර මිලියන 2.21 ක පමණ මුදලක් ලැබිය යුතුව ඇත.

ප්‍රතිශෝධන කටයුතුවලට අදාළ ආකෘතිපත්‍ර ඇතුළු ලියවිලි මුද්‍රණය සහ අනෙකුත් ලිපිලේඛන මුද්‍රණ කටයුතු සඳහා 2022 වර්ෂයේදී රජයේ මුද්‍රණාලයට රු. මිලියන 10.58 ක් පමණ ගෙවීම් කරන ලදී.

2.21 තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු නවීකරණයට ලක්කිරීම මඟින් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ආයතනයේ නිලධාරීන්ට තොරතුරු තාක්ෂණ යෙදුම් සකස් කර දීම සහ අදාළ පාර්ශවකරුවන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවාවන් ආරක්ෂාකාරී ලෙස ලබාදීම මෙම අංශයේ මූලික කාර්ය භාරය වේ. නවීන තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යනය සහ සැලසුම් කිරීම, ව්‍යාපෘති වාර්තා සැකසීම හා අනුමත කර ගැනීම, ව්‍යාපෘති පරීක්ෂාව, ස්ථාපනය කිරීම සහ නිලධාරීන් පුහුණුව මෙහි දී ඉටු කරනු ලැබේ.

2.21.1. මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම

2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විගස සුදුසුකම් සපුරන ලද සෑම පුරවැසියෙකුම ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා පරිපූරක ලැයිස්තු සැකසීමේ නව සම්පූර්ණ පරිගණක වැඩසටහනක් ‘‘අ’’ ‘‘ආ’’ ලැයිස්තු ගත කිරීම, හිමිකම් විරෝධතා, බහු ලියාපදිංචිය වැළැක්වීම, මුද්‍රණයට යැවීම සඳහා ඡන්දහිමි නාමලේඛන ගොනු සැකසීම, සංඛ්‍යා සටහන් ලබා ගැනීම ආදී ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා අවශ්‍ය සියලු පරිගණක මෘදුකාංග ඇතුළත් කර නිර්මාණය කිරීම / වැඩිදියුණු කිරීමට ක්‍රියා කර ඇත.

පසුගිය වර්ෂවල දී ඉටු කළ ආකාරයට ම 2022 වර්ෂයේ සාමාන්‍ය ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ ව වැඩසටහන් හඳුන්වා දීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන්ගේ කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් සකස් කිරීම/ වැඩිදියුණු කිරීම.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයීය නිලධාරීන්ට පරිගණක වැඩසටහන මඟින් ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනයේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමත් ඡන්ද හිමි නාමලේඛන උපුටන ලබා ගැනීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමත් වර්ෂය පුරා අදාළ කාලවලදී අඛණ්ඩව සිදු කරන ලදී. මේ සම්බන්ධව විඩියෝ තාක්ෂණය ඔස්සේ මාර්ගගත පුහුණුවක්ද ලබා දෙන ලදී.

රටේ පැවති ප්‍රවාහන දුෂ්කරතා මත කාර්යාල වලට පැමිණ කටයුතු කිරීමට නොහැකි නිලධාරීන් සඳහා ආරක්ෂාකාරීව දත්ත පද්ධතිය පරිහරණය කරමින් නිවසේ සිට රාජකාරි කිරීමට අවශ්‍ය තාක්ෂණික මෙවලම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට පරිපාලනය තීරණ ගැනීම සඳහා සංඛ්‍යා දත්ත ඇතුළත් දත්ත පුවරුවක් (Dash Board) නිර්මාණය කිරීම කරන ලදී.

2022 වර්ෂයේ අග භාගයේ දී ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව භාවිතා කිරීමට අවශ්‍ය පහත සඳහන් පරිගණක වැඩසටහන් නිර්මාණය කරන ලදි.

සහතික කරන ලද ඡන්ද හිමි නාමලේඛනය සහ සහතික කර ඇති පරිපූරක නාමලේඛන එක්කොට පළාත් පාලන ආයතන වශයෙන් ඡන්දහිමි නාමලේඛනය සකස් කර ගැනීමට අවශ්‍ය පරිගණක වැඩසටහන් සංවර්ධනය කිරීම, නාමයෝජනා පරිගණක ගත කිරීමට අවශ්‍ය පරිගණක වැඩසටහන නිර්මාණය කිරීම, නිලධාරී සංගණනය මාර්ගගතව සිදුකිරීම සඳහා වන පරිගණක වැඩසටහන/ ඊසේවාව සංවර්ධනය කිරීම සහ ඉහත කටයුතු පහසු කිරීම සඳහා භාවිතා කිරීමට රාජ්‍ය ආයතන කේත කිරීමේ ක්‍රමයක් සකස් කිරීම සිදු කරන ලදී.

මීට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් නිර්මාණය කර ලද අතර ඒවා 2022 වසර තුළ දී වැඩිදියුණු කරන ලදී. ප්‍රධාන කාර්යාලයේ

සියළුම නිලධාරීන්ට මාර්ගගතව නිවාඩු අයදුම් කිරීම සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතියක් (Leave Management System) පවත්වා ගෙන යාම, මැතිවරණ කොමිෂන් සභාවේ රථවාහන කළමනාකරණ පද්ධතිය (Vehicle Management System) සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම, ගිණුම් කටයුතු සිදු කිරීම සඳහා වියදම් කළමනාකරණ පද්ධතිය (Expenditure Management System) සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම, ප්‍රසම්පාදන සැලැස්ම අධීක්ෂණ පද්ධතිය (Procurement Plan Monitoring System) සංවර්ධනය කිරීම සහ මැතිවරණ ආරවුල් නිරාකරණ කළමනාකරන පද්ධතිය (Electoral Dispute Resolution Management System) සංවර්ධනය කිරීම සිදු කරන ලදී.

2.21.2. මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශවකරුවන්හට ඊ සේවා සැපයීම

දේශපාලන පක්ෂ අපේක්ෂකයින්, රාජ්‍ය ආයතන, රාජ්‍ය නිලධාරීන්, ඡන්ද දායකයින් ඇතුළු සියළු පාර්ශවකරුවන් වෙත ඊ සේවා සැපයීම වසර පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

මෙහිදී මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීන කර අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ විශේෂයෙන් ම දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු, දේශපාලන පක්ෂ ලැයිස්තුව, මාධ්‍ය නිවේදන, මාධ්‍ය උපමාන , ගැසට් හා චක්‍රලේඛ ආදී තොරතුරු වර්ෂය පුරා භාෂා ත්‍රිත්වයෙන් මැතිවරණ නිල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම.

එසේම පුළුල් ලෙස සමාජය තුළ ව්‍යාප්ත වූ සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් මහජනතාව වෙත යාවත්කාලීන තොරතුරු කඩිනමින් ලබා දීම මඟින් මැතිවරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය ඉවහල් කර ගැනීම.

රජයේ පාසල් සඳහා පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ දී අවශ්‍ය ඡන්දහිමි නාමලේඛන විස්තර මැතිවරණ කොමිෂන් සභාව අනුමත කළ මිල ගණන් යටතේ මාර්ගගත ක්‍රමයට ආරක්ෂාකාරී ලෙස ලබා දීම.

එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව යනාදියට ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු මාර්ගගත ක්‍රමයට ලබා දීමට අදාළ තාක්ෂණික සහය ලබා දීම.

ඡන්දදායකයින්ට මාර්ගගතව ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට හා හිමිකම් අයදුම් කිරීමට පහසුකම් සැලසීම, ඡන්ද දායකයින්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා මාර්ගගත පහසුකම් ලබා දීම, පෙර වර්ෂ වල තමා පදිංචි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලයෙන්ම ලබා ගත යුතුව තිබූ ඡන්දහිමි නාමලේඛන උපුටන දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකින් ලබාගැනීමට පහසුකම් මහජනතාව වෙත සලසා දීම, වයස අවුරුදු 16ට වැඩි යොවුන් පුරවැසියන් සඳහා ඡන්දහිමි නාමලේඛනයට ලියා පදිංචි වීම සඳහා මාර්ගගතව ඉල්ලුම් කල හැකි නව ඊ සේවාවක් හඳුන්වා දීම, මැතිවරණ කොමිෂන් සභාවේ සියළු පාර්ශවකරුවන් මැතිවරණ ක්‍රියාවලිය හා ඒ හා සම්බන්ධිත කරුණු පිළිබඳව දැනුම හා අධ්‍යාපනය ලබා දීම සඳහා මැතිවරණ අධ්‍යාපන හා සහභාගීත්ව වෙබ් අඩවිය නිර්මාණය කර හඳුන්වා දීම, මාර්ගගත ලියා පදිංචිය ඇතුළු මැතිවරණ ඊසේවා භාවිතයේදී ජනතාවට මතුවන ගැටළු විසඳා ගැනීමට අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා වට්ස් ඇප් හා ඊ මේල් ගිණුමක් සකස් කර පවත්වා ගෙන යාම 2022 වර්ෂයේ දී සිදු කරන ලදී.

වෙබ් අඩවිය හා සමාජ මාධ්‍ය ජාලා හරහා ලැබෙන මහජන පැමිණිලි නියමිත පාර්ශව වෙත යොමු කර ඒ සඳහා පිළිතුරු ලබා දීම වැනි කටයුතු ද වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කාර්යාලයීය ඊ මේල් සේවාව පවත්වාගෙන යාම.

2.21.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී. එහිදී ප්‍රධාන කාර්යලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානයේ සහ හම්බන්තොට මැතිවරණ කාර්යාලයේ පිහිටුවා ඇති දත්ත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවා පවත්වා ගැනීම, උපස්ථ ලබා ගැනීම ආදී කටයුතු ඉටුකිරීම සහ නඩත්තු කටයුතු අදාළ ආයතන මඟින් ඉටු කරවා ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ අංශ ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක, පරිගණක උපාංග, පරිගණක ජාල, වී.පී.එන්. ජාලය, ෆයර්වෝල් සහ ADSL අන්තර්ජාල පද්ධතියේ නඩත්තු කටයුතු ඉටු කිරීම.

2018 වර්ෂයේ සිට මාර්ගගත ක්‍රමවේදයන් භාවිතා කරමින් රැස්වීම් පවත්වනු ලබන Video Conference පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.

ප්‍රධාන කාර්යාලයේ ඉතා අත්‍යවශ්‍ය උපාංගයක් වූ ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) පුළුල් කිරීම හා ඒ සම්බන්ධ ඉදිරි කටයුතු ද සිදුකරන ලදී.

2.22 මූල්‍ය හා විගණන තොරතුරු

සංශෝධිත අයවැය ඇස්තමේන්තු අනුව 2022 ප්‍රතිපාදන රු. මිලියන 928.2ක් වූ අතර පුනරාවර්ථන වියදම් සඳහා රු. මිලියන 867.2 හා ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 61 ක් වෙන් කර තිබුණි. 2022 වර්ෂයේ පුනරාවර්ථන වියදම රු. මිලියන 852.3 වූ අතර 2021 වර්ෂයේ දී එම වියදම රු. මිලියන 787.6 ක් විය. සමස්ථයක් වශයෙන් සලකා පසුගිය වර්ෂය හා සසඳා බලන විට පුණරාවර්ථන වියදම රු. මිලියන 64.7 ක වැයවීමක් පෙන්නුම් කෙරේ. 2022 වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු. මිලියන 23.2 වූ අතර 2021 වර්ෂයේදි එම වියදම රු. මිලියන 82 ක් විය. ප්‍රාග්ධන වියදම අඩුවීමට හේතුව අයවැය චක්‍රලේඛ මඟින් ප්‍රාග්ධන වියදම සීමා කිරීම වේ.

2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම සඳහා රු. මිලියන 165.2ක් පමණ වැය වී ඇති අතර නාමලේඛන මුද්‍රණය කිරීම හා ගණන් ගන්නා නිලධාරින්ට තවදුරටත් ගෙවීමට ඇති රු. මිලියන 42ක පමණ මුදල එකතු වූ විට සම්පූර්ණ වියදම දළ වශයෙන් රු. මිලියන 208ක් පමණ වේ. 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීමේ වියදම වූ රු. මිලියන 122.01 වියදම සමඟ සසඳා බලන විට මෙම වර්ෂයේ ඡන්දහිමි නාමගේඛනය පිළියෙල කිරීමේ වියදම රු. මිලියන 86ක් පමණ වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ලිපි ද්‍රව්‍ය හා මුද්‍රණ වියදම වැඩිවීම මෙම වියදම් වැඩිවීමට බලපා ඇත.

මෙම වර්ෂයේ දී ආපදා ණය/ විශේෂ/ උත්සව අත්තිකාරම් ඉල්ලුම් කළ නිලධාරින් සේවකයින් වෙනුවෙන් රු. මිලියන 21.4 ණය අත්තිකාරම් මුදල් ලබා දී ඇත. පසුගිය වර්ෂය හා සසඳා බලන විට මෙම වර්ෂයේ ලබාදී ඇති මුදල් ප්‍රමාණය රු. මිලියන 15 වැයවීමක් පෙන්නුම් කෙරේ.

2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීමෙන් ලද ආදායම රු. මිලියන 4.2කි. 2021 වර්ෂයේ මෙම ආදායම රු. මිලියන 1.6 වූ අතර එම වර්ෂය සමඟ සසඳා බලනවිට උපුටන නිකුත් කිරීමෙන් ලද ආදායම රු. මිලියන 2.6 ක වැඩිවීමකි.

ඡන්දහිමි නාමලේඛනය පොත් වශයෙන් සකස් කිරීම සීමා කර සංයුක්ත තැටි වශයෙන් පිළියෙල කරනු ලබන අතර ඒවා අලෙවි කිරීමෙන් මෙම වර්ෂයේ උපයාගත් ආදායම රු. මිලියන 0.1කි. පසුගිය වර්ෂයේ ආදායම රු. මිලියන 0.3 හා සසඳා බලන විට අඩුවීමක් පෙන්නුම් කෙරේ.

2022 වර්ෂය තුළදී විවිධ විෂයයන් යටතේ 2022.12.31 දක්වා ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් 10ක් ඉදිරිපත් කර ඇත. එම විමසුම් 10 සඳහා පිළිතුරු ලබාදී ඇත. අභ්‍යන්තර විගණන අංශයේ විගණන විමසුම් 02 ක් ඉදිරිපත් කර ඇත. එම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇත.

2.23. අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු

මැතිවරණ කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පවතින මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීමේ දී ජාතික විගණන පනතේ 38(ආ) සහ 38(ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික වීම සඳහා එම පනතේ 40 වන වගන්තිය පරිදි සිදු කර ඇති පත්කිරීම් හා මුදල් රෙගුලාසි 133 හා 134 පරිදි අභ්‍යන්තර විගණන අංශයට පැවරී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්ඒ 01/2019 හා 2019.01.02 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛයේ දක්වා ඇති නියමයන් පරිදි 2022 වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණන අංශයට පැවරි තිබූ ව්‍යවස්ථාපිත රාජකාරි ඉටු කරන ලදී.

සෑම රජයේ ආයතනයක්ම ආවරණය වන පරිදි කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම ජාතික විගණන පනතේ 41 වගන්තිය යටතේ අනිවාර්ය කර ඇත. ඒ අනුව එම පනතේ 41(2) වගන්තියෙහි දක්වා ඇති පරිදි මැතිවරණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් විධිමත් සංයුතිය සහිතව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවන ලද අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක කැඳවුම්කරු ලෙස කටයුතු කරන ලද එවැනි කමිටු 3 ක් 2022 වර්ෂය තුළ දී පවත්වන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව තුළ ඵලදායී කාර්යයසාධනයක් තහවුරු කිරීම සඳහා 2022 වර්ෂය සම්බන්ධයෙන් කාර්යසාධන විගණනය, පද්ධති විගණනය, මූල්‍ය විගණනය සහ විශේෂ විමර්ශණ ආවරණය වන පරිදි වඩාත් ම අවදානම් සහිත ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කරන ලදී. මේ සඳහා සියලු දෙපාර්තමේන්තුමය කාර්යයන් ආවරණය වන පරිදි එක් එක් වගකීම් ක්ෂේත්‍රය සඳහා අදාළ ක්‍රියාකාරකම් දෙසියයකට වැඩි ප්‍රමාණයක් හඳුනා ගනු ලැබීය. ඒ අනුව කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මග පෙන්වීම මත මැතිවරණ කොමිෂන් සභාව සඳහා 2022 වාර්ෂික අවදානම් ලේඛනයක් මෙම අංශය විසින් පිළියෙළ කරන ලදී.

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් සහායක කාර්ය මණ්ඩලය මගින් ඉටු කරවා ගැනීමට අවශ්‍ය මානව හා අනෙකුත් සම්පත් හඳුනා ගනිමින් 2022 වර්ෂය තුළ දී නව අභ්‍යන්තර විගණන වැඩසටහන් හා ප්‍රශ්නාවලි පිළියෙල කරන ලදී. මෙතෙක් භාවිතයේ පැවති ප්‍රශ්නාවලි සියල්ල අවදානම් පාදක අභ්‍යන්තර පරීක්ෂාවලට අනුකූල වන පරිදි සංශෝධනය හෝ යාවත්කාලීන කරන ලදී. මැතිවරණ සුබසාධන ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාල ප්‍රධානීන්, කමිටුභාර ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරීන් හා ප්‍රසම්පාදන විෂයභාර කළමනාකරණ සේවා සහ ආශ්‍රිත නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව 2022.10.17 හා 18 දෙදින සංවිධානය කරන ලද නේවාසික වැඩමුළුවක් වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් සම්පත් දායකත්වය සපයන ලදී. මෙහි දී ආහාරපාන ප්‍රසම්පාදනය සඳහා පවතින සම්මත ලංසු ලේඛන, ආයතනික අවශ්‍යතා වලට අදාළ වන පරිදි ප්‍රතිනිර්මාණය කරන ලදී. එම ලේඛන සුදුසු කටයුතු සඳහා පාලන අංශය වෙත යොමු කර ඇත.

2022 වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණන ඒකකයේ රාජකාරි ඉටු කරනු ලබන සහායක කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීම ට කටයුතු කරන ලදී. ඒ අනුව එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ මෙරට ශාඛාව විසින් සංවිධානය කරන ලද තොරතුරු හා සයිබර් ආරක්ෂණය පිලිබඳ මාර්ගගත පුහුණු වැඩසටහනක් සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සහායක කාර්ය මණ්ඩලය ක්‍රියාකාරී ලෙස සහභාගී විය.

සියලුම විගණන අස්ථිත්වයන් විසින් අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පෙර ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මූලික වාර්තාව ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු බව ඩීඑම්ඒ /01-2019 හා 2019.01.02 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 8.2 ඡේදයේ දක්වා ඇත. තව ද සෑම කාර්තුවක්ම අවසන් වී එළඹෙන මසක් ඇතුළත ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තු වාර්තාව කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු බව ද එකී චක්‍රලේඛයේ 8.3 ඡේදයෙහි දක්වා ඇත. ඒ අනුව එකී වාර්තා නිසි කලට අදාළ ප්‍රධානීන් වෙත ලබා දී ඇත.

මැතිවරණ කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන අංශය සම්බන්ධයෙන් එහි අරමුණු, අධිකාරිය, වගකීම් සහ කොමිෂන් සභාව තුල විගණන කාර්යය සඳහා හිමි ස්ථානය පෙන්වා දෙන මූලික ලේඛනය වූ අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය 2022 වර්ෂයේ ජූනි මස එළි දක්වන ලද අතර ඊට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය ලබා ලබා ගැනීමට කටයුතු කරන ලදී.

2022 වර්ෂයේ මැද භාගය වන විට ජාතික වශයෙන් අත් විඳීමට සිදු වූ ප්‍රවාහන දුෂ්කරතා මධ්‍යයේ වුව ද වර්ෂය සඳහා වූ සංශෝධිත අභ්‍යන්තර විගණන සැලැස්මෙහි දක්වා තිබූ පරිදි 82% ක් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන පරීක්ෂා 22 ක් සිදු කරන ලදී. ඒ අනුව අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 40(4)(3) උප වගන්තිය පරිදි කටයුතු කරන ලදී.

2.24 ඉදිරි ඉලක්ක

ඉදිරියේදී, ව්‍යවස්ථාපිතව පැවරී ඇති ඡන්ද නාමලේඛණ ප්‍රතිශෝධනයට අදාළ කටයුතු මෙන්ම, නියමිත පරිදි සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයක් සහිතව කිසිවෙකු අත්නොහැරෙන පරිදි, අදාළ සියලු ඡන්ද විමසීම් පැවැත්වීම.

.....
සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
ත.ප. අංක 02
පරණ මාවත, රාජගිරිය.
10107.

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධනය

ඒඩිල්-එස්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.		සටහන	කනය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඩිල්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අලුම්		842,279,000	827,560,000	ඒඩිල්-3
-	නැන්පතු		1,294,928	2,909,695	ඒඩිල්-4
-	අත්තිකාරම් ගිණුම්		31,703,530	31,318,602	ඒඩිල්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			42,412,012	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		875,277,458	904,200,309	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ=(අ)+(ආ)**		875,277,458	904,200,309	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)			33,504	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ)-(ඇ)		875,277,458	904,166,805	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
-	වැටුප්,වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	530,776,977	495,412,932	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	318,026,727	288,797,612	
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,531,244	3,438,952	ඒඩිල්-2(
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
-	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		852,334,948	787,649,496	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	6,381,891	32,962,604	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	15,903,144	46,917,344	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඩිල්-2(
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	928,033	2,140,986	
-	වෙනත් මූල්‍ය වියදම්	15	-	-	
-	**මුළු මූලධන වියදම් (උ)**		23,213,068	82,020,934	
	නැන්පතු ගෙවීම්		2,866,805	6,012,754	ඒඩිල්-4
	අත්තිකාරම් ගෙවීම්		27,283,667	29,279,986	ඒඩිල්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	80,372	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		30,150,472	35,373,112	
	මුළු වියදම් එ=(ඊ+උ+ඌ)		905,698,488	905,043,542	
-	**දෙසැම්බර් 31 දිනට හේෂය ඒ=(ඉ-එ)**		(30,421,030)	(876,737)	
	අලුම් සැසඳුම් ප්‍රකාශය අනුව හේෂය		(30,421,030)	(876,737)	ඒඩිල්-7
	දෙසැම්බර් 31 දිනට අලුම් හේෂය				ඒඩිල්-3
			(30,421,030)	(876,737)	

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	නත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එසිඒ-6	2,206,017,496	2,065,916,625
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසිඒ-5/5(ඒ)	96,688,473	100,974,010
මුදල් හා මුදල් සමාන දෑ	එසිඒ-3		-
මුළු වත්කම්		2,302,705,969	2,166,890,635
ඉද්ධ වත්කම්/ ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ගුද්ධ වත්කම්		95,495,827	98,209,487
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,206,017,496	2,065,916,625
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	එසිඒ-4	1,192,646	2,764,523
අග්‍රිම ශේෂය	එසිඒ-3	-	-
මුළු වගකීම්		2,302,705,969	2,166,890,635

පිටු අංක 1 සිට 27 දක්වා එසිඒ 1 සිට එසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 28 සිට 34 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි මෙහින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකාරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය :	කේ. එස්. පී. පෙරේරා
සමන් ශ්‍රී රත්නායක	සමන් ශ්‍රී රත්නායක	ප්‍රධාන මූල්‍ය නිලධාරි
මැතිවරණ කොමසාරිස් ජනරාල්	මැතිවරණ කොමසාරිස් ජනරාල්	මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමිෂන් සභාව	සරණ මාවත,
සරණ මාවත, රාජගිරිය.	සරණ මාවත, රාජගිරිය.	රාජගිරිය

2022 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022	2021
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	28,531,110	37,896,872
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	
අග්‍රිම ලැබීම්	842,279,000	827,560,000
අත්තිකාරම් අයකර ගැනීම්	34,532,818	31,441,300
තැන්පතු ලැබීම්	1,294,928	2,909,695
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	906,637,856	899,807,867
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	847,625,388	783,380,017
සහනාධාර සහ මාරුකිරීම්	3,531,244	3,438,952
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	6,501,587	412,650
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	-	33,504
අත්තිකාරම් ගෙවීම්	27,652,086	28,943,824
තැන්පත් ගෙවීම්	2,866,805	6,012,754
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	888,177,110	822,221,701
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	18,460,746	77,586,166
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	4,132,893	4,114,813
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	619,430	319,955
උපණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	4,752,323	4,434,768
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	23,213,069	82,020,934
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	23,213,069	82,020,934
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ)-(ඉ)	-18,460,746	-77,586,166
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඌ)=(ඇ)+(උ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඵ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඵ)-(එ)		
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ)=(ඌ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් මුදල් ශේෂය	-	-

ඒසිඒ-7

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම		
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම්	6,618,727	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම්	3,326,660	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්		
2021 වර්ෂයේ අය කරන ලද පොළී මුදලක් ණය වාරික අය කිරීමක් ලෙස සටහන් කිරීම ගැලපීම	768	9,946,155
අඩුකළා :		
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම්	33,400,572	
වෙනත් ආයතනය විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම්	1,178,316	
අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම්	5,653,970	
2021 වර්ෂය තුළ ණය ශේෂ නිරවුල් කිරීමේ දී වැරදීමක්නි අත්තිකාරම් බී ගිණුමේ ලැබීම් යටතේ සටහන් කිරීම නිවැරදි කර පෙන්වීම	134,327	
අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම්		40,367,185
2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශය		(30,421,030)

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

3.2 මූල්‍ය ප්‍රකාශ සටහන්

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව රු.	අවසන් ඇස්තමේන්තුව රු.	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %
20.02.02.99	පොලිය - අනෙකුත්	මිලියන 4	මිලියන 4	මිලියන 4.1	100
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්	මිලියන 0.05	මිලියන 0.05	මිලියන 0.03	60
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	මිලියන 32	මිලියන 32	මිලියන 8	25
20.02.01.01	නිල නිවාස කුලී	මිලියන 1.30	මිලියන 1.30	මිලියන 1.25	96
20.04.01.00	වැන්දඹු අනත්දරු	මිලියන 20	මිලියන 20	මිලියන 19	95
20.06.02.02	ප්‍රාග්ධන විකුණුම් (අනෙකුත්)	මිලියන 1.50	මිලියන 1.50	මිලියන 0.93	62

3.2.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

අදාළ නැත

3.2.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ග	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම් රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදන රු.		
(1) පුනරාවර්තන	867,240,000	867,240,000	852,334,949	98%
(2) ප්‍රාග්ධන	61,000,000	61,000,000	23,213,069	38%

3.2.3. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදනයේ % ලෙස
			මූල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව		314	314	314	100

3.2.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	246,310	246,310		100%
9152	යන්ත්‍රෝපකරණ	801,832	801,832		100%
9153	ඉඩම	1,091,666	1,091,666		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ		66,208		
9180	බදු දෙනලද වත්කම්	-	-		

3.2.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/EC/2/22/27

මෙම අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 29





මැතිවරණ කොමසාරිස් ජනරාල්,
මැතිවරණ කොමිෂන් සභාව.

ශීර්ෂය 020 - මැතිවරණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 020 මැතිවරණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.



No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මැනිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්මත අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයන්හි ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී වෙනස්කම් පැවතීම.	1.6.2 (අ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්වීය යුතු රු.4,132,893 ක්වූ සේවක ණය පොළී, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි.

(ආ) ආදායම් නොවන ලැබීම් රු.28,531,110 ක් ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී නොනිමි ගොඩනැගිලි ශේෂය රු.මිලියන 05 ක් අඩුවෙන්ද, වාහන ශේෂය රු.මිලියන 58.33 ක් වැඩියෙන්ද, වෙනත් යන්ත්‍ර සූත්‍ර උපකරණ ශේෂය රු.මිලියන 10.26 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) 2021 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබූ පිරිවැය රු.6,717,017 ක්වූ භාණ්ඩ 2022 වර්ෂයේදී අපහරණය කර තිබුණද එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කර තිබූ කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, ගම්පහ දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නිල නිවාසය, ග්ලෙන් ආබර් ඉඩම, හින් ඇල අසල පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල CIGAS පරිගණක පද්ධතිය හරහා ගිණුම්ගත කර නොතිබීමෙන් රු.255,459,809 කින් මූල්‍ය නොවන වත්කම් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) නුවරඑළිය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කාර්යාලය සහ සංචාරක බංගලාව රු.3,118,000 කට තක්සේරු කර තිබුණද එය රු.3,700,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.582,000 කින් වැඩියෙන් දැක්වීණි.

(ඉ) කොමිෂන් සභාවට අයත් නොවන එකතුව රු.40,950,000 ක්වූ හම්බන්තොට දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවාසයේ හා බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ වටිනාකම CIGAS පද්ධතියෙන් ඉවත්කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී එසේ ඉවත්කර නොතිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.100,974,010 ක් වුවත් 2022 මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ ආරම්භක ශේෂය ලෙස රු.101,108,337 ක් දක්වා තිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඒසීඒ 3 - අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් වූ රු.33,269,017 ක ශේෂයෙහි නිවැරදිකාවය තහවුරු කරගැනීම සඳහා ඊට අදාල කේවල ශේෂ විස්තරය විගණනයට ඉදිරිපත් නොවිය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් එක් පුනරාවර්තන වැය විෂයයක හා මූලධන වැය විෂයයන් 02 ක පිළිවෙලින් රු.288,601ක් හා රු.20,319,312 ක් ඉතිරිවීම් පැවතුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 48 සිට සියයට 100 දක්වා පරාසයක විය.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 06 කට අදාලව ප්‍රතිපාදන ඉතිරිය රු.2,300,891 ක් හා එවායේ බැරකම් රු.82,051,967 ක් වීම නිසා ඉතිරිය ඉක්මවීම රු.79,751,076 ක් විය.

(ආ) වැය විෂයයන් 07 කට අදාලව එකතුව රු.63,132,679 ක්වූ බැරකම්, ඇමුණුම iii බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

මෙහෙයුම් සමාලෝචනය

ප්‍රසම්පාදනයන්

(අ) බැනර් මිලදී ගැනීම

2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඡන්ද භිමියන්ගේ දිනය සැමරීමේ කාර්ය ඇතුළත්ව තිබුණු බැවින් එම වැඩසටහන පූර්ව සූදානමකින් සැලසුම් කරගත හැකිව තිබියදී ඒ සඳහා අවශ්‍ය බැනර් 730 ක් සකස් කර ගැනීම හදිසි අවශ්‍යතාවයක් සේ සලකා වෙළඳපල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයට පටහැනිව ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු දින 07 ක අවම කාලසීමාව වෙනුවට සැපයුම්කරුවන්ට ඒ සඳහා දින 02 ක් පමණක් ලබාදී තිබුණි.

(ආ) දත්ත මධ්‍යස්ථානය සඳහා අමතර විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගැනීම

(i) මෙම ප්‍රසම්පාදනය සඳහා 2022 අප්‍රේල් 22 දින සැපයුම්කරුවන් 08 ගෙන් මිල කැඳවීම් කර තිබුණු අතර ප්‍රසම්පාදන අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය මැයි 13 දින ලෙස දක්වා තිබුණි. පසුව එම දිනය 2022 මැයි 20 ලෙස සංශෝධනය කර තිබුණු අතර එය සැපයුම්කරුවන් වෙත දන්වා තිබුණේ මිල ගණන් ඉදිරිපත් කළ යුතු අවසාන දිනට දින 02 කට පෙර එනම් 2022 මැයි 18 දිනදීය.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛණවල සඳහන් වේලාවේදී ලංසු ලබා ගැනීම අවසන් කරනු ලැබිය යුතු අතර ප්‍රමාදව ලැබෙන ලංසු භාර නොගත යුතු බව සඳහන්ව තිබුණද මෙම කොන්ත්‍රාත්කුව සඳහා මිල කැඳවීම භාරගන්නා අවසන් දිනය 2022 මැයි 20 වන දින වුවත් නෝරාගත් සැපයුම්කරු මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ 2022 මැයි 21 දිනදීය.

(iii) මිලදීගනු ලැබූ විදුලි ජනන යන්ත්‍රය අදාල පිරිවිතරයන්ට අනුකූල වන බවට විදුලි ඉංජිනේරුවරයා විසින් තහවුරු කිරීමකින් තොරව රු.6,912,420 ක්වූ බදු රහිත වටිනාකමින් රු.4,767,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දින ගෙවා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව මේ සඳහා වෙන් කර තිබූ මුදල රු.2,500,000 ක් වුවද එහි සත්‍ය වටිනාකම රු.6,912,420 ක් වූයෙන් එය ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 176 කින් වැඩිවී තිබුණු අතර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

(v) විදුලි ජනන යන්ත්‍රය සවි කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානයේ සර්වර් යන්ත්‍ර අක්‍රීය කර නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා පූර්ව අනුමැතියකින් තොරව රු.66,000 ක් බාහිර ආයතනයකට ගෙවා තිබුණි.

(ඇ) විදුලි ජනන යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා ආවරණ කුටියක් ඉදිකිරීම

(i) මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් කැඳවා තිබුණේ විදුලි ජනන යන්ත්‍රය මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා මාස 02 ½ ක කාලයක් ගත වීමෙන් පසුව වන අතර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණේ 2022 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවූ විදුලි ජනන යන්ත්‍රය මිලදී ගෙන තිබූ ආයතනය වෙතට විය.

(ii) මෙම කොන්ත්‍රාත්තුව සඳහා 2022 ඔක්තෝබර් 18 දින මිල ගණන් කැඳවා තිබුණද කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු ආයතනය 2022 සැප්තැම්බර් 08 දින එනම් මිල ගණන් කැඳවීමටත් පෙර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි.

(iii) රු.795,000 ක්වූ කොන්ත්‍රාත් මුදල තාක්ෂණ නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුවෙන් සියයට 38 කට වඩා වැඩිවී තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) පුත්තලම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පවතින ජෙනරේටරය වසර 06 කට අධික කාලයක් තිස්සේ භාවිතයකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ අස්ථානගතව තිබූ ජංගම දුරකථනයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අලාභ අයකරගෙන නොතිබුණි.

(ඇ) පසුගිය මැතිවරණ කිහිපයක් සඳහා නිසි සැලසුමකින් තොරව මිලදී ගෙන තිබූ වටිනාකම රු.12,848,164 ක්වූ විවිධ වර්ගයේ ටෝනර්, රිබන්, මාස්ටර් රෝල් තීන්ත භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.

3.3 පාඩුහානි

(අ) සමාලෝචිත වර්ෂය තුලදී සිදුවී තිබූ වාහන අනතුරු 03 කට අදාලව රු.151,192 ක් වර්ෂය තුලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2019, 2020 හා 2021 වර්ෂවලදී සිදු වී තිබූ අනතුරුවලින් අයකර ගැනීමට නොහැකි වූ හා පොත්වලින් කපා හැරීමට නොහැකි වූ හානි වල වටිනාකම රු.2,598,736 ක් විය.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට කපා නොහළ ඉදිරියට ගෙන යන රු.2,671,428 ක්වූ ශේෂය පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ ඇමුණුම ii හි දක්වා නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

2022 වර්ෂය තුල වියදම් දැරීම සඳහා බලයදීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් නිකුත් කර තිබූ 2021 දෙසැම්බර් 21 දිනැති අංක 03/2021 දරන අයවැය චක්‍රලේඛයේ 04 වගන්තියෙන් 2022 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අභියෝගාත්මක තත්ත්වයක පවතින බැවින් වියදම් පාලනය සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් පවත්වාගෙන යායුතු බව අවධාරණය කර තිබියදී කොමිෂන් සභාව විසින් ඡන්ද හිමියන්ගේ දින වැඩසටහන සඳහා හෝටල් ගාස්තු, නිවේදන කටයුතු, ඉසව් කළමනාකරණය හා බැනර් සකස් කිරීම ආදී කටයුතු වෙනුවෙන් රු.4,585,147 ක් වැය කර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 කාර්ය මණ්ඩල සුරප්පාඩු

2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 09 ක්, ද්විතියිකය මට්ටමේ තනතුරු 42 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 29 ක සුරප්පාඩු පැවතුනි.

එච්.එස්.එස්.පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
මහරගම

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම (%)		
	100%-90%	**75%-89%**	**50%-74%**
	90%		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

අරමුණු අංකය	අරමුණු සහ ඉලක්ක	ඉලක්ක	කාල රාමුව	ආයතනයේ ක්‍රියාකාරී දර්ශකය	ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය
05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලබාගෙන සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.	5.1. ජාතික මට්ටමේ / ව්‍යවස්ථාදායකයේ කාන්තා නියෝජනය සාක්ෂාත් කර ගැනීම.	5.1.1.ව්‍යවස්ථාදායකයේ අදාළ නීති සංශෝධන	2021 - 2025	කාන්තා නියෝජනය 25% වන බවට වග බලා ගැනීම	අදාළ යෝජනා මැතිවරණ නීති සංශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට ඉදිරිපත් කිරීම.
	5.5 දේශපාලන, ආර්ථික හා සමාජීය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථා සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම.	5.5.1 අ. දේශපාලන පක්ෂවල විධායක සභාවේ කාන්තා නියෝජනය ඉහළ දැමීමට ක්‍රියා කිරීම.	2021 - 2025		පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට යෝජනා ඉදිරිපත් කර ඇත.
		5.5.2. මැතිවරණ කොමිෂන් සභාවේ විධායක ශ්‍රේණිවල තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය වැඩි කිරීම.	2021 - 2025	-	ක්‍රියාකරමින් පවතී.
10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම	10.2 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව නැකීමකින් තොරව සියලුදෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.	සියලු දෙනා ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.	2021 - 2025	සුදුසුකම්ලත් සියලු පුරවැසියන් ඇතුළත් ඡන්දනිම් නාම ලේඛණය සකස් කිරීම.	ක්‍රියාකරමින් පවතී.
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම සහිත පරිපූර්ණ ආයතන ගොඩනැඟීම.	16.7. සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලුදෙනා අනතර්ගත වූ සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම.	16.7.2. ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආබාධ සහිත බව හා ජන කණ්ඩායම් අනුව තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තමන් ද අන්තර්ගත බවට සහ තම අදහස් වලට ප්‍රතිචාර දක්වන බවට විශ්වාසයක් සහිත ජනගහනයේ ප්‍රමාණය	2021 - 2025	සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	ක්‍රියාකරමින් පවතී.

අරමුණු අංකය	අරමුණු හා ඉලක්ක	ඉලක්ක	කාල රාමුව	ආයතනයේ ක්‍රියාකාරී දර්ශකය	ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය
17. ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය.	17.8 2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා නාක්ෂණ බැංකු හා විද්‍යාව නාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු නාක්ෂණ හා සන්නිවේදන නාක්ෂණයන්හි නව නාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම.	මැනිවරණ ක්‍රියාවලිය සඳහා නූතන නාක්ෂණ ක්‍රම වේද යොදා ගැනීම.	2021 - 2025	– ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම. – මැනිවරණ ක්‍රියාවලියට දායකත්වය දක්වන සියලුම රජයේ නිලධාරීන්ගේ දත්ත පද්ධතිය සකස් කිරීම. – ඒ අනුව මැනිවරණ රාජකාරී සඳහා අනුයුක්ත කිරීම. – ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේදී ඇතිවන ගැටළු විසඳා ගැනීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.	මූලික කටයුතු සිදුකර අවසන්ව ඇත
	17.16 විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම් සඳහා විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරිත්වයෙන් දැනුම, පළපුරුද්ද, නාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම	සියලු පාර්ශවකරුවන් ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.	2021 - 2025	– මැනිවරණ නීතිය පිළිබඳව නිලධරයන්, ආරක්ෂක අංශ හා මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	ඒ ඒ වර්ෂයට අදාළව ක්‍රියා වර්ෂයට අදාළව ක්‍රියාකරමින් පවතී.

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
05 පරිච්ඡේදය බලන්න	-	සමස්ත			75%

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	56	48	08
තෘතීයික	21	13	08
ද්විතියික	502	460	42
ප්‍රාථමික	227	198	29

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය, පහත සඳහන් තනතුරුධාරී නිලධාරී මණ්ඩලයකින් සමන්විතය. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනා හැරුණු විට කොමිෂන් සභාව සඳහා ලේකම්වරයෙක් සිටී. ඒ හැර මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයට, මැතිවරණ කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී ලං.ප.සේ.) නිලධාරීන්, ශ්‍රීලංකා ගණකාධිකාරී සේවයේ (ශ්‍රී ලං.ග.සේ.) නිලධාරීන්, නීති නිලධාරීන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ (ශ්‍රී. ලං.තො.ස.තා.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා සැලසුම් සේවයේ (ශ්‍රී ලං.සැ.සේ.) නිලධාරීන්, භාෂා පරිවර්තක නිලධාරීන්ගෙන් කළමනාකරණ සේවයේ අධිශ්‍රේණියේ නිලධාරීන්, හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන්, ලේඛන සහකාරවරුන්, කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන් ඇතුළත් වේ. ඒ අනුව 2022.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

	සංඛ්‍යාව
මාණ්ඩලික නිලධාරීන් (මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයින් හැර අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් ඇතුළුව)	61
කළමනාකරණ සේවා නිලධාරීන්	358
සංවර්ධන නිලධාරී	38
කාර්මික නිලධාරී (සිවිල්)	01
තොරතුරු තාක්ෂණ සහකාර	10
ලේඛන සහකාර	46
පිළිගැනීමේ නිලධාරී	01
කාර්යාල කාර්ය සහයක	155
රියදුරු	43
රිය ශෝධක	01

6.2. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ කාලය තුළ සිදු කරන ලද වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.

6.2.1. නව පත් කිරීම්.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිටි මාණ්ඩලික නිලධාරීන්ගේ, තනතුරුවල පැවැති පුරප්පාඩු හා ස්ථාන මාරුවීම් අනුව ඇති වූ පුරප්පාඩු පිරවීමට අදාළව 2022.12.31 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පත් කිරීම පහත දැක්වේ.

❖ පුරප්පාඩුව තිබූ මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර :

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPub/AD/AcSD/02/ 1628 හා 2021.12.22 දිනැති ලිපිය මගින් මෙම කොමිෂන් සභාවට වෙත ස්ථාන මාරු කරන ලද ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ කේ.එස්.පී.පෙරේරා මහතා 2022.01.06 වන දින ප්‍රධාන මූල්‍ය නිලධාරී වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5732 හා 2022.01.28 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ කේ.එච්.එම්.එස්.පී.කස්තුරිසිංහ මහතා 2022.02.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති අම්පාර හා පුත්තලම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරු හා සහකාර ලේකම් තනතුර :

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක R/I/I/POSTING/2020(2021) හා 2022.02.02 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ පහත සඳහන් නිලධාරීන් තිදෙනා පුරප්පාඩුව පැවති පහත සඳහන් තනතුරු සඳහා 2022.03.14 දින සිට පත් කරන ලදී.

- ටී.සුවර්ණා මහත්මිය - සහකාර ලේකම් (මැතිවරණ කොමිෂන් සභාව) වශයෙන් පත්කිරීම.
- එස්.එල්.ආර්.ජයනායක මහතා - පුත්තලම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත්කිරීම.
- ඒ.එම්.කේ.එස්.අත්තනායක මහතා - අම්පාර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත්කිරීම.

❖ පුරප්පාඩුව පැවැති මන්නාරම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/6329 හා 2022.10.25 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ වී.සිවරාජා මහතා 2022.11.14 දින සිට මන්නාරම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදී.

❖ පුරප්පාඩුව පැවැති සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර :

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/PSD/C2/40 හා 2022.12.05 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණිය (අධි

සේවක පදනම මත) එස්.පී.සෙනරත් මහත්මිය මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) වශයෙන් පත් කරන ලදී.

6.2.2. නිදහස් කිරීම්.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිට සේවයෙන් නිදහස් කරන ලද මාණ්ඩලික නිලධාරීන් පහත පරිදි වේ.

- ❖ එස්.ඩබ්.වෙල්ගම මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III - 2022.02.02 දින සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීම.

- ❖ එච්.අයි.ආර්.හතුරුසිංහ මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II - 2022.02.18 දින සිට තැපැල් දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීම.

- ❖ එස්.සුදාකරන් මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I - 2022.05.31 දින සිට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කිරීම.

- ❖ ඩබ්.ජී.ඩබ්.ඥානදයාලන් මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III - 2022.06.01 දින සිට සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කිරීම.

6.2.3. අභ්‍යන්තර ස්ථාන මාරුවීම්

- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන් සේවයේ නියුතු ඒ.ඒ.ආනන්දි මහත්මිය විසින් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව 2022.01.03 දින සිට ගම්පහ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් ස්ථාන මාරු කරන ලදි.

- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ මුලතිව් දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු කේ.කාන්දීපන් මහතා විසින් කරන ලද ඉල්ලීම පරිදි 2022.03.07 දින සිට බදුල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් ස්ථාන මාරු කරන ලදි.

- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ මන්නාරම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු කේ.විමලරූබන් මහතා විසින් කරන ලද ඉල්ලීම පිළිබඳ වැඩිදුර කරුණු සලකා බැලීමෙන් අනතුරුව 2022.08.01 දින සිට කිලිනොච්චි දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් ස්ථාන මාරු කරන ලදි.

6.2.4. වැඩ බැලීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම්.

- ❖ ඉන්දියාවේ නවදිල්ලි නුවර පවත්වනු ලබන ඡන්ද හිමියන් දැනුම්පත් කිරීම පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩමුළුවට සහභාගිවීම සඳහා 2022.02.13 දින සිට 2022.02.20 දක්වා කාලයට දිවයිනෙන් බැහැරව ගිය පහත නම් සඳහන් නිලධාරීන් ආපසු දිවයිනට පැමිණෙන තෙක් රාජකාරී ආවරණය සඳහා පහත පරිදි පත් කරන ලදි.

නිලධාරියාගේ නම	**රාජකාරී ආවරණය කිරීම සඳහා පත්කළ අය**
බී.එම්.පී.ජී.පී.වී.බණ්ඩාර මහතා අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන)	කේ.එම්.ජී.එස්.එන්.කලුවැව මහතා අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
එච්.ඩී.එන්.සම්පත් ප්‍රනාන්දු මහතා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (මහනුවර)	පී.එස්.පතිරණ මහතා සහකාර මැතිවරණ කොමසාරිස් (මාතලේ)

එස්.එච්.වයි.එස්.බොරලැස්ස මහතා සහකාර මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)	කුමරිනී ප්‍රතාපසිංහ මෙනවිය සහකාර මැතිවරණ කොමසාරිස් (නීති)
කේ.විමලරූබන් මහතා සහකාර මැතිවරණ කොමසාරිස් (මන්නාරම)	ජේ.ජෙනිටන් මහතා සහකාර මැතිවරණ කොමසාරිස් (වවුනියාව)

- ❖ වවුනියාව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ජේ.ජෙනිටන් මහතා මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2022.03.07 දින සිට වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ යාපනය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ආර්.සී.අමල්රාජ් මහතා කිළිනොච්චි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2022.05.30 දින සිට වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ඒ.ඩී.පී.එන්.ආටිගල මෙනවිය ත්‍රිකුණාමල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙක් පත්කරන තෙක්, එම තනතුරෙහි රාජකාරී ආවරණය කිරීම සඳහා 2022.09.01 දින සිට පත් කරන ලදි.

- ❖ පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ඒ.ඩී.පී.එන්.ආටිගල මෙනවිය නේපාලයේ කත්මණ්ඩු නුවර පැවැත්වෙන දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහනකට සහභාගි වීම නිසා 2022.06.12 දින සිට 2022.06.16 දින දක්වා අනුරාධපුර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ.මුගුන්දන් මහතා පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරෙහි රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කරන ලදි.

- ❖ මොණරාගල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් 2022.08.25 දින සිට 2022.09.13 දක්වා විශේෂ නිවාඩු ලබාගත් බැවින් එම කාලය සඳහා බදුල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ.කාන්දීපන් මහතා මොණරාගල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ එම්.බී.එම්.සුෆ්යාන් මහතා පෞද්ගලික කටයුත්තක් හේතුවෙන් විදේශ ගතවීම නිසා අම්පාර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ඒ.එම්.කේ.එස්.අත්තනායක මහතා මඩකලපුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරෙහි 2022.09.16 දින සිට 2022.10.06 දින දක්වා රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කරන ලදි.

- ❖ මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා ගුජරාට් ප්‍රාන්ත ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා විදේශ ගතවීම හේතුවෙන් අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) එච්.ආර්.පී.පීරිස් මහතා 2022.12.02 දින සිට 2022.12.06 දින දක්වා මැතිවරණ කොමසාරිස් ජනරාල් තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කරන ලදි.

6.3. පාලන අංශයේ කටයුතු

ආයතන ශාඛාව

ආයතන අංශය අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) ගේ සහ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ පරිපාලන නිලධාරි මෙහෙයවීමෙන් හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් 02 නෙකුගේ සහ කළමනාකරණ සේවා නිලධාරින් දස දෙනෙකුගෙන් සහ ලේඛන සහකාර නිලධාරිණියකගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. තවද, පරිපාලන නිලධාරිණියගේ මෙහෙයවීම හා ප්‍රධාන කළමනාකරණ

සේවා නිලධාරිගේ සුපරීක්ෂණයෙන් සිදු වන පිළිගැනීමේ කවුළුවක් ද වේ. දිවයිනේ පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 27 ක සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ සියළුම ආයතන කටයුතු, මැතිවරණ කොමිෂන් සභාවේ ආයතනික පරිපාලන කටයුතු ද, පවිත්‍රතා හා ආරක්ෂක අංශ අධීක්ෂණය ද මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයවේ.

6.3.1 කාර්ය මණ්ඩල කටයුතු

6.3.1.1 කළමනාකරණ සේවා නිලධාරි සේවය

2022 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ කළමනාකරණ සේවා නිලධරයන් තිදෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය අතර, ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධරයන් සේවය සඳහා වාර්තා කරන ලදි.

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ කළමනාකරණ සේවා නිලධරයන් දහඅට දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කළමනාකරණ සේවා නිලධාරීන් අටදෙනෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

6.3.1.2 සංවර්ධන නිලධාරි සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ සංවර්ධන නිලධාරි සේවයේ නිලධරයන් දෙදෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව සංවර්ධන නිලධාරි සේවයේ නිලධරයන් දෙදෙනෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

6.3.1.3 රියදුරු සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ රියදුරු සේවයේ පස්දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව එක් රියදුරෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

6.3.1.4 කාර්යාල සේවක සේවය

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කාර්යාල සේවක සේවයේ සේවකයින් සිව් දෙනෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

6.3.1.5 කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීම

මැතිවරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පැවති කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා මෙම කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ දැන්වීමක් පල කරන ලදී. ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අය අතරින් සුදුසුකම් පරීක්ෂණයෙන් සමත් නිමල් කරුණාරත්න මහතා 2022.04.19 දින සිට වසරක කාලයක් සඳහා කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

6.3.1.6 රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීම

මැතිවරණ මහලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කළ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ ආර්.එම්.පී.ජී.එච්.බී. රත්නායක මහතා 2022.08.06 දින සිට පෞද්ගලික හේතු මත රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්විය.

6.3.1.7 වැඩ තහනම් කිරීම

නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කළ කාර්යාල සේවක සේවයේ III ආර්. නාගරත්නම් මහතා 2021.11.10 දින සිට 2021.12.09 දින දක්වා අනිවාර්ය නිවාඩුද, 2021.12.10 දින සිට වැඩ තහනම් කිරීමට ද කටයුතු කරන ලදී.

6.3.1.8 කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම.

ඒකාබද්ධ රියදුරු සේවයේ I, II හා III ශ්‍රේණිවල රියදුරු මහතුන් එකොළොස් දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022.09.08 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී පැවති අතර, ඒ සඳහා පෙනීසිටි සියලුම රියදුරු මහතුන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය.

6.3.1.9 පුරප්පාඩු තනතුරුවල රාජකාරි කටයුතු ආවරණය කිරීම.

මැතිවරණ කොමිෂන් පැවති පුරප්පාඩු තනතුරුවල රාජකාරි කටයුතු ඉටු කර ගෙන යාම, ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන කටයුතු සඳහා සභාවේ ද සභායට කඩින් කඩ සීමිත අනියම් සේවක සංඛ්‍යාවකගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදි.

6.3.1.10 විශ්‍රාම ගැන්වීම්

මැතිවරණ කොමිෂන් සභාවේ මාණ්ඩලික නිලධාරියෙකු, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් නවදෙනෙකු, කාර්යාල සේවක සේවයේ එක සේවක මහතෙකු, රියදුරු සේවයේ සේවක මහතුන් සිව්දෙනෙකු හා රියශෝධක තනතුර දැරූ සේවක මහතා ද 2022 වර්ෂය තුල විශ්‍රාම ගන්නා ලදී. මෙලෙස විශ්‍රාම ලබා ගත් දහසය දෙනාගේ විශ්‍රාම ලිපි ගොනුවල කටයුතු සිදු කර අවසන් කරන ලදී. විශ්‍රාම ගත් නිලධාරීන් හා සේවක මහතුන් පිළිබඳ විස්තරාත්මක වාර්තාව සටහන 32 ලෙස ඇතුළත් කර ඇති අතර එම මහත්ම මහත්මීන් සියලු දෙනාම මැතිවරණ දෙපාර්තමේන්තුවේ / මැතිවරණ කොමිෂන් සභාවේ ඉලක්කගත කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ලබා දෙන ලද නිරන්තර සහයෝගය, ඔවුන්ගේ කැපවීම මේ අවස්ථාවේදීද බෙහෙවින් අගය කරමු.

6.4 පවිත්‍රතා කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාල පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු කරන ලද කැන්රි සුපර් ක්ලිනින් (පුද්) සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2022.02.28 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි. ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ දීප්ති ක්ලිනින් සර්විස් ආයතනයයි. එබැවින් 2022.03.01 දින සිට 2023.02.28 දින දක්වා වූ කාලය සඳහා දීප්ති ක්ලිනින් සර්විස් ආයතනය සමඟ පවිත්‍රතා කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

6.5 ආරක්ෂක කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා අයන් ආම්ස් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2022.02.28 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි. ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ කොමර්ෂල් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගමයි. ඒ අනුව 2022.03.01 දින සිට 2023.02.28 දින දක්වා වූ කාලය සඳහා කොමර්ෂල් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම සමඟ ආරක්ෂක කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

6.6 විදේශ පුහුණු සහ ශිෂ්‍යත්ව

2022.01.01 දින සිට දක්වා 2022.12.31 දින දක්වා නිලධාරීන් නවදෙනෙකු පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී ඇත.

අංකය	කාරණය	පැවැත්වූ කාලසීමාව	පැවැත්වූ රට	නම	තනතුර
1	Capacity Building in Voter Education	2022.02.13 සිට 2022.02.18 දක්වා	ඉන්දියාව	බී.එම්.පී.සී.පී.වී. බණ්ඩාර මහතා	අති.මැ.කොං. (පාලන)
				එච්.ඩී.එන්. සම්පත් ප්‍රනාන්දු මහතා	නි.මැ.කොං. (මහනුවර)
				එස්.එච්. ශ්‍රීන් යාපා බොරලැස්ස මහතා	ස.මැ.කොං. (ජාතික මැතිවරණ)
				කේ. විමලරුබන් මහතා	ස.මැ.කොං. (මන්නාරම)
2	Capacity Development in Voter Registration	2022.03.19 සිට 2022.03.26	ඉන්දියාව	කේ.එම්.ජී.එස්.එන්. කලුවැව මහතා	අති.මැ.කොං. (පළාත් පාලන)
				ආර්.එම්.එච්.බී. රත්නායක මහතා	නි.මැ.කොං. (කුරුණෑගල)
				ඩබ්.ඩබ්.කේ. ජයවීර ප්‍රනාන්දු මහතා	නි.මැ.කොං. (කළුතර)
				කේ.ඒ.එල්. කරුගම්පිටිය මහතා	ස.මැ.කොං. (තුවරඑළිය)
3	Australia Awards - South Asia and Mongolia Regional Alumni Workshop - 2022	2022.06.12 සිට 2022.06.16 දක්වා	නේපාලය	ඒ.ඩී.පී.එන්. ආටිගල මිය	ස.මැ.කොං. (පොළොන්නරුව)

6.7 දේශීය පුහුණු

2022.01.01 දින සිට දක්වා 2022.12.31 දින දක්වා දේශීය පුහුණු පාඨමාලා 13 ක් මාර්ගගත ක්‍රමය ඔස්සේ සහ ප්‍රායෝගිකව පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු සටහන 33 හි ඇතුළත් කර ඇත.

2018 වර්ෂයේ දී පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මිශ්‍ර සමානුපාතික ක්‍රමයට පැවති ප්‍රථම ඡන්ද විමසීම වූ අතර ඡන්ද විමසීම් ක්‍රමවේදයේ සැළකිය යුතු වෙනස්කම් රාශියක් මෙම ක්‍රමයෙන් හඳුන්වා දෙන ලදී. එමෙන්ම මැතිවරණ ක්‍රමවේදය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට පත්කර ඇති පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත මැතිවරණ කොමිෂන් සභාව යෝජනා කරනු ලැබ ඇත්තේ ද ජනාධිපතිවරණය හැර අනෙකුත් ඡන්ද විමසීම්වල ක්‍රමවේදය මිශ්‍ර සමානුපාතික විය යුතු බවයි.

ඒ අනුව, ආසන්නයේදීම පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට පෙර සූදානමක් ලෙස මිශ්‍ර සමානුපාතික ක්‍රමය යටතේ ඡන්ද විමසීමක් පැවැත්වීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක්, දිස්ත්‍රික් නියෝජ්‍ය සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙනුවෙන් සංවිධානය කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව අනුව පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

මෙම පුහුණු වැඩසටහනේ දී, 2018 වර්ෂයේ දී පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පදනම් කර ගනිමින් එය පැවැත්වූ ආකාරය, ලද අත්දැකීම්, දෝෂ සිදුවූ අවස්ථා වේ නම් ඒවා වැඩිදියුණු කළ යුතු ආකාර ආදිය පිළිබඳ අත්දැකීම් හුවමාරුව සහ නව්‍යතා සමාලෝචනය සඳහා සැලසුම් කරනු ලබන අතර විශේෂයෙන්ම මැතිවරණ කොමිෂන් සභාවට මෑත කාලයේ දී බඳවාගන්නා ලද දිස්ත්‍රික් නියෝජ්‍ය සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට එමඟින් හොඳ පැහැදිලි දැනුම්වත්භාවයක් ලබාදීම මෙම පුහුණුවේ ප්‍රධාන අපේක්ෂාව විය.

ඒ අනුව, මෙම නේවාසික පුහුණු වැඩසටහන 2022 ජුනි මස 26, 27, 28 සහ 29 යන දිනයන් හි දී නුවරඑළියේ දී මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 57 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර නවාතැන් සහ තාක්ෂණික පහසුකම් සඳහා මැතිවරණ පිළිබඳ ජාත්‍යන්තර ආයතනය අනුග්‍රහය ලබා දෙන ලදී.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවත් හරහා අනුමක වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			

6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) ඉ උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධරයෙකු පත්කර එම නිලධරයා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ	-	-

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂනයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ	අනුකූල වේ	-	-

	සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පදිරි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-

15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ	-	-

